බලශක්ති අමාත්‍යාංශය

வலுசக்தி அமைச்சு

MINISTRY OF ENERGY



වාර්ෂික කාර්යසාධන වාර්තාව

வருடாந்த செயற்பாட்டு அறிக்கை

Annual Performance Report

2024



බලශක්ති අමාත්‍යාංශය

වාර්ෂික කාර්යසාධන වාර්තාව - 2024

නො.437, ගාලු පාර, කොළඹ 03
දුරකථන අංකය - 011 2574922
ෆැක්ස් - 011 2574741
විද්‍යුත් තැපෑල - info@powermin.gov.lk
විද්‍යුත් තැපෑල - info@energymin.gov.lk

2024 වර්ෂය සඳහා වාර්ෂික කාර්යසාධන වාර්තාව
බලශක්ති අමාත්‍යාංශය
වැය ශීර්ෂ අංකය: - 119

පටුන පිටු අංකය

පරිච්ඡේදය 01 ආයතනික පැතිකඩ සහ වැඩසටහන් ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1 හැඳින්වීම 07
1.2 දැක්ම සහ මෙහෙවර 10
1.3 ප්‍රධාන කාර්යයන් හා කර්තව්‍යයන් 10
1.4 සංවිධාන සටහන 12
1.5 අමාත්‍යාංශය යටතේ පවතින ප්‍රධාන අංශ හා කාර්යයන් 14
1.6 අමාත්‍යාංශය යටතේ පවතින ආයතන 17
1.7 විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු 20

පරිච්ඡේදය 02 ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2.1 2024 වර්ෂය තුළ විදුලිබල අංශයේ කාර්යසාධනය 29
2.1.1 විදුලිබල ක්ෂේත්‍රය සම්පිණ්ඩනයක් ලෙසින් 29
2.1.2 විදුලි ජනනය 30
2.1.3 ජාතික විදුලිබල ජාලයේ ස්ථාපිත ධාරිතාවය 31
2.1.4 ජල විදුලි උත්පාදන පුළුල් කිරීමේ ව්‍යාපෘති 32
2.1.5 විදුලි උත්පාදන ව්‍යාපෘති 32
2.1.6 සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති (NCRE) සඳහා ප්‍රවේශය වැඩි දියුණු කිරීම 33
2.1.7 විදුලි සම්ප්‍රේෂණ ප්‍රවර්ධනයන් 35
2.1.8 දේශගුණික විපර්යාස අවම කිරීම හා විදුලිබල ක්ෂේත්‍රයේ ජාතිකව නිර්ණය කරන ලද දායකත්ව (NDCs) 39
2.1.9 පර්යේෂණ සහ සංවර්ධන ක්‍රියාකාරකම් 40
2.1.10 විදුලි ගාස්තු සංශෝධනය 2024 40
2.1.11 නවීන තාක්ෂණය ද සමගින් අත්පත් කරගත් මෙහෙයුම් ප්‍රවර්ධනයන් 40
2.1.12 ජාත්‍යන්තර සහයෝගිතා 42
2.1.13 2025 සඳහා සැලසුම් හා වැඩසටහන් 42

පිටු අංකය

2.2 2024 වර්ෂය තුළ බලශක්ති අංශයේ කාර්යසාධනය

2.2.1 ශ්‍රී ලංකාවේ ඛනිජ තෙල් අංශයේ තොරතුරු ලුහුඬින් 2024 44

2.2.2 ගෝලීය ඛනිජ තෙල් මිල ප්‍රවනතා ශ්‍රී ලංකාවේ ඉන්ධන මිල කෙරෙහි ඇති කරන ලද බලපෑම 45

2.2.3 ඛනිජ තෙල් නිෂ්පාදන ආනයනය, ආනයන පිරිවැය සහ අලෙවිය 46

2.2.4 බොරතෙල් ආනයනය සහ පිරිපහදු කිරීම 50

2.2.5 2024 වර්ෂය තුළ ඛනිජ තෙල් ක්ෂේත්‍රයට අදාළව ඉටු කරන ලද නියාමන කාර්යයන් 54

2.2.6 ඛනිජ තෙල් වෙළඳපොළ ස්වභාවය 58

2.2.7 ඛනිජ තෙල් ආශ්‍රිත යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති 60

2.2.8 2025 සඳහා සැලසුම් හා වැඩසටහන් 63

පරිච්ඡේදය 03 - 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්යසාධනය

3.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය 67

3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය 68

3.3 මූල්‍ය ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශනය 69

3.4 ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය 70

3.5 වෙන්කරන ලද ප්‍රතිපාදන උපයෝගි කර ගැනීමේ කාර්යසාධනය 70

3.6 මු.රෙ. 208 ප්‍රකාරව, ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන 70

3.7 මුල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය 73

3.8 විගණකාධිපතිවරයාගේ වාර්තාව (ඇමුණුම-1)

පරිච්ඡේදය 04 - කාර්යසාධන දර්ශක

4.1 අමාත්‍යාංශයේ කාර්යසාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව) 75

පරිච්ඡේදය 05 - තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය

5.1 විදුලිබල ක්ෂේත්‍රයේ තිරසර සංවර්ධන අරමුණු (**SDG**) 78

5.2 හඳුනාගෙන ඇති තිරසර සංවර්ධන අරමුණු 78

5.3 තිරසර සංවර්ධන අරමුණු වලට අදාළව අත්කරගෙන ඇති ජයග්‍රහණ සහ මුහුණ දී ඇති අභියෝග 79

පරිච්ඡේදය 06 - මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය 82

6.2 අමාත්‍යාංශයේ කාර්යසාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපානු ලැබ ඇත්තේ කෙසේද යන්න 82

6.3 මානව සම්පත් සංවර්ධනය 83

පරිච්ඡේදය 07 - අනුකූලතා වාර්තාව

වගු නාමාවලිය

වගුව 2.1.1 පාරිභෝගින සංඛ්‍යාව

වගුව 2.1.2 විදුලි උත්පාදන මිශ්‍රණය - 2024

වගුව 2.1.3 විදුලි උත්පාදනය

වගුව 2.1.4 උත්පාදන මූලාශ්‍රය අනුව ස්ථාපිත විදුලි ධාරිතාවය

වගුව 2.1.5 ජනන ව්‍යාපෘති වල ප්‍රගතිය

වගුව 2.1.6 මහා පරිමාණ ව්‍යාපෘති

වගුව 2.1.7 ප්‍රසම්පාදන මට්ටමේ ඇති ව්‍යාපෘති

වගුව 2.1.8 ජාල පෝෂක ගාස්තු ක්‍රමය යටතේ එන ව්‍යාපෘති

වගුව 2.1.9 සෙසු ව්‍යාපෘති

වගුව 2.1.10 ජාලය වෙත විදුලිය එක්කිරීම්හි සාරාංශය

වගුව 2.1.11 දැනට ක්‍රියාත්මක සම්ප්‍රේෂණ සංවර්ධන ව්‍යාපෘතිවල ප්‍රගතිය

වගුව 2.1.12 අරමුදල් සම්පාදනය කළ යුතුවන සම්ප්‍රේෂණ සංවර්ධන ව්‍යාපෘති පිළිබඳ විස්තර

වගුව 2.1.13 අයවැය ඇස්තමේන්තුව - 2025

වගුව 2.1.14 දිගුකාලීන ජනන ව්‍යාප්ති සැලැස්මට (2023 2042) අනුව 2024 සිට 2026 දක්වා විදුලිබල පද්ධතියට එක්කිරීමට සැලසුම් කර ඇති ධාරිතාවන්.

වගුව 2.2.1 ආසියා පැසිෆික් කළාප බොරතෙල් සහ පිරිපහදු කළ නිෂ්පාදන ප්‍රකාශිත මිල ගණන් 2024

වගුව 2.2.2 ඛනිජ තෙල් නිෂ්පාදන ආනයනය 2024

වගුව 2.2.3 ඛනිජ තෙල් නිෂ්පාදන ආනයන පිරිවැය 2024

වගුව 2.2.4 ඛනිජ තෙල් නිෂ්පාදන අලෙවිය 2024

වගුව 2.2.5 ගුවන් යානා ඉන්ධන අලෙවිය (2021 2024)

වගුව 2.2.6 ලිහිසි තෙල් අලෙවිය (2021 2024)

වගුව 2.2.7 බොරතෙල් ආනයනය (2019 2024)

වගුව 2.2.8 දේශීයව පිරිපහදු කරන ලද ඛනිජ තෙල් නිෂ්පාදන (2019 2024)

වගුව 2.2.9 ආනයනික නිමි නිෂ්පාදන සහ දේශීයව පිරිපහදු කළ නිෂ්පාදන පිළිබඳ විස්තර 2024

වගුව 2.2.10 සමස්ත ඉන්ධන ගබඩා ධාරිතාවය

වගුව 2.2.11	ඉන්ධන බෙදාහැරීමේ ප්‍රගතිය 2024
වගුව 2.2.12	සමස්ථ ඉන්ධන පිරවුම්හල් සංඛ්‍යාව (2024.12.31 දිනට)
වගුව 2.2.13	පාරිභෝගික සේවා මධ්‍යස්ථාන සංඛ්‍යාව - 2024.12.31 දිනට
වගුව 2.2.14	2024 වර්ෂය තුළ වාර්තා වූ උපරිම සහ අවම වෙළෙඳපොළ මිල ගණන්

ප්‍රස්තාර / සිතියම්

ප්‍රස්තාර 2.1.1	ශුද්ධ විදුලි උත්පාදනය - 2024
ප්‍රස්තාර 2.1.2	ස්ථාපිත ධාරිතාව - 2024
ප්‍රස්තාර 2.2.1	ඉන්ධන බෙදාහැරීමේ සංයුතිය 2024
ප්‍රස්තාර 2.2.2	2024 වර්ෂය තුළ වාර්තා වූ වෙළඳපාළ මිල ගණන්
සිතියම 2.2.1	ත්‍රිකුණාමලය තෙල් ටැංකි සංකීර්ණයේ සිතියම

01 වන පරිච්ඡේදය

ආයතනික පැතිකඩ සහ වැඩසටහන් ක්‍රියාවට නැංවීමේ සාරාංශය

01 වන පරිච්ඡේදය
ආයතනික පැතිකඩ සහ වැඩසටහන් ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1 හැඳින්වීම

අප රටෙහි බලශක්ති ක්ෂේත්‍රයට අදාළව ප්‍රතිපත්තිමය තීරණ ගැනීම, වැඩසටහන් සහ ව්‍යාපෘති සකස් කිරීම, එම ව්‍යාපෘති ක්‍රියාවට නැංවීම, අධීක්ෂණය කිරීම සහ ඇගයීම හා එමඟින් රටේ බලශක්ති සුරක්ෂිතතාව තහවුරු කිරීමේ අරමුණින් යුතුව 2024.11.25 දිනැති අංක 2412/08 දරණ ගැසට් පත්‍රය මඟින් බලශක්ති අමාත්‍යාංශය පිහිටුවා ඇත. නව රජයෙහි ඉදිරි දැක්ම හා අරමුණු සාක්ෂාත් කර ගැනීමෙහිලා බලශක්ති ක්ෂේත්‍රයෙහි කාර්යභාරය ඉතා සුවිශේෂී වේ. ඒ අනුව, ශ්‍රී ලාංකීය මහජනතාවගේ බනිජ තෙල් අවශ්‍යතා අඛණ්ඩව සපුරනු ලැබීම, අඛණ්ඩ විදුලිබල සැපයුමක් සහතික කිරීම සහ පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන් ප්‍රවර්ධනය කිරීම මෙම අමාත්‍යාංශයේ ප්‍රධාන කාර්යභාරයන් වශයෙන් හඳුනාගෙන ඇත.

ශ්‍රී ලංකාවේ බලශක්ති ක්ෂේත්‍රය යනු ආර්ථිකය තුළ පරිණත හා විවිධාංගීකරණය වී ඇති අංශයකි. වසර 2016 දී මෙරට පූර්ණ වශයෙන් විදුලියනය කිරීමට සමත් වූ අතර, රට පුරා බනිජ තෙල් නිෂ්පාදන විකිණීමෙ හා මිලදී ගැනීමෙ හැකියාව පුළුල් කරන ලදී. පුනර්ජනනීය බලශක්ති සම්පත් බහුලව පැවතීමත් සමඟ පුළුල් වූ මූලික බලශක්ති මිශ්‍රණයක් පවත්වාගෙන යාමට ශ්‍රී ලංකාවට හැකිවී ඇත. ග්‍රාමීය ප්‍රදේශවල ආහාර පිසීම සඳහා ප්‍රධාන වශයෙන් ඉන්ධනයක් ලෙස දර භාවිතා කරනු ලැබුව ද, ද්‍රව පෙට්‍රෝලියම් වායුව (LP) ගෑස් භාවිතය කෙරෙහි යොමුවීමේ වර්ධනීය පරිවර්තනයක් දක්නට ලැබේ. රටේ බලශක්ති සැපයුම් රාමුව තුළ බනිජ තෙල් නිශ්පාදන ප්‍රධානතම බලශක්ති ප්‍රභවය ලෙස භාවිතා වූ නමුත් 2022 වසරේ දී ඇති වූ ඉන්ධන අර්බුදයත් සමඟ තත්ත්වය වෙනස් වී ඇත.
2024 වසරේ දී ස්ථාපිත මුළු විදුලි උත්පාදන ධාරිතාව මෙ.වො. 6,048ක් වූ අතර, එයින් 64%ක් පමණ විශාල පරිමාණ හා කුඩා ජල විදුලි, සුළං, සූර්ය සහ ජෛව ස්කන්ධ ඇතුළුව පුනර්ජනනීය බලශක්තියෙන් සමන්විත විය. ඉතිරිය ගල් අඟුරු සහ තෙල් මත පදනම් වූ තාප විදුලිය හරහා ජනනය කරන ලදී. 2024 වසරේ දී ශ්‍රී ලංකාවේ වාර්ෂික විදුලි උත්පාදනය ආසන්න වශයෙන් ගි.වො. පැය 17,364ක් විය. මෙම උත්පාදනයෙන් 55%ක් පමණ 2024 වසර තුළ සපුරාගැනුනේ පුනර්ජනනීය බලශක්ති සම්පත් මඟිනි.

2024 දී උමා ඔය ජල විදුලි බලාගාරය විවෘත කිරීමත්, 2025 දී මොරගොල්ල ජල විදුලි බලාගාරය මෙහෙවරෙහි යෙදවීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීමත් සමඟින් මෙරට අවසන් ප්‍රධාන ජල විදුලි බලාගාර ද්විත්වය ක්‍රියාත්මක තත්ත්වයට පත් කිරීම සිදුවන අතර 2025 දී ශ්‍රී ලංකාව වැදගත් සන්ධිස්ථානයක් පසු කරනු ඇති බව අපේක්ෂා කෙරේ. 2024 දී මෙරට පළමු පාවෙන සූර්ය බලාගාර දෙක නියමු පරිමාණයෙන් බලගැන්වීම ද සිදුවිය. තාප උත්පාදන ක්ෂේත්‍රය සම්බන්ධයෙන් අවධානය යොමු කිරීමේදී, ද්‍රව ස්වභාවික වායු (LNG) යටිතල පහසුකම නිමවීමෙන් පසු ඉදිරියේදී ස්වාභාවික වායුව (NG) ප්‍රධාන ඉන්ධන ප්‍රභවයක් වශයෙන් භාවිතයට ගැනීමට නියමිත කෙරවලපිටිය විදුලි බලාගාරය මෙහෙවරෙහි යෙදවීම පිවිතුරු බලශක්ති ක්ෂේත්‍රය අත්කරගත් ජයග්‍රහණයකි. වසර 2030 වන විට මෙරට විදුලි බලයෙන් 70%ක් පිවිතුරු ප්‍රභවයන්ගෙන් උත්පාදනය කිරීමේ අන්තර්කාලීන ඉලක්කය කරා ශ්‍රී ලංකාව ළඟා කරවීමට මෙම ජයග්‍රහණයන් දායක වනු ඇත. මෙම ඉලක්කය සඳහා සූර්ය බලශක්තිය, සුළං, ජලවිදුලි සහ ජෛව ස්කන්ධ විදුලි ජනන තාක්ෂණයන් කෙරෙහි ආයෝජන ඉහළ නැංවීම තුළින් පිටුබලය සපයා ඇත.

සැපයුම් පාර්ශවය කෙරෙහි මෙම ජයග්‍රහණ සැලකිය යුතු ප්‍රගතියක් සනිටුහන් කළ ද, අනාගත බලශක්ති උපාය මාර්ග හැඩගස්වා ගැනීමේදී ක්‍රමයෙන් විකාශනය වන ඉල්ලුම සම්බන්ධයෙන් අවබෝධ කර ගැනීම ද එකසේ වැදගත් වේ. සමස්ත විදුලි භාවිතය වාර්ෂිකව 4%ක සාමාන්‍යයකින් ඉහළ යාමත්, උපරිම ඉල්ලුම වසරකට ආසන්න වශයෙන් 3%කින් ඉහළ යාමත් සමඟ 2011 සහ 2021 අතර කාලය තුළ, මෙරට විදුලි ඉල්ලුම ක්‍රමයෙන් වර්ධනයට ලක්ව ඇත. කෙසේ වෙතත්, 2020 වසරේදී කොවිඩ්19 වසංගතය මෙම වර්ධනයට බාධා පැමිණවීමත් සමඟ එහි ප්‍රතිඵලයක් ලෙස විදුලිය භාවිතය 1.8%කින් අඩුවීම සිදුවිය. 2021 වසරේ දී, ආර්ථික ක්‍රියාකාරකම් ඉහළ යාමත්, වසංගතයට පෙර පැවති මට්ටම් කරා ඉල්ලුම යථා තත්වයට පැමිණීමත් සමඟ 6.2%ක වැඩි වීමක් සහිතව ප්‍රබල නැවත වර්ධනයක් විදුලිය භාවිතයෙහි ඇති විය. මෙලෙස කෙටි කාලීන වශයෙන් යථාතත්ත්වයට පත්වුවද, රට ඉක්මනින්ම දිගුකාලීන ආර්ථික අර්බුදයකට අවතීර්ණ වූ අතර එහි ප්‍රතිඵලයක් ලෙස ව්‍යාපාර වසා දැමීම්, රැකියා අහිමිවීම් සහ කුටුම්භ ආදායම් අඩුවීම් සිදු විය. මෙම පසුබෑම විදුලි භාවිතය කෙරෙහි සැලකිය යුතු බලපෑමක් ඇති කරන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස, 2021 සිට 2024 දක්වා විදුලි ඉල්ලුමෙහි සැලකිය යුතු පසුබෑමක් දක්නට ලැබුණු අතර එය ආර්ථිකයේ මට්ටම් වෙනසකට තුඩු දෙන ලදී. වර්තමාන තත්වය හා අනාගත නැඹුරුතා සලකා බලා අනාගත විදුලි උත්පාදන පුළුල් කිරීමේ සැලසුම් නැවත සමාලෝචනය කරමින් මෙම ඉල්ලුමෙහි අඩු වර්ධනය සපුරාලීමට අපේක්ෂා කෙරේ. මෙම පසුබිම තුළ, බලශක්ති අමාත්‍යාංශය විසින් ප්‍රධාන වශයෙන් අවධානය යොමු කරනුයේ විදුලිය හා ඉන්ධන සැපයීම නොකඩවා සිදුකිරීමත් සහ රටේ බලශක්ති සුරක්ෂිතතාව සහතික කළ හැකි ස්ථාවර බලශක්ති ක්ෂේත්‍රයක් තහවුරු කිරීමත් කෙරෙහිය. ‘‘ප්‍රජා මූල බලශක්ති සංක්‍රාන්තියක් ’’ තුළින් සාක්ෂාත් කර ගැනෙන හරිත ආර්ථිකයක් හරහා සමාජආර්ථික ප්‍රගතිය කරා ශ්‍රී ලංකාව මෙහෙයවීම මෙම අමාත්‍යාංශයේ අරමුණ වී ඇත.

ශ්‍රී ලංකාව මෑත කාලීනව තිරසර බලශක්ති වැඩසටහන් ක්‍රියාත්මක කිරීම උදෙසා පියවර කිහිපයක් ම ගෙන තිබේ. බලශක්ති ප්‍රතිපත්තියේ (2019) ප්‍රධාන මූලධර්ම මගින් රටේ දේශීය පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන් ප්‍රශස්ත මට්ටම කරා තවදුරටත් සංවර්ධනය කිරීම, ජනන මිශ්‍රණය විවිධාංගීකරණය කිරීම සහ ආනයනික පොසිල ඉන්ධන මත යැපීම අවම කිරීම සඳහා මඟ පෙන්වීම සිදුකරයි. සම්පත් විභවය, ආර්ථික කරුණු, තාක්ෂණයේ පරිණතභාවය සහ සැපයුමේ ගුණාත්මකභාවය සැලකිල්ලට ගනිමින් පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන් සංවර්ධනය කළ යුතු බව එහි සඳහන් වේ. මෙම මූලපිරීම් මගින් විදුලිබල සැපයුම සඳහා පිවිතුරු බලශක්තිය මත පදනම් වූ බලශක්ති උත්පාදනයේ දායකත්වය වැඩි කිරීමට අපේක්ෂා කෙරේ. නව රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශනයෙන් අපේක්ෂා කරන ලද 'ප්‍රජා මූල බලශක්ති සංක්‍රාන්තිය' යන තේමාවට අනුකූලව, සුළං, සූර්ය බලය, ජලය හා ජෛව ස්කන්ධ මගින් විදුලිබල උත්පාදනය ඉහළ නැංවීම සම්බන්ධයෙන් සැලකිය යුතු වර්ධනයක් අත් කරගැනීම අපේක්ෂාවයි. ඊට අමතරව, ඉල්ලුම් පාර්ශ්ව කළමනාකරණ (DSM) කටයුතු සහ සම්ප්‍රේෂණ සහ බෙදාහැරීමේ හානි අවමකරණ කටයුතු කාබන් හා හරිතාගාර වායු විමෝචන අඩු කිරීම සඳහා සහාය ලබා දෙනු ඇත. තවද, දැනට පවතින ඉන්ධන තෙල් (Fuel oil) මත පදනම් වූ සංයුක්ත චක්‍රීය විදුලි බලාගාර ස්වභාවික වායු වලින් ක්‍රියාත්මක වන ඒවා බවට පරිවර්තනය කිරීම සහ ස්වාභාවික වායු මත පදනම් වූ නව බලාගාර හඳුන්වාදීම ජාතිකව නිර්ණය කරන ලද දායකත්ව (NDCs) සඳහා ද දායක වෙමින් විමෝචනය අඩු කිරීමේ ප්‍රයත්නයන් සඳහා පිටුබලය ලබා දෙනු ඇත. චක්‍රීය බලශක්ති පහසුකම (power wheeling) සහ ඒකාබද්ධ යෝජනා ක්‍රම (aggregation schemes) වැනි සංකල්ප මෙන්ම ශ්‍රී ලංකාව බලශක්ති අපනයනකරුවෙකු බවට පත් කිරීමේ හැකියාව ඇති හරිත හයිඩ්‍රජන් සහ ඇමෝනියා වැනි අනාගතවාදී සංකල්ප ද උපයෝගී කරගනිමින්, බලශක්ති කර්මාන්තයේ පෞද්ගලික අංශයේ සහභාගීත්වය වර්ධනය සඳහා යොදා ගත හැකි නව ව්‍යාපාර ආකෘතීන් සම්බන්ධයෙන් මේ වනවිටත් රජයේ අවධානය යොමු වී ඇති අතර, සියල්ල අන්තර්ගත හරිත ආර්ථිකයක් කරා ගෙන යා හැකි පිටුබලයන් ලෙස ද ඒවා සලකනු ලබයි. තවද, අනාගතයේදී නව ගල් අඟුරු බලාගාර ඉදිකිරීමෙන් ධාරිතා එක්කිරීමට අපේක්ෂා නොකෙරේ. වසර 2050 දී කාබන් උදාසීනත්වය ළඟා කර ගැනීමේ විදුලිබල ක්ෂේත්‍රයෙහි දිගුකාලීන ඉලක්කය මත පදනම්ව ජාතික බලශක්ති ප්‍රතිපත්තිය සහ උපාය මාර්ග සකස් කිරීම සිදුවේ.

මෙම සන්දර්භය තුළ, හරිතාගාර වායු විමෝචනය උපායමාර්ගිකව අවම කිරීම මෙහෙයවන්නා වූ ජාතිකව නිර්ණය කරන ලද දායකත්ව (NDCs) සහ ශ්‍රී ලංකාවේ ජාතික අනුහුරුවීමේ සැලැස්ම (NAP) යන සැලසුම් දෙක තුළම බලශක්ති ක්ෂේත්‍රයේ මැදිහත්වීම් අන්තර්ගත කර තිබේ. තවද, ජාල පෝෂක ගාස්තු අයකුම (feed-in tariffs) සහ "ශුද්ධ මනුකරණය", "ශුද්ධ ගිණුම්කරණය" සහ "නෙට් ප්ලස් (net plus)" ආකෘති ඇතුළු, පියැසි මත සවි කරන සූර්ය බලශක්ති පද්ධති සම්බන්ධතා යෝජනා ක්‍රම වැනි ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම හරහා ශ්‍රී ලංකාව පුනර්ජනනීය බලශක්තිය සම්බන්ධයෙන් පෞද්ගලික අංශයේ ආයෝජන ශක්තිමත් කිරීම සිදුකර ඇත. ස්ථර වශයෙන් වූ විදුලි ගාස්තු (tiered electricity tariffs), කාල පාදක (ToU) බිල්පත් ක්‍රමය සහ විදුලි පහන් සඳහා තාපදීප්ත ආලෝකයෙන් ආලෝක විමෝචක ඩයෝඩ (LED) ආලෝකකරණයට මාරු වීම සඳහා පාරිභෝගිකයින් දිරිගැන්වීම ආදී ක්‍රම ඔස්සේ බලශක්ති කාර්යක්ෂමතාව ඉහළ නැංවීමට කටයුතු කර ඇත. උපාංග ලේබල් කිරීම, කේත සහ ප්‍රමිතීන් සහ කාර්යක්ෂම පද්ධති තාක්ෂණයන් හඳුන්වා දීම, සහ ආර්ථිකයේ සැලසුම්ගත උප අංශ සඳහා කාර්යක්ෂම උපකරණ, කාර්යක්ෂම ගොඩනැගිලි මෙන්ම අනිවාර්ය බලශක්ති කාර්යසාධන මිණුම් (Benchmark) හඳුන්වා දීම අරමුණු කරගත් බලශක්ති කාර්යක්ෂමතාව නඟා සිටුවීම සහ සංරක්ෂණ (EEI&C) වැඩසටහන මගින් බලශක්ති ක්ෂේත්‍රයේ හරිතාගාර වායු විමෝචනය අවම කිරීම සඳහා අතිශය වැදගත් කාර්යභාරයක් ඉටු කරමින් සිටියි.

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව (CPC) ප්‍රධාන වශයෙන් විදුලිබල උත්පාදනය, ප්‍රවාහනය සහ කර්මාන්ත සඳහා ඛනිජ තෙල් නිෂ්පාදන සැපයුම තහවුරු කරනු ලැබීම පිණිස ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරනු ලබයි. ඛනිජ තෙල් නිෂ්පාදන ආනයනය කිරීම, අපනයනය කිරීම, පිරිපහදු කිරීම, ගබඩා කිරීම, සැපයීම, බෙදා හැරීම සහ අලෙවිකරණය ඇතුළු සියලු ආකාරයන්හි කටයුතු සංස්ථාව විසින් සිදු කරනු ලබයි. එවක පැවති ලංකා ඉන්දියානු තෙල් සමාගමට (LIOC) අමතරව, 2024 වසරේ දී සිනොපෙක්, ආර්.එම්. පාර්ක්ස් සහ යුනයිටඩ් පෙට්‍රෝලියම් යන සමාගම් ද ශ්‍රී ලංකාවේ ඛනිජ තෙල් ව්‍යාපාරය ක්ෂේත්‍රය හා එක්ව කටයුතු කරන ලදී.

ඛනිජ තෙල් ව්‍යාපාරික කටයුතු තවදුරටත් පුළුල් කිරීම උදෙසා ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් ත්‍රිකුණාමලයේ පවතින තෙල් ටැංකි සංකීර්ණයේ තෙල් ටැංකි 24ක් ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතියක් දියත් කර ඇත. ත්‍රිකුණාමල ඛනිජ තෙල් පර්යන්ත සමාගම එම පරිශ්‍රයේ ටැංකි 61ක් සංවර්ධනය කිරීම සඳහා මූලික කටයුතු ද ආරම්භ කර ඇත.

අප රටේ ඛනිජ තෙල් ක්ෂේත්‍රයෙහි කටයුතු නියාමනය කරනු ලැබීම සඳහා ස්වාධීන නියාමන අස්ථිත්වයක ඇති අවශ්‍යතාවය හඳුනාගනු ලැබූ මෙම අමාත්‍යාංශය 2024 වසරේ දී ඒ උදෙසා මූලික පියවර ගැනීමට කටයුතු කරන ලදී. මේ සම්බන්ධයෙන් වූ මූලික කෙටුම්පතක් 2024 දී අනුමැතිය ලබාගැනීම පිණිස අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කෙරිණි. බලශක්ති ක්ෂේත්‍රයට අදාළව නියාමන ආයතනයක් පිහිටුවීම සඳහා දැනටමත් යෝජනාවක්, පවතින අතර ඉදිරියේදී මෙම කාර්යය ක්‍රියාත්මක කිරීමට නියමිතව තිබේ.

ශ්‍රී ලංකාවේ ඉන්ධන ගොඩබෑම සහ බෙදා හැරීම වඩාත් කාර්යක්ෂම කිරීමේ අරමුණින් යුතුව සීමාසහිත ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම විසින් 2024 වර්ෂය තුළ ඉන්ධන ප්‍රවාහන නල මාර්ග පද්ධති සංවර්ධනය කිරීම, ඉන්ධන ගබඩා ටැංකි ඉදිකිරීම සහ අලුත්වැඩියා කිරීම යනාදිය ක්‍රියාත්මක කරන ලදී. මෙම ව්‍යාපෘතිවල කටයුතු තවදුරටත් අඛණ්ඩව සිදුවෙමින් පවතී.

ශ්‍රී ලංකා ඛනිජ තෙල් සංවර්ධන අධිකාරිය යනු ශ්‍රී ලංකාවේ තෙල් හා ගෑස් ගවේෂණ සහ සංවර්ධන (EPD) කටයුතු සඳහා වන නියාමන ආයතනයයි. මෙම අස්ථිත්වය 2021 අංක 21 දරන ඛනිජ තෙල් සම්පත් පනත මගින් ස්ථාපිත කරන ලදී. ගැසට් නිවේදනයක් මගින් නව ඛනිජ තෙල් සම්පත් ගවේෂණ සහ සංවර්ධන බිම් කොටස් සිතියමක් (block map) එළි දැක්වීම 2024 වර්ෂයේදී මෙම ආයතනය විසින් ඉටු කරන ලද වැදගත් කාර්යභාරයක් විය. අනාගතයේදී තෙල් හා ගෑස් ගවේෂණ කටයුතු සඳහා ආයෝජකයින් සොයා ගැනීම සඳහා මෙය පහසුවක් වනු ඇති බවට අපේක්ෂා කෙරේ.

වසර ගණනාවක් මුළුල්ලේ ඛනිජ තෙල් කර්මාන්තය සම්බන්ධයෙන් නොයෙකුත් අභියෝග පැවතිය ද, එම අභියෝග ජයගනිමින් යම් සාර්ථකත්වයක් අත්කර ගැනීමට සමත් වූ වසරක් ලෙස 2024 වසර සැලකිය හැකි ය.

1.2 දැක්ම සහ මෙහෙවර

දැක්ම

"ශ්‍රී ලංකාව දකුණු ආසියාවේ බලශක්ති කේන්ද්‍රය බවට පත් කිරීම"

මෙහෙවර - විදුලිබල අංශය

"ජාතික ආර්ථික සෞභාග්‍ය උදෙසා අවැසි ගුණාත්මක, විශ්වසනීය, තිරසර හා මිල දැරිය හැකි විදුලිබල සැපයුමක් සහතික කිරීම"

මෙහෙවර - බලශක්ති අංශය

"ජාතික අවශ්‍යතා සපිරෙන පරිදි, අඩු වියදම් බලශක්තිය සඳහා ප්‍රවේශය වැඩි කරමින් ඉන්ධන ආනයනය කළමනාකරණය හා දේශීයව නව බලශක්ති ප්‍රභවයන් බලශක්ති මිශ්‍රණයට එකතු කිරීම සහ නියමිත නීති සහ අණ පනත්වලට අනුකූලව බලශක්ති විෂයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනය හා නියාමනය මඟින් පරිසර හිතකාමී තිරසර බලශක්ති සැපයුමක් තහවුරු කිරීම"

1.3 ප්‍රධාන කාර්යයන් හා කර්තව්‍යයන්


2024 නොවැම්බර් 25 දිනැති අංක 2412/08 දරණ ගැසට් නිවේදනයට අනුව බලශක්ති අමාත්‍යාංශයේ විෂයයන් සහ කාර්යයන් පහත පරිදි වේ;

01. සූර්ය, ජලය, තාපය, ගල් අඟුරු, අපද්‍රව්‍ය සහ සුළං යනා දී මූලාශ්‍රයන් මගින් පුනර්ජනනීය බලශක්ති, විදුලිය සහ අනෙකුත් බලශක්තිය නිපදවීම සම්බන්ධ කටයුතු ගවේෂණය, සැලසුම්කරණය, සංවර්ධනය සහ අධීක්ෂණය.
02. ශ්‍රී ලංකාවේ විදුලිබල අවශ්‍යතා සපුරාලීම සහ බලශක්ති සුරක්ෂිතතාව ආරක්ෂා කිරීම.
03. බලශක්ති කාර්යක්ෂමතාව ඇතිවන පරිදි ඉල්ලුම කළමනාකරණය කිරීම.
04. දිගුකාලීන අවශ්‍යතා පදනම් කරගත් විදුලි ජනන සැලැස්මක් ක්‍රියාත්මක කිරීම.
05. බලශක්ති සම්ප්‍රේෂණය හා බෙදා හැරීමේ ක්‍රියාවලිය කාර්යක්ෂම කිරීම.
06. ජනනය කරනු ලබන විදුලි බලය උපරිම කාර්යක්ෂමතාව සහිතව භාවිත කිරීම සහතික කිරීම සඳහා සුහුරු ජාලයක් නිර්මාණය කිරීම.
07. විදුලිය ජනනය සඳහා දරනු ලබන පිරිවැය අඩු කිරීම සහ ජනනයේදී ඇතිවන අවිනිශ්චිතතා ඉවත් කිරීම.
08. පවතින අධික වියදම් සහිත විදුලි උත්පාදන ප්‍රභවයන් අඩු වියදම්, පරිසර හිතකාමී, පුනර්ජනනීය ප්‍රභවයන් සමඟ ප්‍රතිස්ථාපනය කිරීම සඳහා සුදුසු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
09. ජාතික පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘතිවල ආයෝජන සඳහා දේශීය සමාගම්වලට සමාන අවස්ථා ලැබෙන බව සහතික කිරීම.
10. කාර්මික අපද්‍රව්‍ය භාවිතයෙන් බලශක්ති උත්පාදනය වැඩි කිරීම.
11. සමුපකාර මූලධර්ම මත පදනම්ව බලශක්ති ඒකක ලෙස ක්ෂුද්‍ර ජාල ස්ථාපිත කිරීම.
12. බලශක්ති ක්ෂේත්‍රයේ උපායමාර්ගික හවුල්කාරිත්වයන් සහ ආයෝජන අවස්ථා ඇති කිරීම.
13. විශේෂයෙන් පවතින ගිවිසුම් අලුත් කිරීම මගින් කුඩා පරිමාණ ජල විදුලිබල උත්පාදනය සඳහා නැවත ආයෝජනය කිරීම දිරිමත් කිරීම.

14. විදුලි බිල යාවත්කාලීන කිරීම සහ ඛනිජ තෙල් සහ ගෑස් සඳහා මිල සූත්‍රය ආදේශය සඳහා වඩාත් සාධාරණ හා විනිවිද පෙනෙන ක්‍රමවේදයක් හඳුන්වාදීම.
15. දිගු කාලීන අවශ්‍යතා මත බලශක්ති උත්පාදන සැලැස්මක් ක්‍රියාත්මක කිරීම.
16. ආයතනික කළමනාකරණ මට්ටමින් සිදුවන පාඩු සහ විදුලි ජනන හා බෙදාහැරීමේ පද්ධතියට සිදුවන තාක්ෂණික හානි අවම කිරීමට අවශ්‍ය පියවර ගැනීම.
17. විදුලි වාහන භාවිතයට පහසුකම් සැලසීම සහ දිරිගැන්වීම
18. ශ්‍රී ලංකාව බලශක්ති වෙළඳ මධ්‍යස්ථානයක් බවට පත්කිරීම සඳහා කටයුතු කිරීම.
19. හරිතාගාර වායු විමෝචනය පාලනය කිරීම.
20. ග්‍රාමීය විද්‍යුතනය.
21. ඛනිජ තෙල් ආශ්‍රිත නිෂ්පාදන සහ ස්වාභාවික ගෑස් ආනයනය කිරීම, පිරිපහදු කිරීම, ගබඩා කිරීම, බෙදා හැරීම සහ අලෙවි කිරීම සම්බන්ධීකරණය සහ ක්‍රියාත්මක කිරීම.
22. ඛනිජ තෙල් නිෂ්පාදනය සහ පිරිපහදුව සම්බන්ධ කටයුතු.
23. ඛනිජ තෙල් සහ ස්වාභාවික ගෑස් ගවේෂණය සහ ඒ ආශ්‍රිත කටයුතු.
24. ඛනිජ තෙල් නිෂ්පාදන ප්‍රභවයන්ගෙන් ගෑස් සහ අතුරු නිෂ්පාදන නිපදවීමට අදාළ කටයුතු, තොග පවත්වා ගැනීම, නිෂ්පාදනය හා බෙදා හැරීම.
25. ඉන්ධන සැපයීම සහ බෙදා හැරීමට අදාළ වන යටිතල පහසුකම් සංවර්ධනය කිරීම.
26. බලශක්ති සම්පත් පාලනය, නියාමනය සහ උපයෝජනය උදෙසා උචිත බලශක්ති ප්‍රතිපත්තියක් සම්පාදනය කිරීම.
27. තෙල් පිරිපහදු කිරීමේ ධාරිතාව වැඩි දියුණු කිරීම සහ ඛනිජතෙල් අතුරුඵල නිෂ්පාදන ආශ්‍රිත කර්මාන්ත දිරිමත් කිරීම.
28. ඉන්ධන සැපයීමේ විශ්වසනීයත්වය, අඛණ්ඩතාව සහ කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම.

1.4 සංවිධාන සටහන

- විදුලිබල අංශය



බලශක්ති අංශය
ගරු අමාත්‍යතුමා
ලේකම්
අතිරේක ලේකම් (පාලන) 01
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (පාලන) 01
සහකාර ලේකම් (පාලන) 01
පරිපාලන නිලධාරී 01
භාෂා පරිවර්තක 01
නීති නිලධාරී 01
සහකාර අධ්‍යක්ෂ (තොරතුරු තාක්ෂණ) 01
අතිරේක ලේකම් (ප්‍රසම්පාදන) 01
අධ්‍යක්ෂ (ප්‍රසම්පාදන) 01
නියෝජ්‍ය/සහකාර අධ්‍යක්ෂ (ප්‍රසම්පාදන) 01
අතිරේක ලේකම් (සංවර්ධන) 01
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (සංවර්ධන) 01
සහකාර ලේකම් සංවර්ධන 03
ප්‍රධාන ඉංජිනේරු 01
අධ්‍යක්ෂ ජනරාල් (භූමිසම්පාදන) 01
අධ්‍යක්ෂ (සැලසුම්) 01
නියෝජ්‍ය/සහකාර අධ්‍යක්ෂ (සැලසුම්) 01
ප්‍රධාන මූල්‍ය නිලධාරී 01
ප්‍රධාන ගණකාධිකාරී 01
ගණකාධිකාරී 01
ප්‍රධාන අභ්‍යන්තර විගණක 01
අභ්‍යන්තර විගණක 01
ලේකම්ගේ සම්බන්ධීකරණ ලේකම් 01
තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරී 01
සංවර්ධන නිලධාරී 26
කළමනාකරණ සේවා නිලධාරී 25
කාර්යාල කාර්ය සහායක 11
තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර 01
රියදුරු 11
නිශ්චල ඡායාරූප ශිල්පී 01
කැමරා සහායක 01

1.5 අමාත්‍යාංශය යටතේ පවතින ප්‍රධාන අංශ හා කාර්යයන්

- **ආයතන හා පරිපාලන අංශය**

  - අමාත්‍යාංශයේ සේවය කරන සියළුම නිළධාරීන්ගේ සහ අමාත්‍යාංශයට අනුබද්ධිත ආයතන වලට අදාළ පරිපාලන කටයුතු සහ එම නිළධාරීන්ගේ රාජකාරී ඉටු කිරිමේදී කාර්යක්ෂමතාවය සහ ඵලදායිතාවය වැඩිදියුණු කිරීමට අවශ්‍ය පියවර ගැනීම.
  - අමාත්‍යාංශ කාර්ය මණ්ඩලයේ පුද්ගලික ලිපිගොනු නිසි ලෙස නඩත්තු කිරීම.
  - අමාත්‍යාංශයේ මානව සම්පත කළමනාකරණය හා සුභසාධන පහසුකම් සැලසීම.
  - අමාත්‍යාංශයේ නිළධාරීන්ගේ දැනුම, අත්දැකීම් සහ ආකල්ප වර්ධනය කිරීම සඳහා ඔවුන් දේශීය සහ විදේශීය වශයෙන් පුහුණු වැඩසටහන් සම්මන්ත්‍රණ සහ වැඩමුළු සඳහා සහභාගි කරවීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම.
  - අමාත්‍යාංශය පිහිටි ගොඩනැගිල්ලේ යටිතල පහසුකම් සහ නඩත්තු කටයුතු නිසි ලෙස සිදු කරමින් යහපත් වැඩ පරිසරයක් පවත්වාගෙන යාම සහ දුරකථන පරිගණක ඡායා පිටපත් යන්ත්‍ර උපකරණ වල අළුත්වැඩියා කිරීම් හා නඩත්තු කිරීම් වලට ආදාල කටයුතු සිදු කිරීම.
  - බාහිර ආයතන හා පුද්ගලයන් විසින් අමාත්‍යාංශය වෙත යොමු කරන ලිපි ලේඛන අදාළ අංශ වෙත යොමුකිරීම හා අමාත්‍යාංශයේ බාහිර පාර්ශවයන්ට නිකුත් කරන ලිපි ලේඛන දෛනික තැපෑල මඟින් බෙදා හැරීම හා මහජනතාව විසින් අමාත්‍යාංශය වෙත යොමු කරන ඉල්ලීම් පැමිණිලි සහ යෝජනා සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු සිදු කිරීම.
  - අමාත්‍යාංශයේ යටතේ ඇති වාහන නිසි පරිදි නඩත්තු කරමින් අවශ්‍යතාව පරිදි නිළධාරීන් වෙත රාජකාරී කටයුතු සඳහා ප්‍රවාහන පහසුකම් ලබා දීම සිදු කිරීම.

- **සංවර්ධන අංශය**

  - පුනර්ජනනීය බලශක්ති / පරමාණුක බලශක්ති හා විකිරණ ක්ෂේත්‍රයට අදාළ ප්‍රතිපත්ති සකස් කිරීම.
  - පුනර්ජනනීය බලශක්ති ජනනයන් ජාතික පද්ධතියට එකතු කර ගැනීමේ ගාස්තු නිර්ණය කිරීම.
  - ව්‍යාපෘති මූල්‍යනය සහ දායකත්ව සම්බන්ධීකරණය බහුපාර්ශවීය සම්බන්ධීකරණය.
  - පුනර්ජනනීය බලශක්ති සංවර්ධනය සඳහා පහසුකම් සැලසීම.
  - පුනර්ජනනීය බලශක්ති / පරමාණුක බලශක්ති හා විකිරණ ක්ෂේත්‍රයට අදාළ විදේශ ආයතන සමග සම්බන්ධීකරණය.
  - පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති සඳහා ආනයනය කරනු ලබන භාණ්ඩ, උපකරණ හා අමුද්‍රව්‍ය සඳහා රේගු නිශ්කාෂණ හා බදු සහන ඉල්ලීම් නිර්දේශ කිරීම.
  - පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති සඳහා පැමිණෙන විදේශීය උපදේශකවරුන් / කාර්ය මණ්ඩල සඳහා අවශ්‍ය පිවිසුම් වීසා / පදිංචි වීසා නිකුත් කිරීම / දීර්ඝ කිරීම සඳහා නිර්දේශ ලබා දීම.
  - පුනර්ජනනීය බලශක්ති සංවර්ධනය සඳහා ප්‍රදේශ නම් කිරීමේ / ඉඩම් අත් කර ගැනීමේ කටයුතු සම්බන්ධීකරණය.
  - පරමාණුක බලශක්ති හා විකිරණ ආරක්ෂණ කාර්යයන්ට අදාළ බහුපාර්ශ්වීය සම්බන්ධීකරණය.
  - පෙරභාග, මධ්‍ය සහ පසුභාග ඛනිජ තෙල් කර්මාන්තයට අදාළ වන සංවර්ධන ප්‍රතිපත්තිමය තීරණ සම්පාදනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම.
  - ඛනිජ තෙල් හා ස්වාභාවික වායු ගවේෂණය සහ නිෂ්පාදනයට අදාළ සියලු සංවර්ධන කටයුතු සම්බන්ධීකරණය කිරීම.

- ඛනිජ තෙල් අංශයට අදාළ සංවර්ධන හා නියාමන කටයුතු සම්බන්ධීකරණය සහ අධීක්ෂණය.
- ඛනිජ තෙල් නිෂ්පාදන මිල නියම කිරීම, ඉන්ධන සහනාධාර ලබාදීම, බෙදාහැරීම, වෙළඳාම සහ අලෙවිකරණයට අදාළ ගැටලු ආදියේදී මුදල් අමාත්‍යාංශය හා අනෙකුත් රාජ්‍ය ආයතන සම්බන්ධීකරණය කිරීම.
- ශ්‍රී ලංකාව තුළ නැව් තෙල් වෙළඳපොළ, තාර වෙළඳපොළ සහ ලිහිසි තෙල් වෙළඳපොළ සම්බන්ධ කටයුතුවල යෙදී සිටින සුදුසු පාර්ශව වෙත බලපත්‍ර නිකුත් කිරීම/නිකුත් කරන ලද බලපත්‍ර අලුත් කිරීම සහ වෙනත් විශේෂිත වූ ඛනිජ තෙල් නිෂ්පාදන ආනයනය කිරීමට පෞද්ගලික අංශයට අවසර ලබාදීම.

■ විදුලිබල හා විදුලිබල ප්‍රතිසංස්කරණ අංශය

- විදුලි උත්පාදනය, සම්ප්‍රේෂණය සහ බෙදාහැරීම සම්බන්ධ සියලු ප්‍රතිපත්තිමය කරුණු සහ විශාල හා මධ්‍ය පරිමාණ විදුලි උත්පාදන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.
- ශ්‍රී ලංකාවේ විදුලිබල ක්ෂේත්‍රය සඳහා පරිසර හිතකාමී ඉන්ධනයක් ලෙස ද්‍රවීකෘත ස්වභාවික වායු හඳුන්වාදීමේ ක්‍රියාවලිය මෙහෙය වීම.
- විදුලිබල ක්ෂේත්‍රය සඳහා ආයතනික ප්‍රතිව්‍යුහකරණයට අදාළව සිදු කරන සියළුම කටයුතු සම්බන්ධීකරණය කිරීම.
- තාප විදුලිබලාගාර ව්‍යාපෘති සහ පුනර්ජනනීය විදුලි බලාගාර ව්‍යාපෘති අනුමත කිරීම, ක්‍රියාත්මක කිරීම සහ ඒවාට අවශ්‍ය ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු.
- ඉහත සඳහන් ව්‍යාපෘතිවලට අදාළව විදේශ සම්පත් දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම.
- විදුලිබල හා විදුලිබල ප්‍රතිසංස්කරණ අංශයට අනුයුක්ත කාර්ය මණ්ඩලයේ අභ්‍යන්තර පරිපාලනයද ඇතුලත්ව අංශයේ සමස්ථ පරිපාලනය.
- විදුලිබල ක්ෂේත්‍රයට අදාළව ගරු බලශක්ති අමාත්‍යතුමා සහ ලේකම්තුමා විසින් වරින් වර පවරනු ලබන සියළුම රාජකාරීන්.

■ තාක්ෂණ අංශය

- ශ්‍රී ලංකා විදුලිබල පනත යටතේ විධිවිධාන සංශෝධනය කිරීම, රෙගුලාසි හා රීති පැනවීම, ප්‍රතිපත්තිමය මඟපෙන්වීම් සිදු කිරීම ඇතුළුව ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව සමඟ සම්බන්ධීකරණය කිරීම.
- විදුලි ජනන, සම්ප්‍රේෂණ හා බෙදාහැරීම් සඳහා වන බලපත්‍ර ලබාදීම සඳහා ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිසමට අවශ්‍ය වන ගරු අමාත්‍යවරයාගේ එකඟතාවය ලබාදීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීම.
- ජලවිදුලි සහ තාප විදුලි (ගල් අඟුරු, ඉන්ධන තෙල් සහ පරමාණු බලශක්ති වැනි) බලාගාරවල නිෂ්පාදනයන් අධීක්ෂණය කිරීම හා මෙහෙයවීම. විදුලි සැපයුම් බිඳවැටීම් වැළක්වීමට, සම්ප්‍රේෂණ සහ බෙදාහැරීම් පද්ධතිවල සියලුම ඌනතා වැළැක්වීමට හා අඩුකිරීමට අදාළ සියලුම තාක්ෂණික කටයුතු.
- ජල විදුලිය, පරමාණු බලශක්ති, ගල් අඟුරු තාපබල විදුලි, අනෙකුත් තාපබල විදුලි සහ සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති වැනි ප්‍රභවයන් යොදාගනු ලබන සියළුම විදුලි බලාගාර ව්‍යාපෘතීන් වල ඉදිකිරීම් වලට අදාළ තාක්ෂණික කටයුතු.
- බලශක්ති සැලසුම් කිරීමට අදාළ සියලු කටයුතු අධීක්ෂණය කිරීම හා මෙහෙයවීම.
- බලශක්ති සංරක්ෂණය සහ ඉල්ලුම් හා සැපයුම් කළමනාකරණයට අදාළ කටයුතු.
- ඉන්දියා ශ්‍රී ලංකා විදුලිජාල පද්ධති අන්තර් සම්බන්ධ කිරීමට (India – Sri Lanka Grid Interconnection) යෝජිත ව්‍යාපෘතියට අදාළ කටයුතු.

- විදේශ කටයුතු අමාත්‍යාංශය හරහා විදුලිබල හා බලශක්ති ක්ෂේත්‍රයට අදාළව SAARC, BIMSTEC, ESCAP වැනි අන්තර්ජාතික සංවිධාන සමඟ සිදුවන තාක්ෂණික සටයුතු සම්බන්ධීකරණය කිරීම.
- තාක්ෂණ අංශයට අදාළ විෂය පථය යටතේ වන සියලුම අවබෝධතා සහ සහයෝගිතා ගිවිසුම් සම්බන්ධයෙන් අවශ්‍ය වන අනුමැතීන් සහ ක්‍රියාත්මක කිරීම් සඳහා සම්බන්ධීකරණ කටයුතු කිරීම.
- විශේෂයෙන් විදුලිබල හා බලශක්තිය සම්බන්ධ තාක්ෂණික කරුණු සහ තාක්ෂණික අංශයේ අභ්‍යන්තර පරිපාලනය ඇතුළුව, ගරු බලශක්ති අමාත්‍යතුමා හා ලේකම්තුමා විසින් තාක්ෂණ අංශයට වරින් වර පවරනු ලබන රාජකාරි ඉටුකිරීම.

- **සැලසුම් අංශය**

- අමාත්‍යාංශයේ ක්‍රියාකාරී සැලසුම්, වාර්ෂික කාර්යසාධන වාර්තාව සහ ප්‍රගති වාර්තාව සකස් කිරීම සහ අදාළ පාර්ශ්ව වෙත ඉදිරිපත් කිරීම.
- විදුලිබල හා බලශක්ති ක්ෂේත්‍රයට අදාළ ව්‍යාපෘති යෝජනා සකස් කිරීම, සමාලෝචනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය අනුමැතිය ලබා ගැනීම.
- සංවර්ධන ව්‍යාපෘති සඳහා වාර්ෂික අයවැය ඇස්තමේන්තු සකස් කිරීම.
- ව්‍යාපෘතිවල ප්‍රගතිය අධීක්ෂණය කිරීම, සමාලෝචනය කිරීම සහ කාලීනව ප්‍රගති වාර්තා සකස් කිරීම.
- විදුලිබල අංශයේ ජාතික වශයෙන් නිර්ණය කරන ලද දායකත්ව ක්‍රියාත්මක කිරීම සහ තිරසාර සංවර්ධන ඉලක්කවලට අදාළ ක්‍රියාකාරකම් අධීක්ෂණය හා ප්‍රගති සමාලෝචනය.
- කාබන් වෙළඳාම් පහසුකම (carbon trading facility) සඳහා වන ඉල්ලීම් සම්බන්ධයෙන් සහ කාබන් ශුද්ධ ශූන්‍ය ඉලක්ක සපුරා ගැනීම සම්බන්ධයෙන් කටයුතු කිරීම.
- ජනාධිපති ලේකම් කාර්යාලය, අග්‍රාමාත්‍ය කාර්යාලය, රේඛීය අමාත්‍යාංශ සහ භාණ්ඩාගාර දෙපාර්තමේන්තු මගින් ඉල්ලා සිටින විවිධ වාර්තා සහ සැලසුම් සකස් කිරීම.
- බලශක්ති සංක්‍රාන්ති පනත සහ ජාතික බලශක්ති ප්‍රතිපත්තිය හා උපාය මාර්ගවලට අදාළව කටයුතුවල නිරතවීම.
- අමාත්‍යාංශය යටතේ ඇති ආයතන පිළිබඳව ආයතනික ප්‍රතිඵල කාර්යරාමු (Organization Result Frameworks) සකස් කිරීම.

- **ප්‍රසම්පාදන අංශය**

- අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ප්‍රසම්පාදන කමිටු (HLPC/SHLPC, SSHLPC) හා සම්බන්ධ කටයුතු සිදුකිරීම.
- උපදේශක ප්‍රසම්පාදන කමිටු අමාත්‍යාංශ මට්ටමට (CPCM) අදාළ කටයුතු සිදුකිරීම.
- අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද සාකච්ඡා සම්මුති කමිටු (CANC) හා සම්බන්ධ කටයුතු සිදුකිරීම.
- අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටු (MPC) හා සම්බන්ධ කටයුතු සිදුකිරීම.
- ප්‍රසම්පාදන අභියාචනයට අදාළ කටයුතු සිදුකිරීම.
- අමාත්‍ය මණ්ඩල සංදේශ ඉදිරිපත් කිරීම.

- **මූල්‍ය අංශය**
  - පාර්ලිමේන්තුව විසින් අදාළ වර්ෂය සඳහා සම්මත කරන ලද අමාත්‍යාංශයේ අයවැය ප්‍රතිපාදන ප්‍රමාණයන් අනුව අමාත්‍යාංශයේ සියලුම වියදම් කළමනාකරණය කිරීම.
  - අමාත්‍ය කාර්යමණ්ඩල හා අමාත්‍යාංශ කාර්යමණ්ඩලයේ වැටුප් සකස් කිරීම, ගෙවීම හා වැටුප් සම්බන්ධ අනිකුත් කටයුතු සිදු කිරීම.
  - අමාත්‍ය කාර්යමණ්ඩලයට හා අමාත්‍යාංශ කාර්යමණ්ඩලයට අවශ්‍ය සියලුම වට්ටෝරු භාණ්ඩ, ලිපි ද්‍රව්‍ය හා කාර්යාල උපකරණ විධිමත්ව ඇණවුම් කිරීම හා අංශවල අවශ්‍යතා අනුව ඒවා නිකුත් කිරීම.
  - අමාත්‍යාංශය සතු නිල බැංකු ගිණුම නිසි අයුරින් පවත්වාගෙන යාම.
  - ඉදිරි මුදල් වර්ෂය සඳහා අමාත්‍යාංශයේ වියදම්වලට අවශ්‍ය ප්‍රතිපාදන ප්‍රමාණයන් ගණනය කරමින් අයවැය ඇස්තමේන්තු සකස් කිරීම.
  - රජයේ ආදායම් වශයෙන් අමාත්‍යාංශය වෙත ලැබෙන මුදල් හා අමාත්‍යාංශයේ කටයුතුවලදී දරනු ලබන වියදම් සඳහා සම්මත වර්ගීකරණය කිරීම හා ඒ සම්බන්ධ වාර්තා පවත්වා ගෙන යාම.
  - අමාත්‍යාංශයට දෛනිකව ලැබෙන ආදායම් හා සිදු කරන වියදම් අනුව ඒ ඒ මාසවලට ගිණුම් පිළියෙල කිරීම හා එම ගිණුම්වල තොරතුරු මහා භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කිරීම.
  - වාර්ෂිකව අමාත්‍යාංශයේ සියලුම ගණුදෙනු නියෝජනය වන පරිදි විසර්ජන ගිණුම පිළියෙල කර විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම.

- **අභ්‍යන්තර විගණන අංශය**
  - කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ මඟපෙන්වීම් අනුව අවදානම් මත පදනම්ව අමාත්‍යාංශයේ වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම.
  - අනුමත අභ්‍යන්තර විගණන සැලැස්ම ක්‍රියාත්මක කිරීම.
  - අමාත්‍යාංශය යටතේ ඇති ව්‍යවස්ථාපිත ආයතනයන්ට අදාළව කාර්යයන් ඉටු කිරීම.
  - ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ උපදෙස් මත විශේෂ විමර්ශන පැවැත්වීම.

1.6 අමාත්‍යාංශය යටතේ පවතින ආයතන

- **ලංකා විදුලිබල මණ්ඩලය**

ලංකා විදුලිබල මණ්ඩලය (CEB), රාජ්‍ය ව්‍යවසායක් ලෙස 1969 අංක 17 දරන පනත යටතේ ස්ථාපිත කර ඇති අතර ශ්‍රී ලංකාවේ විදුලිය ජනනය, සම්ප්‍රේෂණය සහ බෙදාහැරීම නියාමනය කිරීම සඳහා කිහිප වරක් සංශෝධනය කර ඇත. 2013 අංක 31 දරන පනතින් සංශෝධිත 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනත යටතේ ලංකා විදුලිබල මණ්ඩලය මගින් ගනු ලබන මිල තීරණ ක්‍රියාත්මක කිරීම. ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව (PUCSL) යටතට පත් කරන ලදී. නවතම ප්‍රතිසංස්කරණය වූ 2024 ජූනි 27 වන දින සම්මත කරනු ලැබූ 2024 අංක 36 දරන ශ්‍රී ලංකා විදුලිබල පනත මගින් විදුලිබල මණ්ඩලයද ඇතුළුව විදුලිබල ක්ෂේත්‍රය තුළ ප්‍රධාන වශයෙන් වැදගත් ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීමට නියමිතය.

- **සී/ස. ලංකා විදුලි (පුද්ගලික) සමාගම**

ලංකා විදුලි (පුද්ගලික) සමාගම (LECO) යනු 1982 අංක 17 දරන සමාගම් පනත සහ 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ 1983 වසරේදී සංස්ථාගත කරන ලද සීමාසහිත සමාගමකි. බස්නාහිර පළාතේ සිට දකුණු පළාත දක්වා වෙරළ බඩ කලාපය ආවරණය වන පරිදි බලය පවරන ලද ප්‍රදේශවල විදුලිය බෙදා හැරීම පිණිස ලංකා විදුලි (පුද්ගලික) සමාගම ස්ථාපිත කර ඇත. 54.84%ක කොටස් හිමිකාරිත්වයක් සමගින් ලංකා විදුලිබල මණ්ඩලයේ අනුබද්ධිත ආයතනයක් ලෙස පවතින ලංකා විදුලි (පුද්ගලික) සමාගම මහා

භාණ්ඩාගාරය වෙත 43.56%ක ද, නාගරික සංවර්ධන අධිකාරිය වෙත 0.79%ක ද, දේශීය අධිකාරී ආයතන වෙත 0.81%ක සුළුතර කොටස් හිමිකාරීත්වයක් සහිත ආයතනයකි. මීගමුව සිට ගාල්ල දක්වා වූ ශ්‍රී ලංකාවේ බටහිර වෙරළ තීරය ඔස්සේ ප්‍රධාන ආර්ථික කලාපය ආවරණය වන පරිදි එහි බලයලත් ප්‍රදේශය තුළ විදුලිය බෙදා හැරීම සිදුකරනු ලබයි. ලංකා විදුලි (පුද්ගලික) සමාගම විසින් පාරිභෝගිකයින් 600,000කට වැඩි ප්‍රමාණයක් සඳහා සේවා සපයනු ලබයි. 2009 අංක 20 දරන විදුලි පනත මගින්, සමාගම වෙත බෙදාහැරීමේ බලපත්‍රයක් නිකුත් කිරීමත් සමඟ ලංකා විදුලි (පුද්ගලික) සමාගම පසුකාලීනව මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ නියාමනය යටතට ගෙන එන ලදී.

- **ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය**

2007 ඔක්තෝබර් 1 වන දින තිරසාර බලශක්ති සංවර්ධනයක් උදෙසා වන ජාතික ආයතනය වශයෙන් ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය (SLSEA) පිහිටුවනු ලැබුයේ පුනර්ජනනීය බලශක්ති සංවර්ධනය, බලශක්ති කළමනාකරණය, ප්‍රතිපත්ති සංවර්ධනය සහ අරමුදල් කළමනාකරණය වෙනුවෙන් වූ මූලික අරමුණු හතරක් සහිතවයි. 2007 අංක 35 දරන ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය පනත මගින් මෙම අධිකාරිය සංස්ථාගත කර ඇත.

- **ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාව**

ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාව (SLAERC) පිහිටුවනු ලබා ඇත්තේ 2014 අංක 40 දරන ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති පනත යටතේ 2015 ජනවාරි 1 වන දින දී ය. පනතේ විධිවිධානවලට අනුව, ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාවට මූලික වශයෙන් පහත කාර්යයන් පැවරී ඇත;

මහජනතාව, විකිරණ ශිල්පීන්, රෝගීන් සහ පරිසරය ආරක්ෂා කිරීම සඳහා ක්‍රියාත්මක වීම, බලපත්‍ර නිකුත් කිරීම, පරීක්ෂා කිරීම සහ ආනයන සහ අපනයන පාලන වැඩසටහන් සිදුකිරීම මගින් අයනීකරණ විකිරණ සම්බන්ධ භාවිතාවන් සහ ප්‍රභවයන් නියාමනය කිරීම.විකිරණ ප්‍රභවයන්ගේ ආරක්ෂාව සහ සුරක්ෂිතබව සහතික කිරීම. පනතේ විධිවිධාන සහ බලපත්‍ර කොන්දේසි උල්ලංඝනය කිරීම් සම්බන්ධයෙන් බලාත්මක කළ හැකි ක්‍රියාමාර්ග ගැනීම. න්‍යෂ්ටික යෙදවුම්වලට අදාළව ආරක්ෂාව, සුරක්ෂිතබව සහ ආරක්ෂණ ක්‍රම පිළිබඳව ශ්‍රී ලංකාව විසින් අත්සන් තබා ඇති ගිවිසුම් සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ බැඳීම් ඉටු කිරීමට පියවර ගැනීම.

- **ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය**

ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය (SLAEB) යනු රජයේ ප්‍රමුඛතම න්‍යෂ්ටික විද්‍යා හා තාක්ෂණ ආයතනයි. ජාතික සංවර්ධන අරමුණු සඳහා න්‍යෂ්ටික විද්‍යාව හා තාක්ෂණය භාවිතය ප්‍රවර්ධනය කිරීම සහ දිරිගැන්වීම සඳහා 2014 අංක 40 දරන පරමාණුක බලශක්ති පනත මගින් ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය වෙත බලතල පැවරී ඇත. ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය විසින් අදාළ සේවාවන් ඔස්සේ, පර්යේෂණ සහ සංවර්ධන (R & D) කටයුතු හරහා න්‍යෂ්ටික තාක්ෂණයේ හිතකර යෙදවුම් ප්‍රවර්ධනය කිරීම සහ දිරිගැන්වීම සිදුකරනු ලබන අතර නියාමන අවශ්‍යතා සපුරමින් විකිරණ ආරක්ෂණ සේවා සැපයීම ද ආරක්ෂාව, සුරක්ෂිතභාවය සහ ගුණාත්මකභාවය සහතික කිරීම ද සිදුකරයි.

- **සී/ස. ලංකා ගල් අඟුරු (පුද්ගලික) සමාගම**

සීමාසහිත ලංකා ගල් අඟුරු (පුද්ගලික) සමාගම (LCC) යනු රජය විසින් පූර්ණ අයිතිය දරනු ලබන ව්‍යාපාරික ආයතනයකි. මෙම සමාගම ලංකා විදුලිබල මණ්ඩලය (CEB) යටතේ ක්‍රියාත්මක වන නොරොච්චෝලේ ලක්විජය විදුලි බලාගාරය (LVPP) වෙත ගල් අඟුරු ආනයනය කොට සැපයීම සඳහා සංස්ථාගත කර ඇත. 60%ක කොටස් හිමිකාරීත්වයක් සහිතව ලංකා විදුලිබල මණ්ඩලයේ එක් අනුබද්ධිත ආයතනයක් වන ලංකා ගල් අඟුරු (පුද්ගලික) සමාගමෙහි මහා භාණ්ඩාගාරය වෙත 20%ක, ලංකා නැව් සංස්ථාව වෙත 10%ක සහ ශ්‍රී ලංකා වරාය අධිකාරිය වෙත 10%ක සුළුතර කොටස් හිමිකාරීත්වයක් සතුවේ.

- **සී/ස. ශ්‍රී ලංකා එනර්ජීස් (පුද්ගලික) සමාගම**

2011 වසරේ දී සංස්ථාගත කරනු ලැබූ සමාගමක් වන සීමාසහිත ශ්‍රී ලංකා එනර්ජීස් (පුද්ගලික) සමාගම 100%ක් ලංකා විදුලිබල මණ්ඩලය විසින් හිමිකාරීත්වය දරනු ලබන අනුබද්ධිත ආයතනයක් ලෙස ක්‍රියාත්මක වේ. ශ්‍රී ලංකා එනර්ජීස් සමාගම විසින් අදාළ සම්ප්‍රේෂණ කටයුතු සඳහා වන මෙවලම් සැපයීම සහ මිනිස්බල සම්පත් සැපයීම සහ වර්තමානයේ පුනර්ජනනීය බලශක්ති සංවර්ධනය කෙරෙහි වූ දැක්මක් සහිතව කටයුතු කරනු ලබයි.

- **සී/ස.** LTL **හෝල්ඩිංග්ස් සමාගම**

"ලංකා ට්‍රාන්ස්ෆෝමර්ස් ලිමිටඩ්" ලෙස මින් පෙර හඳුන්වනු ලැබූ සීමාසහිත LTL හෝල්ඩින්ග්ස් (පුද්ගලික) සමාගම (LTLH) ලංකා විදුලිබල මණ්ඩලය (CEB) සහ තවත් ආයතන තුනක් අතරේ ක්‍රියාත්මක රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්වයකි. වත්මන් කොටස් හිමිකාරීත්ව ව්‍යුහයට අනුව, ඉන් 35%ක් ලංකා විදුලිබල මණ්ඩලය සතුව ද, 28%ක් සීමාසහිත වෙස්ට් කෝස්ට් පවර් සමාගම සතුව ද පවතින අතර, ඉතිරි 37%ක කොටස් LTL සමූහයේ සේවකයින් නියෝජනය කරන සමාගම් දෙකකට (02) අයත් වේ. පසුගිය දශක හතරක කාලයේදී සිය ආයතනික ගමන් මග තුළ ශක්තිමත්, යහපත් සහ ස්ථාවර වර්ධනයක් අත්කර ගනිමින් ශ්‍රී ලංකාවේ විදුලිබල අංශයේ ප්‍රමුඛතම ඉංජිනේරු සංවිධානයක් බවට පත් වීමට සමාගම සමත් වී ඇත. පාරිභෝගිකයා කේන්ද්‍ර කරගැනීම, නවෝත්පාදනයන් කෙරෙහි වූ බලවත් උනන්දුව, ගුණාත්මකභාවය, අවංකත්වය සහ අඛණ්ඩතාව කෙරෙහි දැඩි අවධානයක් යොමු කිරීම සිය හර වටිනාකම් බවට පත් කරගනිමින් සිටින සීමාසහිත LTL හෝල්ඩින්ග්ස් සමාගම "ඉංජිනේරු ශිල්පය සහ විද්‍යාව හරහා තිරසාර විසඳුම් නිර්මාණය කරමින් අපි ජීවිත සරු කරනු ලබන්නෙමු" යන අරමුණින් ක්‍රියාත්මක වේ.

- **ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව**

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථා පනතේ 1961 අංක 28 දරන නෛතික ප්‍රතිපාදන මත ඛනිජ තෙල් නිෂ්පාදන ආනයනය කිරීම, අපනයනය කිරීම, පිරිපහදු කිරීම, විකිණීම, සැපයීම හෝ බෙදාහැරීමට අදාළ ව්‍යාපාරික කටයුතු කර ගෙන යාම පිණිස ස්ථාපිත කර ඇත. මෙම සංස්ථාව ප්‍රධාන ඛනිජ තෙල් නිෂ්පාදන ආනයනකරුවා වන අතර දේශීයව අවශ්‍ය වන ඛනිජ තෙල් නිෂ්පාදන ඉල්ලුමෙන් 68% ක් පමණ ආනයනය කර බෙදාහැරීම සිදු කරයි. 1969 වර්ෂයේ සිට සංස්ථාවේ තනි අයිතිය යටතේ බොරතෙල් ආනයනය කර සපුගස්කන්ද පිරිපහදුවේ දේශීයව පිරිපහදු කර සැපයීම සිදු කරනු ලබන අතර එමඟින් දේශීය සමස්ථ ඛනිජ තෙල් ඉල්ලුමෙන් 32% ක් පමණ සැපයීම සිදු කරනු ලැබේ. තවද ගුවන් යානා ඉන්ධන එකම සැපයුම්කරු ලෙස ක්‍රියාකිරීම හා විදුලි ජනනය සඳහා ඉන්ධන ලබා දීම සිදු කරයි.

- **ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම**

1982 අංක 17 දරන සමාගම් පනත යටතේ ස්ථාපිත කරන ලද සමාගමකි. ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාවේ හා ලංකා ඉන්දියානු තෙල් සමාගමේ කොටස් හිමිකාරිත්වය සහිතය. සපුගස්කන්ද පිරිපහදුවේ සිට පිරවුම්හල් වෙත බෙදාහැරීම හා ඛනිජ තෙල් තොග ගබඩා පවත්වා ගෙන යාම සිදු කරයි.

- **ශ්‍රී ලංකා ඛනිජ තෙල් සංවර්ධන අධිකාරිය**

2021 අංක 21 දරන ඛනිජ තෙල් සම්පත් පනත යටතේ පිහිටුවන ලදි. ඛනිජ තෙල් ආශ්‍රිත සම්පත් ගවේෂණය හා සංවර්ධනය සඳහා බලයලත් ආයතනය වේ.

- **ට්‍රින්කෝ පෙට්‍රෝලියම් ටර්මිනල් පුද්ගලික සමාගම**

2007 අංක 07 දරන සමාගම් පනත යටතේ පිහිටුවන ලද අතර ත්‍රිකුණාමලයේ පිහිටි ඛනිජ තෙල් ගබඩා ටැංකි 61 ක් ආශ්‍රිත සංවර්ධන කටයුතු සිදු කිරීම මූලික කාර්යභාරය වේ.

1.7 විදේශ ආධාර ලබන ව්‍යාපෘති වල තොරතුරු

අංක	ව්‍යාපෘතියේ නම	ක්‍රියාකාරකම්	ආධාර දෙන ආයතනය	ඇස්තමේන්තු ගත පිරිවැය (රු. මි.)	ව්‍යාපෘති කාල සීමාව	ප්‍රගතිය
1.1	**ජනන ව්‍යාපෘති**					
1.1.1	මොරගොල්ල ජල විදුලි ව්‍යාපෘතිය	මෙ.වො. 30.5 මොරගොල්ල ජල විදුලි බලාගාරය ඉදි කිරීම	ආසියානු සංවර්ධන බැංකුව සහ ලංවිම	19,288	2014 ජූලි - 2025 දෙසැම්බර් 31	84.8%
1.1.2	උමා ඔය ජල විදුලි බලාගාරය	මෙ.වො. 120 උමා ඔය ජල විදුලි බලාගාරය ඉදි කිරීම	ශ්‍රී ලංකා රජය සහ විදේශ ආධාර (ඉරාන)	ඇ.ඩො.මි. 530	2010 මාර්තු - 2024 මාර්තු	100%
1.2	**සම්ප්‍රේෂණ ව්‍යාපෘති**					
1.2.1	**හරිත බලශක්ති සංවර්ධන සහ බලශක්ති කාර්යක්ෂමතාව නඟාසිටුවීමේ ආයෝජන ව්‍යාපෘතිය (අදියර 02)** **GPDEEIIP (අදියර 02)**					
1.2.2	පැකේජය 01 ලොට් B	නව පොල්පිටිය හම්බන්තොට කි.මී. 150ක කි.වෝ. 220 සම්ප්‍රේෂණ මාර්ගය ඉදි කිරීම	ආසියානු සංවර්ධන බැංකුව	6,014.19	2018 අගෝස්තු 08 – 2023 මාර්තු 18	100%
1.2.3	පැකේජය 2 ලොට් B2 - A	හොරණ පාදුක්ක කි.මී. 25ක කි.වෝ. 132 සම්ප්‍රේෂණ මාර්ගය ඉදි කිරීම.	ප්‍රංශ සංවර්ධන නියෝජිතායතය විසින් අරමුදල් සැපයේ / ආසියානු සංවර්ධන බැංකුව මගින් පරිපාලනය වේ	599.71	30, අප්‍රේල් 2020 - 2024 මාර්තු	100%
1.2.4	පැකේජය 2 ලොට් B2 - B	හබරණ වාලච්චේන කි.වෝ.132 සම්ප්‍රේෂණ මාර්ගයේ දෙවන පරිපථය සවිබල ගැන්වීම	ප්‍රංශ සංවර්ධන නියෝජිතායතය විසින් අරමුදල් සැපයේ / ආසියානු සංවර්ධන බැංකුව මගින් පරිපාලනය වේ	501.73	2019 නොවැම්බර් 28 - 2022 ජනවාරි 31	100%
1.2.5	පැකේජය 03 ලොට් A1	කොළඹ B ග්‍රිඩ් උපපොල ඉදි කිරීම කොළඹ C කොලොන්නාව ග්‍රිඩ් උපපොළ දක්වා කි.වෝ. 132 තනි ආදාන හා ප්‍රතිදාන සම්බන්ධතාව 800mm2 රැහැන් කොළඹ	ප්‍රංශ සංවර්ධන නියෝජිතායතනය	1,260.80	2019 ඔක්තෝබර් 15 - 2023 අගෝස්තු 15	100%

		C කොලොන්නාව ග්‍රිඩ් උපපොළ ආවර්ධනය				
1.2.6	පැකේජය 3 ලොට් A2: උප ලොට් 1 & උප ලොට් 2	කොටුගොඩ, කොලොන්නාව,හොරණ, පාදුක්ක ග්‍රිඩ් උපපොළ සංවර්ධනය	ආසියානු සංවර්ධන බැංකුව	2,308.42	2018 ඔක්තෝබර් 22 උප ලොට් 1 –2022 දෙසැම්බර් 31 උප ලොට් 2 - 2021 දෙසැම්බර් 31	100%
1.2.7	පැකේජය 3 ලොට් B	බියගම කි.වෝ. 220/33 ග්‍රිඩ් උපපොළ ඉදිකිරීම බියගම ග්‍රිඩ් උපපොළ සංවර්ධනය	ආසියානු සංවර්ධන බැංකුව	1568.77	2018 නොවැම්බර් 14- 2021 ජනවාරි 31	100%
1.2.8	පැකේජය 4 & පැකේජය 5	පැකේජය 4 (ප්‍ර. සං. නි.) - C කි.වෝ.33 බෙදාහැරීම් කුළුණු මාර්ග සහ ගැන්ට්‍රි ඉදිකිරීම - පැරණි අනුරාධපුර ග්‍රිඩ් උපපොළ සිට මහඉලුප්පල්ලම ගැන්ට්‍රිය දක්වා කි.මී.22, කි.වෝ.33 D/C Lynx මාර්ගය සහ මහඉලුප්පල්ලම හි ද්වි අංශ තනි බස් බාර් ගැන්ට්‍රි මාර්ගය. - ඇත්ගාල ගැන්ට්‍රියේ සිට ස්ටෝර්ෆීල්ඩ් ගැන්ට්‍රිය දක්වා කි.මී.4, කි.වෝ.33 D/C Lynx මාර්ගය සහ ඇත්ගාල හි ද්වි අංශ තනි බස්බාර් ගැන්ට්‍රිය - කප්පල්තුරෙයි ග්‍රිඩ් උපපොළේ සිට චීන වරාය ගැන්ට්‍රිය දක්වා කි.මී.8, කි.වෝ.33 4 cct Lynx මාර්ගය සහ චීන වරාය හි ද්වි අංශ ද්විත්ව බස් බාර් ගැන්ට්‍රිය - ඇඹිලිපිටිය ග්‍රිඩ් උපපොළ සිට වෙනිවැලඅාර දක්වා කි.මී.10.5, කි.වෝ.33 D/C Lynx මාර්ගය සහ සූරියවැව හි ද්වී අංශ තනි බස් බාර් ගැන්ට්‍රිය පැකේජය 5 (ආ.සං.බැ.) - මතුගම ග්‍රිඩ් උපපොළ සිට බෙන්තොට PSS දක්වා කි.මී.11.5,කි.වෝ.33 Lynx රැහැන් මාර්ගය	ආසියානු සංවර්ධන බැංකුව (ණය) ප්‍රංශ සංවර්ධන නියෝජිතායතනය (ණය)	5,342.00	2018 ජනවාරි – 2023 මැයි	100%

1.2.9	පැකේජය 8: ලොට් B	අම්බලන්ගොඩ කි.වෝ. 132/33 ග්‍රිඩ් උපපොළ ආවර්ධනය, පන්නල කි.වෝ. 132/33 ජාල උපපොළ ආවර්ධනය සහ කි.වෝ.132/33 31.5 MVA අමතර ට්‍රාන්ස්පොමර් 02 සැපයීම.	ආසියානු සංවර්ධන බැංකුව	1,739.59	2022 ජූලි 11 - 2024 ජූනි 30	100%
1.2.10	පැකේජය 9	කෙරවලපිටිය කි.වෝ. 220 වහරු අංගනය ඉදි කිරීම	ආසියානු සංවර්ධන බැංකුව	2,918.70	2020 අගෝස්තු 14 - 2024 මැයි 31	100%
1.3	**මහ කොළඹ සම්ප්‍රේෂණ හා බෙදාහැරීම් හානි අවමකරණ ව්‍යාපෘතිය**					
1.3.1	කෙරවලපිටිය වහරු අංගනයේ සිට කොළඹ L දක්වා කි.වෝ. 200 දෙවන භූගත කේබලය ඉදිකිරීම	කෙරවලපිටිය වහරු අංගනයේ සිට කොළඹ L දක්වා කි.වෝ. 200 දෙවන භූගත කේබලය ඉදිකිරීම	ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව	9,119.00	2020 ජනවාරි - 2026 සැප්තැම්බර්	11.50%
1.3.2	කොළඹ නාගරික සම්ප්‍රේෂණ ජාල සංවර්ධන ව්‍යාපෘතිය අදියර 2	කොළඹ නාගරික සම්ප්‍රේෂණ ජාලය ඉදිකිරීම	ආසියානු සංවර්ධන බැංකුව	30,295.00	2022 ජනවාරි - 2027 දෙසැම්බර්	Completion of procurement process
1.4	**විදුලිබල සැපයුම් විශ්වසනීයත්වය වැඩිදියුණු කිරීම සඳහා සහය වීමේ ව්‍යාපෘතිය (SESRIP)**					
1.4.1	පැකේජය 4 සහ පැකේජය 5 : ග්‍රාමීය විදුලිබල සැපයුම් ජාලය සඳහා ද්‍රව්‍ය සැපයීම සහ බෙදා හැරීම පුළුල් කිරීම සහ බෙදාහැරීමේ කාර්ය සාධනය නිරීක්ෂණය කිරීම	කි.මී. 300 දිගින් යුතු කි.වෝ.33 කුළුණු මාර්ග සහ කි.වෝ. 33 සම්බන්ධන ගැන්ට්‍රි (switching gantries)13ක් ඉදිකිරීම දිවයින පුරා	ආසියානු සංවර්ධන බැංකුව සහ ශ්‍රී ලංකා රජය සහ ලංවිම (ණය)	7,314.052	2019 - 2025 මාර්තු 31	73.82%
1.4.2	පැකේජය 7: ලොට් A1 පන්නිපිටිය ග්‍රිඩ් උපපොලේ 100 Mvar BSC ඉදි කිරීම.	ලොට් 1: බෙදාහැරීමේ මීටර සහ මොඩම ලොට් 2: ධාරා තාරාපැවි ලොට් 3: ධාරිත්‍රක බැංකු බණ්ඩක හා ස්වයංක්‍රීය ප්‍රතිවැසුම් ලොට් 4: වානේ මනු ආවරණ	ආසියානු සංවර්ධන බැංකුව සහ ශ්‍රී ලංකා රජය සහ ලංවිම (ණය)	1646.71	2019 අගෝස්තු 1 - 2024 දෙසැම්බර් 21	100%

		ලොට් 5: කි.වෝ.33 ඒරියල් පොකුරු සන්නායක (ABC) සහ උපාංග				
1.4.3	පැකේජය 7: ලොට් A 2	බියගම ග්‍රිඩ් උපපොළේ ස්ථිතික Var පද්ධති (SVS) ස්ථාපනය කිරීම.	ආසියානු සංවර්ධන බැංකුව	1103.50	2020 ඔක්තෝබර් 07 - 2024 අප්‍රේල් 08	100%
1.5	**හබරණ වේයන්ගොඩ කි.වෝ. 220 සම්ප්‍රේෂණ මාර්ගය**					
1.5.1	හබරණ වේයන්ගොඩ කි.වෝ. 220 සම්ප්‍රේෂණ මාර්ගය	හබරණ වේයන්ගොඩ කි.වෝ. 220 සම්ප්‍රේෂණ මාර්ගය ඉදිකිරීම	ජපාන ජාත්‍යන්තර සහයෝගීතා නියෝජිතායතය / ශ්‍රී ලංකා රජය	1756.34	2020 ඔක්තෝබර් 07 - 2024 මැයි 31	100%
1.5.2	හබරණ වේයන්ගොඩ කි.වෝ. 220 සම්ප්‍රේෂණ මාර්ගය	ලොට් A: නව හබරණ කි.වෝ. 220/132/33 වහරු අංගනය ඉදිකිරීම වේයන්ගොඩ, නව හබරණ, වාලච්චේන, කොත්මලේ, අනුරාධපුර	ජපාන ජාත්‍යන්තර සහයෝගීතා නියෝජිතායතය	5,847.00	2018 පෙබරවාරි 2020 පෙබරවාරි	100%
		ලොට් B: නව හබරණ වේයන්ගොඩ කි.වෝ.220 සම්ප්‍රේෂණ මාර්ගය (ජ.ජා.ස.ආ.)		10,155.00	2017 මැයි - 2019 නොවැම්බර්	100%
1.6	**ජාතික සම්ප්‍රේෂණ හා බෙදාහැරීම් ජාල සංවර්ධන ව්‍යාපෘතිය (NTDND & EIP)**					
1.6.1	පැකේජය 1	කි.වෝ. 400, කි.වෝ. 220,සහ කි.වෝ. 132 සම්ප්‍රේෂණ මාර්ග ඉදිකිරීම- ගම්පහ,කොළඹ, කුරුණෑගල	ජපාන ජාත්‍යන්තර සහයෝගීතා නියෝජිතායතය සහ ශ්‍රී ලංකා රජය	14,623.00	2020 ජනවාරි - 2025 දෙසැම්බර්	60%
1.6.2	පැකේජය 2	ග්‍රිඩ් උපපොළ ඉදි කිරීම.- ගම්පහ,කොළඹ , මහනුවර,කෑගල්ල		8,531.00	2019 මාර්තු - 2025 දෙසැම්බර්	71%
1.6.3	පැකේජය 3	කි.වෝ.220 සහ කි.වෝ.132 සම්ප්‍රේෂණ මාර්ග, නව පොල්පිටියේ සිට කොත්මලේ වහරු අංගනය දක්වා (කි.මී. 24), කි.වෝ. 220/132 සම්ප්‍රේෂණ මාර්ග ඉදිකිරීම අනුරාධපුර, මාතලේ, මහනුවර, කෑගල්ල, නුවරඑළිය		11,253.00	2019 අගෝස්තු - 2026 දෙසැම්බර්-	59%
1.6.4	පැකේජය 4	දෙහිවල, ගල්කිස්ස සහ බත්තරමුල්ල කොළඹ කි.වෝ.11 භූගත කේබල් පද්ධතියක් ඉදිකිරීම		7,183.00	2020 සැප්තැම්බර් - 2026 දෙසැම්බර්	42%

1.6.5	හම්බන්තොට ග්‍රිඩ් උපපොළේ බැටරි බලශක්ති ගබඩා පද්ධතියක් ස්ථාපනය කිරීම	හම්බන්තොට ග්‍රිඩ් උපපොළේ බැටරි බලශක්ති ගබඩා පද්ධතියක් ස්ථාපනය කිරීම.	කොරියානු රජය	4,419.00	2023 ජනවාරි - 2025 දෙසැම්බර් 31	39%
1.7	**විදුලිබල පද්ධතියේ විශ්වසනීයත්වය සවිබලගැන්වීමේ ව්‍යාපෘතිය (PSRSP)**					
1.7.1	පැකේජය 1A	නිම කොට භාරදීමේ පදනම (Turnkey Basis) මත වායු පරිවරණය කරන ලද ස්විච් ගියර් තාක්ෂණයෙන් යුත් ග්‍රිඩ් උපපොළවල් (GIS Grid Substations) ප්‍රසම්පාදනය කිරීම: 1. මීරිගම කි.වෝ. 220/33 ග්‍රිඩ් උපපොළ (2×63 MVA) 2. පෑලියගොඩ කි.වෝ. 132/33 ග්‍රිඩ් උපපොළ (2×45 MVA) ඉදිකිරීම (නව හබරණ,වේයන්ගොඩ,කැලණිය,කොටුගොඩ ග්‍රිඩ් උපපොළ නවීකරණයකිරීම් ඇතුළුව)	ආසියානු සංවර්ධන බැංකුව	16,408.00	2025 දෙසැම්බර්- 2027 නොවැම්බර්	ආසියානු සංවර්ධන බැංකුව සමඟ ණය කටයුතු අවසන් කර ඇති අතර තාක්ෂණික ඇගයීම් කමිටුවක් පත් කර ඇත
1.7.2	පැකේජය 1B	නිම කොට භාරදීමේ පදනම මත කි.වෝ.132 වායු පරිවරණය කරන ලද ස්විච් ගියර් තාක්ෂණයෙන් යුත් (AIS) බාහිර ග්‍රිඩ් උපපොළවල් ප්‍රසම්පාදනය කිරීම 1. හෝමාගම කි.වෝ. 132/33 ග්‍රිඩ් උපපොළ (2×45 MVA) 2. මීගමුව කි.වෝ. 132/33 ග්‍රිඩ් උපපොළ (2×63 MVA) ඉදිකිරීම (හොරණ, පාදුක්ක, බෝලවත්ත, නව හලාවත, කටුනායක ග්‍රිඩ් උපපොළ නවීකරණය කිරීම් ඇතුළුව)	ආසියානු සංවර්ධන බැංකුව	10,021.00	2025 දෙසැම්බර්- 2027 නොවැම්බර්	ආසියානු සංවර්ධන බැංකුව සමඟ ණය කටයුතු අවසන් කර ඇති අතර තාක්ෂණික ඇගයීම් කමිටුවක් පත් කර ඇත
1.7.3	පැකේජය 2	නිම කොට භාරදීමේ පදනම මත කුළුණු මතින් දිවෙන විදුලි රැහැන් මාර්ග (overhead transmission	ආසියානු සංවර්ධන බැංකුව	10,025.00	2025 දෙසැම්බර්- 2027 නොවැම්බර්	ආසියානු සංවර්ධන බැංකුව සමඟ ණය ගිවිසුම අත්සන් තබන ලදී.

		lines) ප්‍රසම්පාදනය කිරීම: 1. හම්බන්තොටමාතර කි.වෝ. 132 බෙදාහැරීම් පරිපථ (DC) සම්ප්‍රේෂණ මාර්ගය (කි.මී. 78), 2. හොරණ පාදුක්ක DC සම්ප්‍රේෂණ මාර්ගයේ සිට හෝමාගම ජාල උපපොළ දක්වා කි.වෝ. 132 තනි පරිපථ ආදානප්‍රතිදාන රැහැන් සම්බන්ධතා (SC LILOs) (කි.මී.7.7) 3. අම්බලන්ගොඩ ගාල්ල DC සම්ප්‍රේෂණ මාර්ගයේ සිට බද්දේගම ග්‍රිඩ් උපපොළ දක්වා කි.වෝ.132 තනි පරිපථ ආදානප්‍රතිදාන රැහැන් සම්බන්ධතා (SC LILO) (කි.මී 0.5) 4. නව හබරණවේයන්ගොඩ සම්ප්‍රේෂණ මාර්ගයේ සිට මීරිගම ග්‍රිඩ් උපපොළ දක්වා කි.වෝ. 220 බෙදාහැරීම් පරිපථ ආදානප්‍රතිදාන රැහැන් සම්බන්ධතාව (DC LILO) (කි.මී.1)				තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් සමාලෝචනය කරන ලද ලංසු ලේඛනය ආසියානු සංවර්ධන බැංකුවේ එකඟතාව ලබා ගැනීම සඳහා යොමු කර ඇත
		5. බෝලවත්ත කොටුගොඩ සම්ප්‍රේෂණ මාර්ගයේ සිට මීගමුව ග්‍රිඩ් උපපොළ දක්වා කි.වෝ.132 තනි පරිපථ ආදානප්‍රතිදාන රැහැන් සම්බන්ධතාව (SC LILO) (කි.මී. 0.5) ඉදිකිරීම				

1.7.4	පැකේජය 3	නිමකොට භාරදීමේ පදනම මත කි.වෝ.132 ග්‍රිඩ් උපපොළවල් ප්‍රසම්පාදනය කිරීම: 1. බද්දේගම කි.වෝ. 132/33 ග්‍රිඩ් උපපොළ (2 × 45 MVA) ඉදිකිරීම 2. කලවාන කි.වෝ. 132/33 ග්‍රිඩ් උපපොළ (2×31.5 MVA) ඉදිකිරීම 3. මාතර ග්‍රිඩ් උපපොළ (කි.වෝ. 33 GIS, 2× කි.වෝ.132 තනි බස්බාර් විදුලි රැහැන් බහනු) ආවර්ධනය 4. හම්බන්තොට ග්‍රිඩ් උපපොළ (2× කි.වෝ.132 ද්විත්ව බස්බාර් විදුලි රැහැන් බහනු) ආවර්ධනය කිරීම. 5. කුකුලේ විදුලිබල අංගනය (2× කි.වෝ.132 ද්විත්ව බස්බාර් විදුලි රැහැන් බහනු) ආවර්ධනය කිරීම.	ආසියානු සංවර්ධන බැංකුව	10,060.00	2025 දෙසැම්බර්-2027 නොවැම්බර්	ආසියානු සංවර්ධන බැංකුව සමඟ ණය ගිවිසුම අත්සන් තබන ලදී.
1.7.5	පැකේජය 4	නිමකොට භාරදීමේ පදනම මත කි.වෝ. 132 භූගත කේබල් සම්ප්‍රේෂණ මාර්ග ප්‍රසම්පාදනය කිරීම: කැලණියකොටුගොඩ බෙදාහැරීම් පරිපථ (DC) සම්ප්‍රේෂණ මාර්ගයේ සිට පෑලියගොඩ ග්‍රිඩ් උපපොළ දක්වා තනි පරිපථ (SC) ආදානප්‍රතිදාන රැහැන් සම්බන්ධතාව සහිතව භූගත කේබලයක් ඉදිකිරීම (කි.මී.2)	ආසියානු සංවර්ධන බැංකුව	3,567.00	2025 දෙසැම්බර්-2027 නොවැම්බර්	ආසියානු සංවර්ධන බැංකුව සමඟ ණය කටයුතු සිදුවේ
1.8	පැකේජය 4A - නව හබරණ නව අනුරාධපුර කි.වෝ.220 සම්ප්‍රේෂණ රැහැන ඉදිකිරීම					
1.8.1	පැකේජය 4A 6i)	ආසියානු සංවර්ධන බැංකුවේ ණය 3483- SRI සහ 3585- SRI හි 4, 6, 10 සහ 12 පැකේජ යටතේ "සම්ප්‍රේෂණ ජාල අවශ්‍යතා සඳහා අමතර කොටස් සහ මෙවලම්" ලෙස ද්‍රව්‍ය ප්‍රසම්පාදනය කිරීම.	ආසියානු සංවර්ධන බැංකු ණයෙහි ඉතිරි මුදල	2,140.00	2023 ඔක්තෝබර්	97%
1.8.2	පැකේජය 4A 6ii)	නව හබරණ නව අනුරාධපුර කි.වෝ.220 සම්ප්‍රේෂණ රැහැන ඉදිකිරීම සඳහා සිවිල් වැඩ, කුළුණු ඉදිකිරීම සහ රැහැන් එළීමේ කටයුතු සහ දැනට පවතින පැරණි හබරණ නව අනුරාධපුර කි.වෝ. 132 සම්ප්‍රේෂණ රැහැන ඉවත් කිරීම	ලංවිම අරමුදල්	1,695.00	2024 නොවැම්බර් - 2026 මැයි	-

1.8.3	ආගමික ස්ථාන සඳහා වහල මත සවිකරන සූර්ය බලශක්ති පහසුකම් ස්ථාපනය කිරීමේ සූර්ය බලශක්ති ව්‍යාපෘතිය	ආගමික ස්ථාන සඳහා වහල මත සවිකරන සූර්ය බලශක්ති පහසුකම් ස්ථාපනය කිරීම.	ඉන්දීය රාජ්‍ය බැංකු ණය පහසුකම	5353.05	2024 ජනවාරි 01 - 2024 දෙසැම්බර් 31	75%
1.8.4	ශ්‍රී ලංකාවේ ඩෙල්ෆ්ට්, අනලතිව්, නයිනතිව් යන කුඩා දූපත්වල දෙමුහුන් පුනර්ජනනීය බලශක්ති පද්ධති ඉදිකිරීම (ඉන්දියාව)	ඩෙල්ෆ්ට්, අනලතිව්, නයිනතිව්	ඉන්දීය ආධාර	ඇ.ඩො.මි. 11.3	2024 ජනවාරි 01 - 2025 මැයි 31	35%

02 වන පරිච්ඡේදය
ප්‍රගතිය හා ඉදිරි දැක්ම

02 වන පරිච්ඡේදය
ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2.1 2024 වර්ෂය තුළ විදුලිබල අංශයේ කාර්යසාධනය

2.1.1 විදුලිබල ක්ෂේත්‍රය සම්පිණ්ඩනයක් ලෙසින්

- 2024 දී මුළු විදුලි පාරිභෝගිකයින් සංඛ්‍යාව = 7,717,673

වගුව 2.1.1
පාරිභෝගික සංඛ්‍යාව - 2024

	කාණ්ඩය	ලංවිම (CEB)	ලංවිපුස (LECO)	එකතුව
1	ගෘහස්ථ	6,080,699	515,975	6,596,674
2	ආගමික ස්ථාන	44,215	2,731	46,946
3	කර්මාන්ත	71,945	3,522	75,467
4	පොදු අවශ්‍යතා	877,776	104,139	981,915
5	හෝටල්	776	88	864
6	රාජ්‍ය ආයතන	9,285	420	9,705
7	කෘෂි කාර්මික	4,061		4,061
8	වීදි ආලෝකකරණය	-	2,041	2,041
	එකතුව	**7,088,757**	**628,916**	**7,717,673**

- 2024 වසරේ ශුද්ධ විදුලි උත්පාදනය -ගි.වොපැය 17,364
- 2024 වසරේ ස්ථාපිත මුළු විදුලි උත්පාදන ධාරිතාව මෙ.වො. 6,048.37
- ස්ථාපිත මුළු විදුලි උත්පාදන ධාරිතා මිශ්‍රණයෙහි සංයුතිය

වගුව 2.1.2
විදුලි උත්පාදන මිශ්‍රණය - 2024

	නිශ්පාදන ක්‍රමය	ධාරිතාව මෙ.වො.
01	සා.නො.පු.බ. (වෙනත්) - ස්.ඛ.නි.	54.07
02	මහා පරිමාණ ජල විදුලි - ලංවිම	1,533.38
03	සා.නො.පු.බ.(කුඩා ජල විදුලි) - ස්.ඛ.නි.	432.02
04	සා.නො.පු.බ. (විදුලි පද්ධතිය වෙත සම්බන්ධිත සූර්ය බලශක්තිය) - ස්.ඛ.නි.	163.36
05	සා.නො.පු.බ. (වහල මත සූර්ය පැනල-) – ස්.ඛ.නි. (ඇස්තමේන්තුගත)	1,415.59
06	සා.නො.පු.බ. (සුළං) - ස්.ඛ.නි.	163.45
07	සා.නො.පු.බ. (සුළං) -ලංවිම	103.50
08	තාප (තෙල්) -ලංවිම	801.00
09	තාප (තෙල්) - ස්.ඛ.නි.	482.00
10	තාප (ගල් අඟුරු) - ලංවිම	900.00
	මුළු එකතුව	**6,048.37**

ස්.ඛ.නි. (IPP)- ස්වාධීන බලශක්ති නිෂ්පාදකයින්
සා.නො.පු.බ. (NCRE) – සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්තිය

2.1.2 විදුලි ජනනය


2024 සඳහා මුළු වාර්ෂික විදුලි උත්පාදනය ගි.වොෑ.පැය 17,364 (ශුද්ධ) වූ අතර එය පසුගිය වසරේ ගි.වොෑ.පැය 15,588 ක අගයට වඩා 8.90%ක වර්ධනයක් පෙන්නුම් කර ඇත. මෙම උත්පාදනයෙන් 55%ක් පමණ 2024 දී ආවරණය කර ඇත්තේ පුනර්ජනනීය බලශක්ති සම්පත් මගිනි.
2024 වසරේදී ශුද්ධ විදුලි උත්පාදනයට එක් එක් ප්‍රභවයන් විසින් ලබා දුන් දායකත්වයේ ප්‍රතිශතයන් පහත දැක්වෙන වගුවේ සඳහන් කර ඇත.

වගුව 2.1.3
විදුලි උත්පාදනය -2024

	ප්‍රභවය	ප්‍රතිශතය
01	ජල විදුලි (ලං.වි.ම)	31.25%
02	කුඩා ජල විදුලි (ස්.බ.නි.)	8.48%
03	සුළං (ලං.වි.ම)	2.20%
04	සුළං (ස්.බ.නි.)	2.35%
05	වහල මත සූර්ය පැනල- (ස්.බ.නි.) - ඇස්තමේන්තුගත	8.24%
06	විදුලි පද්ධතිය වෙත සම්බන්ධිත සූර්ය බලශක්තිය - (ස්.බ.නි.)	1.47%
07	තාප (ලං.වි.ම)	9.02%
08	තාප (ස්.බ.නි.)	4.43%
09	ගල් අඟුරු (ලං.වි.ම)	31.56%
10	සා.නොෑ.පු.බ. වෙනත්	1.00%
	මුළු එකතුව	100.00%

මූලාශ්‍රය ලංවිම,ලංවිපුස,සු.බ.අ.

ප්‍රස්තාරය -2.1.1
ශුද්ධ විදුලි උත්පාදනය -2024



ශුද්ධ විදුලි උත්පාදනය (2024)

මූලාශ්‍රය ප්‍රගති වාර්තාව 2024- ලංවිම

2.1.3 ජාතික විදුලිබල ජාලයේ ස්ථාපිත ධාරිතාවය


2024 අවසන් වන විට සමස්ත ස්ථාපිත ධාරිතාව මෙ.වො. 6,048ක් වූ අතර, ජාතික විදුලිබල ජාලයෙන් 64%ක් පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන්ගෙන් සමන්විත විය.

වගුව 2.1.4
උත්පාදන මූලාශ්‍රය අනුව ස්ථාපිත විදුලි ධාරිතාවය

	බලශක්ති මූලාශ්‍රය		ස්ථාපිත ධාරිතාවය (මෙ.වො)	බලාගාර සංඛ්‍යාව
1	තාප	බනිජ තෙල් (ලං.වි.ම)	801	9
2		බනිජ තෙල් (ස්.බ.නි.)	482	1
3		ගල් අඟුරු	900	1
4	පුනර්ජනනීය බලශක්ති	ප්‍රධාන ජල විදුලි (ලං.වි.ම)	1,533	19
5		කුඩා ජල විදුලි (ස්.බ.නි.)	432	211
6		සුළං (ලං.වි.ම)	104	18
		සුළං (ස්.බ.නි.)	163	
7		භූමිය මත ස්ථාපිත සුර්ය පැනල (ස්.බ.නි.)	164	86
8		වහල මත සුර්ය පැනල (ස්.බ.නි.)	1,415	-
9		ජෛව ස්කන්ධ (ස්.බ.නි.)	54	14
	මුළු ධාරිතාව		**6,048**	**359**

මූලාශ්‍රය ලංවිම සවිස්තර විදුලිබල උත්පාදන මිශ්‍රණය - 2024

ප්‍රස්තාරය -2.1.2
ස්ථාපිත ධාරිතාව -2024



2.1.4 ජල විදුලි උත්පාදන පුළුල් කිරීමේ ව්‍යාපෘති

කොත්මලේ, උකුවෙල, වික්ටෝරියා සහ රන්දෙණිගල යන බලාගාරයන්හි මෙහෙයුම් තත්ත්වයන්, කාර්යක්ෂමතාව, ධාරිතාවන්, උත්පාදන සහ මෙහෙයුම් ආයු කාලය වැඩි දියුණු කිරීම පිණිස ධාරිතාව සහ විශ්වසනීයත්වය ඉහළ නැංවීමේ ව්‍යාපෘති ක්‍රියාවට නංවන ලදී.

මොරගොල්ල ජල විදුලි ව්‍යාපෘතිය සහ ද්‍රවීකෘත ස්වාභාවික වායු බලාගාර ව්‍යාපෘතිය වැනි නව උත්පාදන ධාරිතා පුළුල් කිරීමේ ව්‍යාපෘතිවල ඉදිකිරීම් කටයුතු 2024 වසර පුරාවට අඛණ්ඩව සිදු කර ගෙන ලදී. 2024 දී උමා ඔය ජල විදුලි බලාගාරය විවෘත කිරීමත් සහ 2025 දී මොරගොල්ල ජල විදුලි බලාගාරය මෙහෙවරෙහි යෙදවීමට අපේක්ෂා කිරීමත් සමඟින් මෙරට අවසන් ප්‍රධාන ජල විදුලි බලාගාර ව්‍යාපෘති ද්විත්වයෙහි මෙහෙයුම් ක්‍රියාත්මක කිරීම ආරම්භ කළ පසුව, 2025 වසරේදී අප මාතෘ භූමිය ඉතා වැදගත් සන්ධිස්ථානයක් පසු කරනු ඇති බව අපේක්ෂාවයි. 2024 දී මෙරට පළමු පාවෙන සූර්ය බලාගාර දෙක නියමු පරිමාණයෙන් බල ගැන්වීම ද සිදු කරනු ලැබීය.

වගුව 2.1.5
ජනන ව්‍යාපෘති වල ප්‍රගතිය

අං.	ව්‍යාපෘතිය/වැඩසටහන	ප්‍රගතිය	කටයුතු සම්පූර්ණ කිරීමට අපේක්ෂිත දිනය
1	මෙ.වො. 31 මොරගොල්ල ජල විදුලි බලාගාරය	ඉදිකිරීම් කටයුතු අවසන් අදියරෙහි ඇත.	2025 අවසන් කාර්තුව
2	කෙරවළපිටිය මෙ.වො. 350 සොබාදනවි ස්වභාවික වායු සංයුක්ත චක්‍රීය බලාගාරය	ඉදිකිරීම් කටයුතු අවසන් අදියරෙහි ඇත.	වායු ටර්බයිනය 2024 අගෝස්තු මස මෙහෙවරෙහි යොදවන ලදි. වාෂ්ප ටර්බයිනය 2025 වසරේදී මෙහෙවරෙහි යෙදවීමට නියමිතය
3	කොළොන්නාව මෙ.වො. 100 /100 මෙ.වො. පැ. බැටරි ගබඩාකරණ පද්ධතිය	අරමුදල් සම්පාදනය නහවුරු වී ඇත. යෝජනා ඉල්ලුම් ලේඛන සැකසුම් කටයුතු ආරම්භ කිරීමට නියමිතය.	2026
4	කෙරවළපිටිය මෙ.වො. 350 සහස්දනවි ස්වභාවික වායු සංයුක්ත චක්‍රීය බලාගාරය	විදුලිය මිලදී ගැනීමේ ගිවිසුම් ආශ්‍රිත සාකච්ඡා කටයුතු සිදු වෙමින් පවතී	විවෘත චක්‍රීය 2026 සංයුක්ත චක්‍රීය 2027
5	මෙ.වො. 200 ස්වභාවික වායු අභ්‍යන්තර දහන ඇන්ජින් විදුලි බලාගාරය	අමාත්‍ය මණ්ඩලය විසින් පත්කරන ලද සාකච්ඡා කමිටුව සහ ප්‍රසම්පාදන කමිටුව පත්කොට ඇත.	2028
6	කැළණිතිස්ස මෙ.වො. 130 වායු ටර්බයිනය	ප්‍රසම්පාදන කටයුතු තාවකාලිකව නවතා ඇත	2030

ප්‍රගති වාර්තාව 2024- ලංවිම

2.1.5 විදුලි උත්පාදන ව්‍යාපෘති

විදුලිබල පද්ධතිය වෙත මෙ.වො. 157ක ධාරිතාවක් එක් කරනු ලබමින් කැලණිතිස්ස හි දෙවන සංයුක්ත චක්‍රීය බලාගාරය මෙම වසර තුළ මෙහෙවරෙහි යෙදවීම සිදු කෙරිණි.

තාප උත්පාදන ක්ෂේත්‍රය සම්බන්ධයෙන් ගත් විට, ද්‍රවීකෘත ස්වභාවික වායු (LNG) යටිතල පහසුකම් නිම කිරීමෙන් පසු ප්‍රධාන ඉන්ධන ප්‍රභවය වශයෙන් ස්වභාවික වායුව උපයෝගී කරගනිමින් ක්‍රියාත්මක කිරීමට නියමිත යැයි සැලකෙන කෙරවලපිටිය විදුලි බලාගාරය මෙහෙවරෙහි යෙදවීමට කටයුතු කිරීම පුනර්ජනනීය බලශක්ති ක්ෂේත්‍රයට අදාළව සපුරාගත් ජයග්‍රහණයකි.

පහත සඳහන් උත්පාදන ව්‍යාපෘති දැනට ක්‍රියාත්මක කෙරෙමින් පවතී:

2.1.6 සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්තිය (NCRE) සඳහා ප්‍රවේශය වැඩි දියුණු කිරීම

සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති සම්පත් වැඩිදියුණු කිරීමේ කටයුතු ප්‍රවර්ධනය කිරීම සඳහා අමාත්‍යාංශය විසින් ප්‍රමුඛතාව ලබා දී ඇත.

මේ වනවිට ක්‍රියාත්මක කෙරෙමින් පවතින සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති සංවර්ධන කටයුතුවල ප්‍රගතිය පහත දක්වා ඇත.

වගුව 2.1.6
මහා පරිමාණ ව්‍යාපෘති

අංකය	ව්‍යාපෘතිය/ වැඩසටහන	ප්‍රගතිය	කටයුතු අවසන් කිරීමට අපේක්ෂිත දිනය
1	සියඹලාණ්ඩුව මෙ.වො. 100 සූර්ය විදුලි ව්‍යාපෘතිය	විදුලිය මිලදී ගැනීමේ ගිවිසුම, සම්ප්‍රේෂණ ගිවිසුම හා ක්‍රියාත්මක කිරීමේ ගිවිසුම අත්සන් කොට ඇත.	2025 අවසන් කාර්තුව
		සම්ප්‍රේෂණ මාර්ග ඉදිකිරීම් සිදු කෙරෙමින් පවතී.	
2	මන්නාරම මෙ.වො. 250 සුළං විදුලි ව්‍යාපෘතිය	විදුලි බලාගාරය ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව පිරිනැමීම සඳහා වන අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇත. පිරිනැමීම සඳහා ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ අනුමැතිය ලැබීමට අපේක්ෂිතය. නීතිපති නිෂ්කාශනය ලැබීමට නියමිතය.	2027 දෙවන කාර්තුව
3	පූනරින් මෙ.වො. 234 සුළං විදුලි ව්‍යාපෘතිය	විදුලි බලාගාරය ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව පිරිනැමීම සඳහා වන අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇත. පිරිනැමීම සඳහා ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ අනුමැතිය ලැබීමට අපේක්ෂිතය. නීතිපති නිෂ්කාශනය ලැබීමට නියමිතය.	2027 දෙවන කාර්තුව
		සම්ප්‍රේෂණ පහසුකමට අදාළ විදුලිය මිලදී ගැනීමේ ගිවිසුමට අදාළ සාකච්ඡා සහ මිල සාකච්ඡා සිදු කෙරෙමින් පවතී.	
4	සාම්පූර් මෙ.වො. 50 සූර්ය විදුලි ව්‍යාපෘතිය	ප්‍රසම්පාදන කමිටුව / අමාත්‍ය මණ්ඩලය විසින් පත්කරන ලද සාකච්ඡා කමිටුව විසින් සංවර්ධක යෝජනාව අගයමින් පවතී.	2026 අවසන් කාර්තුව
5	මන්නාරම මෙ.වො. 50 සුළං විදුලි ව්‍යාපෘතිය	කොන්ත්‍රාත්තුව පිරිනමා ඇත.	2026 අවසන් කාර්තුව

වගුව 2.1.7
ප්‍රසම්පාදන මට්ටමේ ඇති ව්‍යාපෘති

අං.	ව්‍යාපෘතිය/ වැඩසටහන	බලාගාර සංඛ්‍යාව	මුළු ධාරිත්‍රාවය (මෙ.වො.)	ප්‍රගතිය	කටයුතු අවසන් වනු ඇතැයි අපේක්ෂිත දිනය		
					2024	2025	2026
1	මෙ.වො. 90x 1 සූර්ය පැනල විදුලි බලාගාර ටෙන්ඩරය	50	50	මෙහෙවරෙහි යොදවන ලද මෙ.වො. 1 x 45 බලාගාර ඉදි කෙරෙමින් පවත්නා මෙ.වො. 1 x 5 බලාගාර		5	
2	මෙ.වො. 10 පොළොන්නරුව සූර්ය පැනල විදුලි බලාගාර ටෙන්ඩරය	1	10	මෙහෙවරෙහි යොදවන ලදි	10		
3	මෙ.වො. 30 බිම නංවන ලද / පාවෙන සූර්ය පැනල විදුලි බලාගාර ටෙන්ඩරය (මෙ.වො. 1-5)	2	5	විදුලිය මිලදී ගැනීමේ ගිවිසුම් අත්සන් කරන ලදුව, ඉදි කෙරෙමින් පවතී		5	

	මෙ.වො. 30 බිම නංවන ලද / පාවෙන සූර්ය පැනල විදුලි බලාගාර ටෙන්ඩරය (මෙ.වො. 1-5) ප්‍රතිටෙන්ඩර් කළ	9	27	අභිප්‍රාය ලිපි අත්සන් කොට ඇත, විදුලිය මිලදී ගැනීමේ ගිවිසුම අත්සන් කිරීමට නියමිතය			27
4	මෙ.වො. 40 බිම නංවන ලද / පාවෙන සූර්ය පැනල විදුලි බලාගාර ටෙන්ඩරය (මෙ.වො. 5 පරිමාණයෙන්)	8	40	අභිප්‍රාය ලිපි අත්සන් කොට ඇත, විදුලිය මිලදී ගැනීමේ ගිවිසුම අත්සන් කිරීමට නියමිතය		30	10
5	මන්නාරම මෙ.වො. 20 සුළං විදුලි බලාගාර ටෙන්ඩරය (මෙ.වො. 2.5-10 පරිමාණයෙන්)	4	20	අභිප්‍රාය ලිපි අත්සන් කොට ඇත, විදුලිය මිලදී ගැනීමේ ගිවිසුම අත්සන් කිරීමට නියමිතය		20	
6	මෙ.වො. 70, ප්‍රත්‍යාවර්ථ ධාරා බිම නංවන ලද සූර්ය පැනල විදුලි බලාගාර (මෙ.වො. 1-5, ප්‍ර.ධා.)	12	51	අභිප්‍රාය ලිපි අත්සන් කොට ඇත ව්‍යාපෘති 6ක විදුලිය මිලදී ගැනීමේ ගිවිසුම් අත්සන් කොට (මෙ.වො. 26) ඉතිරි ව්‍යාපෘති 6 සඳහා විදුලිය මිලදී ගැනීමේ ගිවිසුම් අත්සන් කිරීමට නියමිතව ඇත.		51	
	මෙ.වො. 70, ප්‍රත්‍යාවර්ථ ධාරා බිම නංවන ලද සූර්ය පැනල විදුලි බලාගාර (මෙ.වො. 1-5, ප්‍ර.ධා.) ප්‍රතිටෙන්ඩර් කළ	7	19	ව්‍යාපෘති 6ක අභිප්‍රාය ලිපි අත්සන් කොට, එක් ව්‍යාපෘතියක අභිප්‍රාය ලිපිය අත්සන් කිරීමට නියමිතව ඇත			19
7	මෙ.වො. 165, බිම නංවන ලද සූර්ය පැනල විදුලි බලාගාර (මෙ.වො. 1-5, ප්‍ර.ධා.)	-	165	ටෙන්ඩර් ඇගයුම් කටයුතු සම්පූර්ණ කොට ඇත, එය පිරිනැමීම සඳහා වූ අමාත්‍ය මණ්ඩල තීරණය ලැබීමට නියමිතව ඇත.			165

වගුව 2.1.8

ජාල පෝෂක ගාස්තු ක්‍රමය (Feed-In Tariff) යටතේ එන ව්‍යාපෘති

ව්‍යාපෘති ත්‍රාක්ෂණය	2024 වසර		2025 වසර	2026 වසර
	මෙහෙවරෙහි යොදවා ඇති (මෙ.වො.)	මෙහෙවරෙහි යෙදවීමට නියමිත (මෙ.වො.)	මෙහෙවරෙහි යෙදවීමට නියමිත (මෙ.වො.)	මෙහෙවරෙහි යෙදවීමට නියමිත (මෙ.වො.)
සූර්ය පැනල	10	15	150	150
සුළං	-	-	10	10

ප්‍රගති වාර්තාව 2024-ලංවිම

වගුව 2.1.9

සෙසු ව්‍යාපෘති

අං.	ව්‍යාපෘතිය/ වැඩසටහන	ප්‍රගතිය	කටයුතු සම්පූර්ණ කිරීමට අපේක්ෂිත දිනය
1	ජාතික පද්ධති පාලක මධ්‍යස්ථානයේ පුනර්ජනනීය බලශක්ති පාලක හා නිරීක්ෂක ඒකකය	අරමුදල් ලැබී ඇත. යෝජනා ඉල්ලුම් ලේඛනය සැකසීමේ කටයුතු ආරම්භ කිරීමට නියමිතය.	2026
2	මා ඔය මෙ.වො. 600 පොම්ප ගබඩා විදුලි බලාගාරය	ශක්‍යතා අධ්‍යයන කටයුතු සපුරා ඇත. ව්‍යාපෘතිය අනුමැතිය පිණිස ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට නියමිතය.	2034

ප්‍රගති වාර්තාව 2024-ලංවිම

2.1.7 විදුලි සම්ප්‍රේෂණ ප්‍රවර්ධනයන්

2024 අවසන් වන විට උපපොළවල් 947ක් විදුලිබල පද්ධතිය වෙත ඒකාබද්ධ කිරීම සිදුව ඇත. වසර අග වන විට, කි.වෝ.220 සහ කි.වෝ.132 මුදුන් සම්ප්‍රේෂණ සහ භූගත සම්ප්‍රේෂණ රැහැන් මාර්ගවල සමස්ත විහිදුම් මාර්ග දිග කිලෝමීටර 3,398ක් දක්වා පුළුල් කර ඇත.

2024 වර්ෂයේදී ලංකා විදුලිබල මණ්ඩලය විසින් පිටකොටුව ග්‍රිඩ් උපපොළේ ඉදිකිරීම් සාර්ථකව අවසන් කිරීමට සමත් වී ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස, මුළු ග්‍රිඩ් උපපොළ ධාරිතාව මෙ.වො. 12,379.50 දක්වා වර්ධනය වූ අතර වසර අග වන විට මෙරට වූ සමස්ත ග්‍රිඩ් උපපොළ සංඛ්‍යාව 90ක් වී දක්වා වැඩි වී ඇත.

2024 වසර තුළ මහ කොළඹ සම්ප්‍රේෂණ හා හානි අවමකරණ ව්‍යාපෘතිය, හරිත බලශක්ති සංවර්ධන හා බලශක්ති කාර්යක්ෂමතාව නඟාසිටුවීමේ ව්‍යාපෘතිය, ජාතික සම්ප්‍රේෂණ හා බෙදාහැරීමේ ජාල සංවර්ධන හා බලශක්ති කාර්යක්ෂමතා ව්‍යාපෘතිය, ත්‍රිකුණාමලය සම්ප්‍රේෂණ ඉදිකිරීම් ව්‍යාපෘති වැනි සම්ප්‍රේෂණ ව්‍යාපෘතින්හි කටයුතු අඛණ්ඩව සිදු කර ගෙන යන ලදී.

සියලුම උත්පාදන මධ්‍යස්ථාන මගින් කි.වෝ.220 සහ කි.වෝ.132 සම්ප්‍රේෂණ ජාලය උපයෝගී කරගනිමින් ජාතික විදුලිබල ජාලය වෙත සපයනු ලබන විදුලිය සම්ප්‍රේෂණ අංශය විසින් සිය පද්ධති පාලන මධ්‍යස්ථානය හරහා ප්‍රේෂණය කිරීම සිදු කොට තිබේ.

පසුගිය වසරවල සම්ප්‍රේෂණ මාර්ග සහ ග්‍රිඩ් උපපොළ සංවර්ධනය පහත පරිදි වේ.

වගුව 2.1.10
ජාලය වෙත විදුලිය එක්කිරීම්හි සාරාංශය

ජාලය වෙත විදුලිය එක්කිරීම	2024		අලුතින් එක්කරන ලද ග්‍රිඩ් උපපොළවල විස්තර		
	ගණන	ධාරිතාව (මෙ.වෝ.ඇ.)	ග්‍රිඩ් උපපොළේ නම	වෝල්ටීයතාව (කි.වෝ.)	ධාරිතාව (මෙ.වෝ.ඇ.)
කි.වෝ. 132/33	63	4973.5	වගවත්ත	132/33	90
කි.වෝ. 220/132/33	4	1600/380			
කි.වෝ. 220/132	9	4010			
කි.වෝ. 132/11	8	792			
කි.වෝ. 220/33	6	624			

තවද, සම්ප්‍රේෂණ අංශය විසින් සිය සම්ප්‍රේෂණ ජාලය සංවර්ධනය කිරීම ඉලක්ක කර ගනිමින් පහත ව්‍යාපෘති ක්‍රියාත්මක කරමින් පවතින අතර තවත් කොටසක් අරමුදල් ලැබුනු පසු ක්‍රියාත්මක කිරීමට සූදානම්ව පවතී.

වගුව 2.1.11
දැනට ක්‍රියාත්මක සම්ප්‍රේෂණ සංවර්ධන ව්‍යාපෘතිවල ප්‍රගතිය

ව්‍යාපෘතිය/ ශාඛාව	පැකේජය	පිරිවැය (ශ්‍රී ලං.රු. මිලියන)	20241031 දිනට භෞතික ප්‍රගතිය	කටයුතු අවසන් කෙරෙන දිනය
මහ කොළඹ සම්ප්‍රේෂණ සහ හානි අවමකරණ ව්‍යාපෘතිය	කෙරවලපිටිය සිට කොළඹ L දක්වා දෙවන කි.වෝ. 220 කේබලය ඉදිකිරීම	13,055	11.50%	අගෝස්තු 2026
	බැටරි බලශක්ති ගබඩාකරණ පද්ධතිය	4,419	35.00%	දෙසැම්බර් 2025

ත්‍රිකුණාමලය සම්ප්‍රේෂණ ඉදිකිරීම් ව්‍යාපෘතිය	හබරණ වේයන්ගොඩ කි.වෝ. 220 සම්ප්‍රේෂණ මාර්ග ව්‍යාපෘතිය A කොටස උපපොළ ඉදිකිරීම	6,958	100.00%	කටයුතු සම්පූර්ණයි
	හබරණ වේයන්ගොඩ කි.වෝ. 220 සම්ප්‍රේෂණ මාර්ග ව්‍යාපෘතිය B කොටස සම්ප්‍රේෂණ මාර්ගය ඉදිකිරීම	17,770	100.00%	කටයුතු සම්පූර්ණයි
හරිත විදුලිබල සංවර්ධන සහ බලශක්ති කාර්යක්ෂමතා ප්‍රවර්ධන ආයෝජනය (අදියර 2)	පැකේජය 2/ B2 A කොටස පාදුක්ක හොරණ කි.වෝ. 132 සම්ප්‍රේෂණ මාර්ගය ඉදිකිරීම	600	100.00%	කටයුතු සම්පූර්ණයි
	ව්‍යා.කළ.ඒ. 2-පැකේජය 8/B කොටස අම්බලන්ගොඩ කි.වෝ. 132/33 කොටුමා උපපොළ විශාලනය, පන්නල කි.වෝ. 132/33 කොටුමා උපපොළ විශාලනය හා කි.වෝ. 132/33 මෙ.වෝ.ඇ. 31.5 අමතර තරාපැවි 2ක් සැපයුම	1,740	100.00%	කටයුතු සම්පූර්ණයි
	"පැකේජය 9 : කෙරවළපිටිය කි.වෝ. 220 ස්විච්චිකරණ ස්ථානය"	2,919	100.00%	කටයුතු සම්පූර්ණයි
	විදුලි සැපයුම්හි විශ්වසනීයත්වය නංවාලීමට සහාය වීමේ ව්‍යාපෘතිය (SESRIP)(පැකේජය 7 A1 කොටස: පන්නිපිටිය කොටුමා උපපොළෙහි මෙ.වෝ.ඇ. 100 කැඩුම් ස්විච්චිකරණ ධාරිත්‍රකය ස්ථාපනය	1103.5	95.00%	දෙසැම්බර් 2024
	විදුලි සැපයුම්හි විශ්වසනීයත්වය නංවාලීමට සහාය වීමේ ව්‍යාපෘතිය (SESRIP) පැකේජය 7 A2 කොටස: බියගම කොටුමා උපපොළෙහි ස්ථිතික වාර පද්ධතිය ස්ථාපනය	1680.8	100.00%	මැයි 2024
ජාතික සම්ප්‍රේෂණ හා බෙදාහැරීමේ ජාල සංවර්ධන සහ කාර්යක්ෂමතා ප්‍රවර්ධන ව්‍යාපෘතිය	පැකේජය 1: කි.වෝ. 400, කි.වෝ. 220 සහ කි.වෝ. 132 සම්ප්‍රේෂණ මාර්ග ඉදිකිරීම	13,003	84.00%	දෙසැම්බර් 2025
	පැකේජය 2 :කොටුමා උපපොළ ඉදිකිරීම සහ විශාලනය	7,418	91.00%	දෙසැම්බර් 2025
	පැකේජය 3: සම්ප්‍රේෂණ මාර්ග ඉදිකිරීම (කි.වෝ. 220, කි.වෝ. 132)	12,000	59.00%	නැවත ප්‍රසම්පාදන කටයුතු ඇරඹීම සඳහා සැලසුම් කරමින් පවති.
	පැකේජය 4: බෙදාහැරීමේ උපපොළ සහ කේබල ඉදිකිරීම (කි.වෝ. 33, කි.වෝ. 11, කි.වෝ. 0.4)	4,594		තාවකාලිකව නවතා ඇත.
	මැදගම අම්පාර කි.වෝ. 132 සම්ප්‍රේෂණ මාර්ගය නැවත ඉදිකිරීම	3,206	45%	ජනවාරි 2025
සම්ප්‍රේෂණ ඉදිකිරීම් ව්‍යාපෘතිය	වික්ටෝරියා රන්ටැඹේ කි.වෝ. 220 සම්ප්‍රේෂණ මාර්ගය ඉදිකිරීම	1,400	6%	දෙසැම්බර් 2024
	අතුරුගිරිය කොළොන්නාව කි.වෝ. 132 සම්ප්‍රේෂණ මාර්ගය විශාලනය	170	20%	ජූනි 2024
	කොළොන්නාව පන්නිපිටිය කි.වෝ. 132 සම්ප්‍රේෂණ මාර්ගය නැවත ඉදිකිරීම	960	10%	ජූනි 2024
	කැළණිතිස්ස කොළොන්නාව කි.වෝ. 132 සම්ප්‍රේෂණ මාර්ගය උස් කිරීම	702	9%	අප්‍රේල් 2024
	නව අනුරාධපුර කොටුමා උපපොළේ මෙ.වෝ.ඇ. 2x50 ප්‍රතිචාරකය සහ මන්නාරම කොටුමා උපපොළේ මෙ.වෝ.ඇ. 1x50 ප්‍රතිචාරකය ස්ථාපනය	1,463	100.00%	කටයුතු සම්පූර්ණයි

	වගවත්ත කොටුමා උපපොළ (මෙ.වෝ.ඇ. 2x45 තරාපැවිය ද්විත්ව බස්බාර් සහිතව)ඉදිකිරීම	1,898	99.00%	දෙසැම්බර් 2023
	කැළණිතිස්ස කි.වෝ. 132 ගෑස් පරිවරණිත උපපොළ දීර්ඝ කිරීම	464	98.00%	මාර්තු 2024
	නව පොල්පිටිය ස්විච්චිකරණ ස්ථානයේ කි.වෝ. 220 ද්විත්ව බස්බාර් සම්ප්‍රේෂණ මාර්ග දෙකක් ඉදිකිරීම	291	100.00%	කටයුතු සම්පූර්ණයි
	කොටුගොඩ විශාලන කටයුතු	73	100.00%	කටයුතු සම්පූර්ණයි
	බලන්ගොඩ විශාලන කටයුතු	67	55.00%	පෙබරවාරි 2025
	අතුරුගිරිය විශාලන කටයුතු	15	100.00%	කටයුතු සම්පූර්ණයි
	රත්මලාන කොටුමා උපපොළේ කි.වෝ. 33 පෝෂක ස්ථාන දෙකක් ඉදිකිරීම	148	100.00%	කටයුතු සම්පූර්ණයි
	රන්ටැඹේ ස්විච්චිකරණ ස්ථානයේ කි.වෝ. 220 ගෑස් පරිවරණිත උපපොළ ඉදිකිරීම	2,809	6.00%	දෙසැම්බර් 2026
	වික්ටෝරියා විදුලි බලාගාරයේ කි.වෝ. 220 1 1/2 බ්‍රේකර් පද්ධතියක් ඉදිකිරීම	229	80.00%	අප්‍රේල් 2025
	රන්දෙණිය (උමා ඔය ජලවිදුලි ව්‍යාපෘතිය) ආශ්‍රිත කි.වෝ. 132 ස්විච් අංගනය ඉදිකිරීම	350	100.00%	කටයුතු සම්පූර්ණයි
	අම්පාර කොටුමා උපපොළේ කි.වෝ. 132 තනි බස්බාර් සම්ප්‍රේෂණ මාර්ග ස්ථානය ඉදිකිරීම	85	8.00%	මාර්තු 2025
	කොටුමා උපපොළ 14ක පැරණි ස්ථිතික පිළියවනයන් මාරු කිරීම	212	28.00%	මාර්තු 2025
	මතුගම කොටුමා උපපොළේ කි.වෝ. 33 පාර්ශ්වය ප්‍රතිසංස්කරණය	595	9.00%	දෙසැම්බර්2025
	ආනියාකන්ද කොටුමා උපපොළ විශාලනය	353	14.00%	දෙසැම්බර්2025
	චුන්නාකම් කොටුමා උපපොළ විශාලනය	610	14.00%	දෙසැම්බර්2025
	නාඩුකුඩා කොටුමා උපපොළ විශාලනය	1,526	5.00%	සැප්තැම්බර් 2025
	කුකුළේගඟ ස්විච්චිකරණ අංගනය විශාලනය	306	3.00%	අගෝස්තු2025
	නව අනුරාධපුර කොටුමා උපපොළ විශාලනය	600	3.00%	ජුනි2025
සම්ප්‍රේෂණ ව්‍යාපෘති	සාම්පූර්කප්පල්තුරේ සම්ප්‍රේෂණ සංවර්ධන ව්‍යාපෘතිය යටතේ පැකේජ 4,5,6,10 සහ 11ට අදාළ සම්ප්‍රේෂණ ජාල අවශ්‍යතාවයන් සඳහා අමතර කොටස් සහ මෙවලම් ලෙස ද්‍රව්‍ය/ උපකරණ ප්‍රසම්පාදනය	4,381	98.00%	මාර්තු 2025
	පූනරින් කිලිනොච්චි කි.වෝ.220 DC සම්ප්‍රේෂණ මාර්ගය ඉදිකිරීමේ මූලික කටයුතු PSRSP-Ph-02-OU2	3,400	12%	දෙසැම්බර්2025
විදුලි පද්ධති බලගැන්වීමේ සහ පුනර්ජනනීය බලශක්ති ඒකාබද්ධකරණ ව්‍යාපෘතිය	පැකේජය 4A: ආසියානු සංවර්ධන බැංකු ණය අංක 3483-SRi සහ 3585-SRi ට අදාළ පැකේජ අංක 4,6,10 සහ 12 යටතේ සම්ප්‍රේෂණ ජාල අවශ්‍යතාවයන් සඳහා අමතර කොටස් සහ මෙවලම් ලෙස ද්‍රව්‍ය ලබාගැනීම	3,633	ලංසු කැඳවීමේ කාල සීමාව ඇතුළත	2025

වගුව 2.1.12

අරමුදල් සම්පාදනය කළ යුතුවන සම්ප්‍රේෂණ සංවර්ධන ව්‍යාපෘති පිළිබඳ විස්තර

අයිතමය		කටයුතු සම්පූර්ණ කිරීමට අපේක්ෂිත වර්ෂය	සමස්ත පිරිවැය ඇස්තමේන්තුව (ශ්‍රී ලං. රු. මි.)	2025 වසර සඳහා අවශ්‍යවන මූල්‍ය බැඳීම (ශ්‍රී ලං. රු. මි.)
1	නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (සම්ප්‍රේෂණ ව්‍යාපෘති)			
	පවිත්‍ර බලශක්ති අවශෝෂණ සම්ප්‍රේෂණ ව්‍යාපෘතිය (CEATP) -1 ලොට්– A i. නව හබරණ උපපොළේ සිට කප්පල්තුරේ කොටුමා උපපොළ දක්වා කි.මී. 77ක් දිග කි.වෝ. 220 ද්විත්ව පරිපථ මාර්ගය ඉදිකිරීම	2027	12,863	1,950
	ලොට් – B I. නව හබරණ කි.වෝ. 220/132 ස්විච්චිකරණ ස්ථානය විශාලනය (2x220 කි.වෝ. සම්ප්‍රේෂණ මාර්ග ස්ථාන)"			
	II. කප්පල්තුරෙයි කි.වෝ.220/33 කොටුමා උපපොළ නවීකරණය කිරීම.			
	පවිත්‍ර බලශක්ති අවශෝෂණ සම්ප්‍රේෂණ ව්‍යාපෘතිය (CEATP) -II ලොට් A - (i) කි.වෝ. 132/33 මෙ.වෝ.ඇ. 2 x 31.5 වැලිමඩ කොටුමා උපපොළ ඉදිකිරීම	2027	16,674	1,668
	(ii) කි.වෝ. 132/33 මෙ.වෝ.ඇ. 2 x 31.5 කිරියන්කල්ලිය කොටුමා උපපොළ ඉදිකිරීම			
	(iii) නව හලාවත කොටුමා උපපොළ විශාලනය			
	(iv)පුත්තලම කොටුමා උපපොළ විශාලනය			
	(v) බදුල්ල සහ ලක්ෂපාන කොටුමා උපපොළ විශාලනය			
	(vi) සමනලවැව සහ ඇඹිලිපිටිය කොටුමා උපපොළ විශාලනය			
	ලොට් B - (ද) සමනලවැව ඇඹිලිපිටිය කි.වෝ. 132 සම්ප්‍රේෂණ මාර්ගයේ ධාරිතා ප්‍රවර්ධනය			
	(දූ) බදුල්ල ලක්ෂපාන කි.වෝ. 132 සම්ප්‍රේෂණ මාර්ගයේ කි.මී. 74.5ක ධාරිතා ප්‍රවර්ධනය			
	ලොට් C - පුත්තලම නව හලාවත කි.වෝ. 132 සම්ප්‍රේෂණ මාර්ගය නැවත ඉදිකිරීම			
	සාම්පූර්කප්පල්තුරේ සම්ප්‍රේෂණ සංවර්ධන ව්‍යාපෘතිය (SKTDP)	2026	7,896	7,106
	සාම්පූර් කප්පල්තුරේ කි.වෝ. 220 දිවිත්ව පරිපථ සම්ප්‍රේෂණ මාර්ගය ඉදිකිරීම සහ සාම්පුර්හි කි.වෝ. 220/33 රාශිකරණ කොටුමා උපපොළ ඉදිකිරීම			
	විදුලිබල පද්ධතියේ විශ්වසනීයත්වය බලගැන්වීමේ ව්‍යාපෘතිය PSRSP : Ph II P 2 - OU 01 වාරියපොල කි.වෝ. 220/132 උපපොළ ඉදිකිරීම, වාරියපොල කුරුණෑගල කි.වෝ. 132 ද්විත්ව පරිපථ කි.මී. 22 සම්ප්‍රේෂණ මාර්ගය ඉදිකිරීම, හබරණ වේයන්ගොඩ කි.වෝ. 220 සම්ප්‍රේෂණ මාර්ගයේ සිට වාරියපොළ උපපොළ දක්වා (කි.මී. 3) ද්විත්ව පිවිසුම් පිටවීම් සම්බන්ධතාවය ඉදිකිරීම, කුරුණෑගල කි.වෝ. 132 කොටුමා උපපොළ විශාලනය	2027	7,710	771

	විදුලිබල පද්ධතියේ විශ්වසනීයත්වය බලගැන්වීමේ ව්‍යාපෘතිය PSRSP : Ph II P 2 - OU 02 (ද) ඒකල කි.වෝ. 132/33 කොටුමා උපපොළ, කොටුගොඩකැළණිය කි.වෝ. 132 සම්ප්‍රේෂණ මාර්ගයේ සිට කි.මී. 4ක ද්විත්ව පිවිසුම් හා පිටවීම් සම්බන්ධතාවය	2027	3,897	556
	(දද) යක්කල කි.වෝ. 132/33 කොටුමා උපපොළ, කි.වෝ. 132 ද්විත්ව පරිපථ සම්ප්‍රේෂණ මාර්ගය,කිරිඳිවැල කොටුමා උපපොළේ සිට යෝජිත යක්කල කොටුමා උපපොළ දක්වා ආසන්න වශයෙන් කි.මී. 10ක්		3,226	479
	විදුලිබල පද්ධතියේ විශ්වසනීයත්වය බලගැන්වීමේ ව්‍යාපෘතිය PSRSP : Ph II P 2 - OU 03 කි.වෝ. 132/11 මහනුවර නගර කොටුමා උපපොළ ඉදිකිරීම, මහනුවර නගර කොටුමා උපපොළ සඳහා කි.මී. 6ක් දිග සම්ප්‍රේෂණ මාර්ගය ඉදිකිරීම සහ කිරිබත්කුඹුර හා උකුවෙල කොටුමා උපපොළයන් විශාලනය	2027	6,150	900
	කි.වෝ. 132/33,මෙ.වෝ.ඇ. 31.5 වැලිගම කොටුමා උපපොළ ඉදිකිරීම	2027	3,824	520
	මන්නාරම වව්නියාව කි.වෝ. 220 සම්ප්‍රේෂණ මාර්ගයේ සන්නායකය නවීකරණය	2026	690 (බදු සහිතව)	460
2	මහ කොළඹ සම්ප්‍රේෂණ සහ බෙදාහැරීමේ අලාභ අවමකරණ ව්‍යාපෘතිය කොළඹ නගර සම්ප්‍රේෂණ සංවර්ධන ව්‍යාපෘතිය අදියර 2	2027	30,295	-
3	2xසීබ්‍රා සහිතව පන්නිපිටිය - පානදුර කි.වෝ. 132 සම්ප්‍රේෂණ මාර්ගය ඉදිකිරීම	2027	2,020	406
4	2xසීබ්‍රා සහිතව පානදුර T මතුගම කි.වෝ. 132 සම්ප්‍රේෂණ මාර්ගය ඉදිකිරීම	2027	2,766	734
5	සීබ්‍රා කුළුණු සහිතව ලක්ෂපාන විමලසුරේන්ද්‍ර කි.වෝ. 132 සම්ප්‍රේෂණ මාර්ගය ඉදිකිරීම	2027	683	181
6	සීබ්‍රා කුළුණු සහිතව බලංගොඩ දෙනියාය - ගාල්ල සම්ප්‍රේෂණ මාර්ගය නැවත ඉදිකිරීම	2027	6,439	1,708
7	පාදුක්ක කොටුමා උපපොළේ මෙ.වෝ.ඇ. 300 STATCOM ඒකකය ස්ථාපනය	2027	11,290	2,994
8	දෙහිවල - රත්මලාන කි.වෝ. 132 භූගත කේබලය ඉදිකිරීම	2027	4,679	1,241
9	නව හබරණ වව්නියාව හරාශිකරණ (කි.වෝ. 22 මෙහෙයුම් අදියර) සම්ප්‍රේෂණ මාර්ගය මූසික කේබල 4ක් සහිතව නැවත ඉදිකිරීම	2027	36,067	9,565
10	සීබ්‍රා කුළුණු සහිතව නව ලක්ෂපාන - බලන්ගොඩ කි.වෝ. 132 සම්ප්‍රේෂණ මාර්ගය නැවත ඉදිකිරීම	2027	2,845	2,264
11	කි.වෝ. 132 ලින්ක්ස් සම්ප්‍රේෂණ මාර්ගයන්හි ධාරිතා වර්ධනය ලක්ෂපාන සංකීර්ණය	2027	1,444	383
12	වැලිගම කි.වෝ. 132/33 කොටුමා උපපොළ ඉදිකිරීම	2027	2,423	643
13	නව හබරණ පොම්පගත ගබඩා විදුලි බලාගාරය කිරිඳිවැල කි.වෝ. 400 සම්ප්‍රේෂණ ජාලය සංවර්ධනය	2027	35,335	9,371
14	තුල්හිරිය ධාරිත්‍රක කැන් (Capacitor Banks) මාරු කිරීම	2027	154	123

2.1.8 දේශගුණික විපර්යාස අවම කිරීම හා විදුලිබල ක්ෂේත්‍රයේ ජාතිකව නිර්ණය කරන ලද දායකත්ව (NDCs)

දේශගුණික විපර්යාස අවම කිරීම පිණිස හරිතාගාර වායු විමෝචනය අවම කිරීම අත්‍යාවශ්‍ය වන අතර කාබන් විමෝචනය ශූන්‍ය කිරීම 2050 දී අපේක්ෂා කරයි. මේ සඳහා විදුලිබල ක්ෂේත්‍රයට අදාළ ජාතිකව නිර්ණය කරන ලද දායකත්වයන් ක්‍රියාත්මක කිරීමේ හා අධීක්ෂණය කිරීමේ සැලැස්ම සකස්කොට නිම කර ඇත. ජාතික මෙහෙයුම් කමිටුව වෙත විදුලිබල ක්ෂේත්‍රයේ ජාතිකව නිර්ණය කරන ලද දායකත්ව ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය පිළිබඳව වාර්තා කරන ලදී. සාමාන්‍ය තත්ත්වයට සාපේක්ෂව

විදුලිබල ක්ෂේත්‍රයේ හරිතාගාර වායු විමෝචනයන් අඩු කිරීමේ ඉලක්කය 25%ක් වෙයි. (කොන්දේසි විරහිතව 5%ක් සහ කොන්දේසි සහිතව 20% ක්) වර්ෂ 2021-2030 කාල සීමාව තුළ ඇස්තමේන්තුගත හරිතාගාර විමෝචනය අඩු කිරීම, කොන්දේසි විරහිතව මෙට්‍රික් ටොන් 9,819,000 වන අතර කොන්දේසි සහිතව මෙට්‍රික් ටොන් 39,274,000 කි. (සම්පූර්ණ විමෝචනය අඩු කිරීම මෙට්‍රික් ටොන් 49,093,000 කි). මෙම ඉලක්ක සපුරාලීමට පුනර්ජනනීය විදුලි ජනනය වැඩි කිරීමට කටයුතු කරමින් සිටී.

2.1.9 පර්යේෂණ සහ සංවර්ධන ක්‍රියාකාරකම්

ඇමරිකා එක්සත් ජනපද ආධාර වැඩසටහන (USAID) යටතේ ලං.වි.ම. වෙත ඇ.ඩො. මිලියන 4.23, ලංකා විදුලි පුද්ගලික සමාගම වෙත ඇ.ඩො. මිලියන 1.9ක් හා ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියට ඇ.ඩො. මිලියන 3.6ක වටිනාකමින් යුත් තාක්ෂණික සහාය ලබා දීමට ඉදිරිපත් වී ඇති අතර මෙම ව්‍යාපෘතිය ශ්‍රී ලංකා බලශක්ති වැඩසටහන ලෙස හැඳින්වේ. මේ යටතේ, තෝරාගත් පර්යේෂණ හා සංවර්ධන කටයුතු සඳහා ද තාක්ෂණික සහාය ලබා දී ඇත.

2.1.10 විදුලි ගාස්තු සංශෝධනය -2024

ශ්‍රී ලංකා රජය විසින් විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය හරහා 2023.01.12 දිනැති අංක MOPE/SEC/COM/2023 දරන ලිපිය මගින් විදුලිබල අංශය සඳහා වූ පොදු ප්‍රතිපත්ති මාර්ගෝපදේශ නිකුත් කරන ලද අතර ඒ අනුව සැලසුම්ගත විදුලිය කපා හැරීම් සිදුනොවන හා රජයේ ආධාර රහිතව ක්‍රියාත්මක වන මිල තීරණය කිරීමේ යාන්ත්‍රණයක් නිර්මාණය කරනු පිණිස අර්ධ වාර්ෂිකව හෙවත් වර්ෂයේ ජනවාරි මස පළමුවැනි දින සහ ජුලි මස පළමුවැනි දින විදුලි ගාස්තු සංශෝධනය සඳහා අනුමැතිය ලබා දී ඇත.

වසර 10ක් ඉක්ම යාමෙන් පසු ලංකා විදුලිබල මණ්ඩලය විසින් 2023 වසරේ මුල් භාගයේදී ගාස්තු සංශෝධනය සඳහා පිරිවැය පිළිබිඹු කරන ගාස්තු ක්‍රමයකට එළැඹ ඇති අතර 2024 විදුලි ගාස්තු සංශෝධනය 2024.07.16 දින ක්‍රියාවට නංවමින්, සියලුම කාණ්ඩවල සාමාන්‍ය අඩු කිරීම 22.5%ක් බවට පත් කොට, දවසේ පැය විසිහතර පුරා රටේ අඛණ්ඩ විදුලි සැපයුමක් සහතික කර, රටේ ආර්ථිකය නැවත නඟා සිටුවීමට අවකාශය සලසමින්, කර්මාන්ත, ව්‍යාපාර, මහජනතාව, ආයෝජක ප්‍රජාව, අනාගත විදුලි පාරිභෝගිකයින් සහ ලංකා විදුලිබල මණ්ඩලය වෙත ද බොහෝ ආකාරයන්ගෙන් ප්‍රතිලාභ අත් කර දී ඇත.

2.1.11 නවීන තාක්ෂණය ද සමගින් අත්පත් කරගත් මෙහෙයුම් ප්‍රවර්ධනයන්

- **සූර්ය පැනල පද්ධති සඳහා වූ ජාතික බලශක්ති පුරෝකථන මොඩියුලය**

විශ්වසනීය හා නිරවද්‍ය බලශක්ති අනාවැකි පද්ධතියක් නිර්මාණය කිරීම ඉලක්ක කොටගෙන සූර්ය පැනල සඳහා වූ ජාතික බලශක්ති පුරෝකථන මොඩියුලයක් ගොඩනංවනු ලැබ ඇත. වර්තමානයේ CEB Assist වේදිකාවෙහි, භූමිය මත සවිකරන ලද සූර්ය පැනල පද්ධති සඳහා මෙම පුරෝකථන මොඩියුලය පරීක්ෂණ මට්ටමින් ක්‍රියාත්මක වෙමින් පවතී.

- **වහළය මත සවිකරන සූර්ය පැනල සම්බන්ධතා ප්‍රගතිය**

නිවාස, ආගමික ස්ථාන, හෝටල්, වාණිජ ආයතන සහ කර්මාන්තශාලාවල ද වහළය මත කුඩා සූර්ය බලාගාර ස්ථාපනය කිරීම දිරිගැන්වීමේ මූලාරම්භයන් සුනිත්‍ය බලශක්ති අධිකාරිය, ලංකා විදුලිබල මණ්ඩලය හා ලංකා විදුලි පුද්ගලික සමාගම විසින් නොකඩවා සිදු කරගෙන යනු ලබයි.

- **වහළය මත සවිකරන සූර්ය පැනල යෙදවුම් පිරිසැකසුම් ක්‍රමය CEBAssist පද්ධතිය තුළට ඒකාබද්ධ කිරීම**

CEBAssist විසින් මෑත කාලීනව වහළය මත සවිකරන සූර්ය පැනල යෙදවුම් කළමනාකරණ ක්‍රමය (Rooftop Solar PV Application Processing System) නමැති නව මොඩියුලයක් ඇතුළත් කර ඇත. මෙම එක්කිරීම මගින් බෙදාහැරීමේ කාර්ය මණ්ඩලයට සූර්ය පැනල නිෂ්කාශන ඉල්ලීම්, සම්බන්ධතා යෙදවුම්, අභ්‍යන්තර කාර්ය ධාරා සහ ක්ෂේත්‍ර පරීක්ෂණ කටයුතු වැනි විවිධ කටයුතු කාර්යක්ෂමව මෙහෙයවීම සඳහා අවශ්‍ය ශක්තිය ලබාදෙනු ලබයි.

වහළය මත සවිකරන සූර්ය පැනල යෙදවුම් කළමනාකරණ කාර්යයෙහි ලා ප්‍රමිතිගත ප්‍රවේශයක් ලබාදෙමින් මෙම මොඩියුලය සියලු ක්ෂේත්‍ර පුරා සාර්ථකව ගොඩනඟා ක්‍රියාත්මක කොට ඇත. පාරිභෝගිකයන් හට සිය සූර්ය පැනල පද්ධතියේ තත්ත්වය පිළිබඳ තත්කාලීන තොරතුරු ලබාගැනීමට හැකියාව ලබාදෙමින් මෙම මොඩියුලය හරහා සියලු වහළ මත සවිකරන සූර්ය පැනල යෙදවුම් කළමනාකරණය වේ.

- **ස්වයංක්‍රීය තොරතුරු තාක්ෂණ සේවය**

තොරතුරු තාක්ෂණ ශාඛාව විසින් ලබාදෙනු ලබන සේවාවන්ගේ ගුණාත්මකභාවය වැඩිදියුණු කරලීම උදෙසා ලං.වි.ම. අභ්‍යන්තර ගනුදෙනුකරුවන් උදෙසා අලුතින් ගොඩනඟන ලද තොරතුරු තාක්ෂණ සේවා මෘදුකාංගය හඳුන්වාදෙනු ලැබ ඇත.

2024 වාර්ෂික වාර්තාව තුළ අවධාරණය කරන ලද ඉහත මෙහෙයුම් සංවර්ධනයනට අමතරව, CEB Assist විසඳුම් ක්‍රමය යටතේ පහත මොඩියුල ගොඩනඟා ඇත.

- සියලු සම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති (NCRE) බලාගාර සඳහා තත් කාලීන ජනන සංඛ්‍යාන විමසුම්කරණ සේවය උදෙසා සම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති මොඩියුලය (NCRE Desk module) හඳුන්වා දී ඇත. සම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති බලාගාරයන්හි ස්ථාපිත බලශක්ති මනු හරහා මෙම මොඩියුලය විසින් ජනන සංඛ්‍යාන නිරීක්ෂණය සිදුකරනු ලබයි.
- ප්‍රධාන ජල සහ තාප ජනන බලාගාරයන්ගෙන් මාර්ගගතව දෛනික ජනනය, ජලාශ, ඉන්ධන තත්ත්වය හා විස්තර මාර්ගගතව රැස්කරනු පිණිස සැකසුණු දෛනික ජනන සංඛ්‍යාන මොඩියුලය (Daily generation statistics module).
- විදුලි බලාගාර සහ සෙසු ඒකකයන්හි මුර සේවා කාර්ය මණ්ඩලයේ මුර කෘත්‍ය ලේඛන, කණ්ඩායම්, නිවාඩු හා පැමිණීමේ සටහන් කළමනාකරණය පිණිස සැකසුණු පැමිණීම් මොඩියුලය (Attendance module).
- එක් එක් වැටුප් ඒකකයට අදාළව ඉන්වොයිසි, වැටුප් පත්‍රිකා, අරමුදල් වෙන් කිරීම සහ චෙක්පත් නිරීක්ෂණය පිණිස සැකසුණු වියදම් විමසුම් මොඩියුලය (Expenditure tracking module).
- මුද්‍රිත බිල්පත් නිකුත් කිරීම ක්‍රමය වෙනුවට සියලු සාමාන්‍ය ගනුදෙනුකරුවන් සඳහා විද්‍යුත් තැපෑල සහ කෙටි පණිවිඩ ක්‍රම මගින් ලබාදෙනු ලබන විද්‍යුත් බිල්පත් සේවය.
- සුහුරු මනු තොරතුරු ඒකරාශිකරණ ක්‍රමය (HES) මගින් සාමාන්‍ය ගනුදෙනුකරුවන් 3500 කගේ මනු එම ක්‍රමය තුළට සම්බන්ධ කිරීම. මෙමගින් ලං.වි.ම. වෙත දුරස්ථ මනු කියවීම් සහ විද්‍යුත් බිල්පත් නිකුතු සේවා හැකියාව ලබාදෙනු ලබයි.

2.1.12 ජාත්‍යන්තර සහයෝගීතා

- නීතිපති දෙපාර්තමේන්තුවේ සහ අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලැබීමෙන් පසු ලංකා විදුලිබල මණ්ඩලය සහ ජපන් විදුලි බල තොරතුරු මධ්‍යස්ථානය (JEPIC) අතර තාක්ෂණය හුවමාරුව පිළිබඳ අවබෝධතා ගිවිසුමක් (MoU) අත්සන් කරන ලදි.
- විදේශ කටයුතු අමාත්‍යාංශයේ මගපෙන්වීම යටතේ දකුණු ආසියානු කලාපීය සහයෝගීතා සංගමයේ (SAARC) බලශක්ති මධ්‍යස්ථානයේ සාමාජිකත්වය ලබා ගැනීමට අදාළ කටයුතු සිදු කරන ලදී.
- විදේශ කටයුතු අමාත්‍යාංශයේ මගපෙන්වීම යටතේ බෙංගාල බොක්ක ආශ්‍රිත රටවල බහු ආංශික තාක්ෂණික සහ ආර්ථික සහයෝගීතාව සඳහා වන එකමුතුව (BIMSTEC) සමඟ කටයුතු සිදු කරන ලදී. බහු ආංශික තාක්ෂණික සහ ආර්ථික සහයෝගීතාව සඳහා වන එකමුතුව සංවිධානයේ පරිපාලන මණ්ඩලයේ පළමු රැස්වීමට සහ විදුලි ජාල අන්තර් සම්බන්ධතාවයේ දෙවන රැස්වීමට සහභාගීවීම සහ අදාළ ක්‍රියාකාරකම් සිදුකරන ලදි.
- බෙංගාල බොක්ක ආශ්‍රිත රටවල බහු ආංශික තාක්ෂණික සහ ආර්ථික සහයෝගීතාව සඳහා වන එකමුතුව සංවිධානයේ ප්‍රතිපත්ති ලේඛනයේ විදුලිය බෙදාහැරීම, විකිණීම සහ හුවමාරු කිරීම සහ මිලකරණය පිළිබඳ සමාලෝචන ඉදිරිපත් කරන ලදී.

2.1.13 2025 සඳහා අනාගත සැලසුම් හා වැඩසටහන්

අයවැය ඇස්තමේන්තුව මගින් වෙන්කර ඇති ප්‍රතිපාදන -2025

වගුව 2.1.14
අයවැය ඇස්තමේන්තුව - 2025

	උප ව්‍යාපෘතිය	විෂය	විස්තරය	2025 ප්‍රතිපාදන (රු.මි)				එකතුව රු.මි
				11	12	13	17	
1.	032	2506	ලංවිම සඳහා ලබාගත් විදේශ ණය විසර්ජනය ගිණුම්ගත කිරීම		7,676			7,676
2.	033	2202	කොළඹ නගරයේ අපද්‍රව්‍ය භාවිතා කරමින් විදුලිය උත්පාදනය කිරීමේ බලාගාර ව්‍යාපෘතිය	1,204				1,204
3.	034	2401	විදුලිබල අංශය සඳහා වන ප්‍රධාන සැලැස්ම සඳහා වූ ධාරිතා සංවර්ධන වැඩසටහන් ව්‍යාපෘතිය (JICA)			0.5	0.1	0.6
4.	035	2103	කොරියානු ආධාර යටතේ බැටරි බලශක්ති ගබඩා පද්ධතිය ස්ථාපිත කිරීම			0.8	0.1	0.9
5.	036	2103	රජයේ ගොඩනැගිලි, අඩු ආදායම්ලාභී නිවාස, ආගමික ස්ථාන සහ ජල පිරිපහදු මධ්‍යස්ථාන සඳහා වහලය මත සූර්ය පැනල සවිකිරීම (GOSL/India)			240	50	290
6.	037	2103	ශ්‍රී ලංකාවේ ඩෙල්ෆ්, අණුලතිව්, නයිනතිව් කුඩා දූපත්වල දෙමුහුන් පුනර්ජනනීය බලශක්ති පද්ධති ඉදිකිරීම			2600	400	3000

7.	038	2401	ශ්‍රී ලංකා බලශක්ති වැඩසටහන - USAID			280	17	297
8.	042	2103	ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලයෙහි ධාරිතාවන් සහ හැකියාවන් පුළුල් කිරීම			125	38	163
9.	043	2103	ජාත්‍යන්තර පරමාණුක බලශක්ති නියෝජිතායතනයෙන් ලැබෙන පරිත්‍යාග			25	7	32
10.	045	2302	කෙරවලපිටියවරාය දෙවන භූගත සම්ප්‍රේෂණ රැහැන් ව්‍යාපෘතිය		7000			7000
11.	048	2302	නව හබරණකප්පල්තුරෙයි සම්ප්‍රේෂණ සංවර්ධන ව්‍යාපෘතිය CEATP 1 (AIIB)		1			1
12.	049	2302	සාම්පූර් කප්පල්තුරෙයි සම්ප්‍රේෂණ සංවර්ධන ව්‍යාපෘති (AIIB)		1			1
13.	001	1503	ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය					140
		1509						15
14.	002	1503	ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය					50
15.	004	1503	ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාව					45
		1509						20
16.	015	1503	ජාතික විදුලිබල උපදේශක සභාව					22
		1509						36
17.	015	1503	විදුලිබල ක්ෂේත්‍ර ප්‍රතිසංස්කරණ ලේකම් කාර්යාලය පිහිටුවීම					8
		1509						50
18.	015	2201	ජාතික විදුලිබල උපදේශක සභාව	50.5		0.3	0.2	51
19.	016	2507	න්‍යෂ්ටික බලශක්ති අධ්‍යයනය සහ සැලසුම් කිරීම විදුලිබල උත්පාදන වැඩසටහන (AEB)					2.5
20.	017	2201	විදුලිබල ක්ෂේත්‍ර ප්‍රතිසංස්කරණ ලේකම් කාර්යාලය පිහිටුවීම					50

මූලාශ්‍රය - අයවැය ඇස්තමේන්තු 2025

- **උත්පාදන ධාරිතා ව්‍යාප්තිය**

දිගු කාලීන ජනන ව්‍යාප්ති සැලැස්ම අනුමැතිය සඳහා 2022.09.14 දින ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව වෙත භාරදෙන ලද අතර, 2023.02.10 දින ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ අනුමැතිය ලබාදෙන ලදී. ඒ අනුව ලං.වි.ම. දිගු කාලීන ජනන ව්‍යාපෘති සැලැස්ම (2023-2042) තුළ සැලසුම් කරන ලද පරිදි නව ජනන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ කටයුතු ඉදිරියට සිදු කර ගෙන යමින් පවතී.

ලං.වි.ම. දිගු කාලීන ජනන ව්‍යාප්ති සැලැස්ම 2024 සිට 2026 වසර දක්වා විදුලි පද්ධතිය වෙත පහත සඳහන් පරිදි විදුලි බලාගාර එක් කිරීමට සැලසුම් කර ඇත.

වගුව 2.1.15

දිගුකාලීන ජනන ව්‍යාප්ති සැලැස්මට (2023-2042) අනුව 2024 සිට 2026 දක්වා විදුලිබල පද්ධතියට එකතු කිරීමට සැලසුම් කර ඇති ධාරිතාවන්.

	විදුලි බලාගාර තාක්ෂණය	ධාරිතාවය (මෙ.වො.)
01	පුනර්ජනනීය (ප්‍රධාන ජල, කුඩා ජල, සුළං, සූර්ය, ඩෙන්ඩ්‍රෝ සහ ජෛවස්කන්ධ)	2,199
02	ස්වාධීන බැටරි බලශක්ති ගබඩාව	100
03	සූර්ණ පහසුකම් සහිත ජාලගත සූර්ය පැනල (බැටරි බලශක්ති ගබඩාව සහිත)	200
04	ස්වභාවික වායු සහ ස්වභාවික වායු ඒකාබද්ධ චක්‍රීය විදුලි බලාගාරය	665
05	නව වායු ටර්බයින	130
	එකතුව	**3,294**

දිගුකාලීන ජනන ව්‍යාප්ති සැලැස්ම (LTGEP) 2023-2042

2.2 2024 වර්ෂය තුළ බලශක්ති අංශයේ කාර්යසාධනය

සමස්තයක් වශයෙන් ගත් කල ජනතාවගේ අවශ්‍යතා දිනෙන් දින ඉහළ යමින් පවතී. එම අවශ්‍යතා සපුරාලීම සඳහා ඉවහල් වන සාධක අතරින් ඛනිජ තෙල් ප්‍රමුඛස්ථානයක් ගනී. රටෙහි ඛනිජ තෙල් අවශ්‍යතාවය සපුරාලමින් කාර්යක්ෂම සේවයක් පාරිභෝගික ජනතාව වෙත සැපයීම අරමුණු කර ගනිමින් ඊට අවශ්‍ය ප්‍රතිපත්තිමය මගපෙන්වීම සඳහා බලශක්ති අමාත්‍යාංශය යටතේ වන බලශක්ති අංශය මඟින් 2024 වර්ෂය තුළ දී ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරන ලදී.

ඒ අනුව, 2024 වර්ෂය තුළ ගෝලීය ඉන්ධන මිල ප්‍රවනතා ශ්‍රී ලංකාවේ ඉන්ධන මිල කෙරෙහි දක්වන ලද බලපෑම, දේශීය ඉන්ධන ඉල්ලුම සපුරාලීමට දක්වන ලද දායකත්වය, ඛනිජ තෙල් කර්මාන්තය නියාමනය සඳහා ගනු ලැබූ ක්‍රියාමාර්ග හා ඛනිජ තෙල් ක්ෂේත්‍රයේ යටිතල පහසුකම් සංවර්ධනය වෙනුවෙන් අමාත්‍යාංශය ගනු ලැබූ ක්‍රියා මාර්ගවලට අදාළ කාර්යසාධනය මෙම පරිච්ඡේදය මඟින් ඉදිරිපත් කර ඇත.

2.2.1 ශ්‍රී ලංකාවේ ඛනිජ තෙල් අංශයේ තොරතුරු ලුහුඬින් 2024

සමස්ත පිරිපහදු කළ ඛනිජ තෙල් නිෂ්පාදන ආනයනය	මෙ.ටො. 3,188,771
සමස්ත බොර තෙල් ආනයනය	මෙ.ටො. 1,519,284
සපුගස්කන්ද පිරිපහදුවේ නිෂ්පාදනය	මෙ.ටො. 1,294,963
සමස්ත ඛනිජ තෙල් නිෂ්පාදන වල ආනයන පිරිවැය	ඇමරිකන් ඩොලර් මිලියන 3,263.562
සමස්ත ඛනිජ තෙල් නිෂ්පාදන වල අලෙවිය	මෙ.ටො. 4,470,060
ඉන්ධන පිරවුම්හල් සංඛ්‍යාව	1,535
ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගමේ සමස්ත ගබඩා ධාරිතාවය	මෙ.ටො. 440,147

2.2.2 ගෝලීය ඛනිජ තෙල් මිල ප්‍රවනතා ශ්‍රී ලංකාවේ ඉන්ධන මිල කෙරෙහි ඇති කරන ලද බලපෑම

අ. ගෝලීය ඛනිජ තෙල් මිල ප්‍රවනතා

ජාත්‍යන්තර ඉන්ධන මිල ගණන් දේශීය ඉන්ධන මිල කෙරෙහි සෘජු බලපෑමක් සිදු කරන අතර, 2024 වසර තුළ ආසියා පැසිෆික් කලාපයේ බොරතෙල් සහ පිරිපහදු ඉන්ධන මිලෙහි පහත හැසිරීම් නිරීක්ෂණය කළ හැකිය.

වගුව 2.2.1
ආසියා පැසිෆික් කළාප බොරතෙල් සහ පිරිපහදු කළ නිෂ්පාදන ප්‍රකාශිත මිල ගණන් 2024

මාසය	බැරලයක මිල (ඇමරිකන් ඩොලර්)				
	පෙට්‍රල් 92 ඔක්ටේන්	පෙට්‍රල් 95 ඔක්ටේන්	ඔටෝ ඩීසල්	සුපර් ඩීසල්	බොරතෙල්
ජන	91.195	95.978	102.832	101.162	83.32
පෙබ	95.591	100.161	106.523	104.983	77.68
මාර්තු	97.142	101.440	103.859	102.875	79.06
අප්‍රේල්	102.126	106.472	104.705	103.522	80.99
මැයි	91.130	95.498	97.318	95.753	84.52
ජූනි	87.935	93.078	98.085	97.642	89.14
ජූලි	92.134	96.541	99.303	98.994	83.93
අගෝ	84.702	88.938	92.214	90.692	82.52
සැප්	78.448	82.858	84.329	83.358	83.80
ඔක්	79.755	85.932	87.915	87.426	77.94
නොවැ	79.088	84.509	89.230	89.098	73.41
දෙසැ	81.352	84.640	88.473	88.905	74.87

මූලාශ්‍රය : S&P global commodity insights

2024 වර්ෂය තුළ ඉහත සඳහන් සිංගප්පූරු ප්ලැට්ස් (Singapore Platts) මිල ගණන් සැළකිල්ලට ගැනීමේදී,

- බොරතෙල් බැරලයක ඉහළම අගය වන ඇමරිකන් ඩොලර් 89.14 ක් ජූනි මාසයේදීත් අවම අගය වන ඇමරිකන් ඩොලර් 73.41 ක් නොවැම්බර් මාසයේදීත් වාර්තා වූ අතර බොරතෙල් බැරලයක සාමාන්‍ය මිල ඇමරිකන් ඩොලර් 80.93 ක් ලෙස වසර තුළ හඳුනා ගන්නා ලදී.

- පෙට්‍රල් 92 ඔක්ටේන් බැරලයක ඉහළම අගය වන ඇමරිකන් ඩොලර් 102.23 ක් අප්‍රේල් මාසයේදීත් අවම අගය වන ඇමරිකන් ඩොලර් 78.45 ක් සැප්තැම්බර් මාසයේදීත් වාර්තා වූ අතර පෙට්‍රල් 92 ඔක්ටේන් බැරලයක සාමාන්‍ය මිල ඇමරිකන් ඩොලර් 88.38 ක් ලෙස වසර තුළ හඳුනා ගන්නා ලදී.

- පෙට්‍රල් 95 ඔක්ටේන් බැරලයක ඉහළම අගය වන ඇමරිකන් ඩොලර් 106.47 ක් අප්‍රේල් මාසයේදීත් අවම අගය වන ඇමරිකන් ඩොලර් 82.86 ක් සැප්තැම්බර් මාසයේදීත් වාර්තා වූ අතර පෙට්‍රල් 95 ඔක්ටේන් බැරලයක සාමාන්‍ය මිල ඇමරිකන් ඩොලර් 93 ක් ලෙස වසර තුළ හඳුනා ගන්නා ලදී.

- ඔටෝ ඩීසල් බැරලයක ඉහළම අගය වන ඇමරිකන් ඩොලර් 106.52 ක් පෙබරවාරි මාසයේදීත් අවම අගය වන ඇමරිකන් ඩොලර් 84.33 ක් සැප්තැම්බර් මාසයේදීත් වාර්තා වූ අතර ඔටෝ ඩීසල් බැරලයක සාමාන්‍ය මිල ඇමරිකන් ඩොලර් 96.23 ක් ලෙස වසර තුළ හඳුනා ගන්නා ලදී.

- සුපර් ඩීසල් බැරලයක ඉහළම අගය වන ඇමරිකන් ඩොලර් 104.98 ක් පෙබරවාරි මාසයේදීත් අවම අගය වන ඇමරිකන් ඩොලර් 83.36 ක් සැප්තැම්බර් මාසයේදීත් වාර්තා වූ අතර සුපර් ඩීසල් බැරලයක සාමාන්‍ය මිල ඇමරිකන් ඩොලර් 95.36 ක් ලෙස වසර තුළ හඳුනා ගන්නා ලදී.

ආ. ගෝලීය මිල ශ්‍රී ලංකාවේ ඉන්ධන මිල කෙරෙහි ඇති කරන ලද බලපෑම

ශ්‍රී ලංකාව පූර්ණ වශයෙන් ඛනිජ තෙල් නිෂ්පාදන ආනයනය මත රඳා පවතින බැවින් ජාත්‍යන්තර ඉන්ධන මිල ගණන් දේශීය ඉන්ධන මිල කෙරෙහි සෘජුවම බලපෑමක් ඇති කරනු ලැබේ. පෙට්‍රල් ඔක්ටේන් 92 සහ ඔටෝ ඩීසල් සඳහා ඉහළ දෛනික අලෙවියක් පවතින බැවින් එම ඉන්ධනවල ගෝලීය මිල උච්චාවචනයන් සෘජුවම දේශීය ඉන්ධන මිල කෙරෙහි බලපෑමක් ඇති කරනු ලැබේ. කෙසේ වෙතත්, පෙට්‍රල් ඔක්ටේන් 95 සහ සුපර් ඩීසල්වල දෛනික අලෙවිය සුළු ප්‍රමාණයක් වන බැවින් ජාත්‍යන්තර මිල වෙනස් වූ පමණින්ම දේශීය මිල වෙනස් වීමක් දක්නට නොලැබේ.

2.2.3 ඛනිජ තෙල් නිෂ්පාදන ආනයනය, ආනයන පිරිවැය සහ අලෙවිය

අ. ඛනිජ තෙල් නිෂ්පාදන ආනයනය සහ ආනයන පිරිවැය

ආර්ථික අර්බුදයෙන් පසු ආර්ථික ක්‍රියාකාරකම් යථා තත්ත්වයට පත්වීම සහ විදේශ විනිමය අර්බුදය සමනය වීම සමඟම 2024 වසරේදී ඛනිජ තෙල් නිෂ්පාදන ආනයන කටයුතු විධිමත් විය. ඒ අනුව දේශීය ඛනිජ තෙල් අවශ්‍යතාවය සපුරාලීම සඳහා 2024 වර්ෂය තුළ දී බොරතෙල් ඇතුළු ඛනිජ තෙල් නිෂ්පාදන 08 කින් මෙට්‍රික් ටොන් 4,708,055 ක ප්‍රමාණයක් ලංකා ඛනිජ තෙල් සංස්ථාව ඇතුළු ප්‍රධාන සැපයුම්කාර ආයතන පහ (05) විසින් ආනයනය කර සපයන ලද අතර ඒ සඳහා ඇමරිකන් ඩොලර් මිලියන 3,263.562 ක් වැය කර ඇත.

වගුව 2.2.2
ඛනිජ තෙල් නිෂ්පාදන ආනයනය 2024

නිෂ්පාදනය	නිෂ්පාදන ප්‍රමාණය (මෙ.ටො.)					එකතුව
	ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව	ලංකා ඉන්දියානු තෙල් සමාගම	සිනොපෙක් එනර්ජි ලංකා පුද්ගලික සමාගම	ආර්.එම්. පාර්ක් පුද්ගලික සමාගම	යුනයිටඩ් පෙට්‍රෝලියම් පුද්ගලික සමාගම	
බොර තෙල්	1,519,284					1,519,284
ලංකා ඔටෝ ඩීසල්	507,054	286,197	151,884	104,270	15,137	1,064,542
ලංකා සුපර් ඩීසල්	26,945	11,140	6,067	6,283	2,958	53,393
පෙට්‍රල් 92 ඔක්ටේන්	585,708	269,701	149,277	100,070	15,059	1,119,815

පෙට්‍රල් 95 ඔක්ටේන්	19,540	12,570	5,133	5,926	2,937	46,106
ගුවන් යානා ඉන්ධන	315,811	-	-	-	-	315,811
අඩු සල්ෆර් දැවිතෙල් :180 CST	35,468	332,900	186,199	-	-	554,567
මැරීන් ගෑස් තෙල්	-	34,537	-	-	-	34,537
එකතුව	3,049,576	947,045	498,560	216,549	36,091	**4,708,055**

මූලාශ්‍ර: ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, ලංකා ඉන්දියානු තෙල් සමාගම, සිනොපෙක් එනර්ජි ලංකා පුද්ගලික සමාගම, ආර්.එම්.පාර්ක් සමාගම, යුනයිටඩ් පෙට්‍රෝලියම් පුද්ගලික සමාගම

වගුව 2.2.3
ඛනිජ තෙල් නිෂ්පාදන ආනයන පිරිවැය 2024

නිෂ්පාදනය	ආනයන පිරිවැය (ඇ.ඒ.ජ.ඩො. මිලියන)					
	ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව	ලංකා ඉන්දියානු තෙල් සමාගම	සිනොපෙක් එනර්ජි ලංකා පුද්ගලික සමාගම	ආර්.එම්. පාර්ක් පුද්ගලික සමාගම	යුනයිටඩ් පෙට්‍රෝලියම් පුද්ගලික සමාගම	එකතුව
බොර තෙල්	981.140					981.140
ලංකා ඔටෝ ඩීසල්	381.099	213.325	114.96	75.577	11.334	796.295
ලංකා සුපර් ඩීසල්	19.805	8.366	4.75	4.839	2.227	39.987
පෙට්‍රල් 92 ඔක්ටේන්	470.652	216.917	124.484	77.981	12.322	902.356
පෙට්‍රල් 95 ඔක්ටේන්	16.706	10.538	4.311	5.136	2.518	39.209
ගුවන් යානා ඉන්ධන	245.417	-	-	-	-	245.417
අඩු සල්ෆර් දැවිතෙල් (180 CTS)	21.293	211.892	-	-	-	233.185
මැරීන් ගෑස් තෙල්	-	25.973	-	-	-	25.973
එකතුව	2,137.701	687.011	248.505	163.533	28.401	**3,263.562**

මූලාශ්‍ර: ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, ලංකා ඉන්දියානු තෙල් සමාගම, සිනොපෙක් එනර්ජි ලංකා පුද්ගලික සමාගම, ආර්.එම්.පාර්ක් සමාගම, යුනයිටඩ් පෙට්‍රෝලියම් පුද්ගලික සමාගම

ආ. ඛනිජ තෙල් නිෂ්පාදන අලෙවිය

ජාතික ආර්ථිකයේ සියළු අංශයන්හි එනම් ප්‍රවාහන, විදුලි බල සැපයුම, කර්මාන්ත, කෘෂිකර්ම, ධීවර යනාදී අංශයන්හි ක්‍රියාකාරිත්වය බලශක්තිය සැපයුම මත රඳා පවතින බැවින් එම අංශවල සුමට ක්‍රියාකාරිත්වයක් පැවතීම සඳහා, ඉල්ලුමට සරිලන සැපයුමක් පවත්වාගෙන යාම අත්‍යාවශ්‍ය වේ. ඒ අනුව එක් එක් ඉන්ධන සැපයුම්කරු විසින් 2024 වර්ෂයේ දී ඛනිජ තෙල් නිෂ්පාදන අලෙවිය සඳහා දක්වන ලද දායකත්වය පහතින් දැක්වේ. 2024 වසරේදී සමස්ත ඛනිජ තෙල් නිෂ්පාදන අලෙවිය මෙට්‍රික් ටොන් 4,470,063 ක් විය.

වගුව 2.2.4
බනිජ තෙල් නිෂ්පාදන අලෙවිය 2024

නිෂ්පාදනය	අලෙවි ප්‍රමාණය (මෙ.ටො.)					එකතුව (මෙ.ටො.)
	ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාව	ලංකා ඉන්දියානු තෙල් සමාගම	සිනොපෙක් එනර්ජි ලංකා පුද්ගලික සමාගම	ආර්.එම්. පාර්ක් සමාගම	යුනයිටඩ් පෙට්‍රෝලියම් පුද්ගලික සමාගම	
පෙට්‍රල් 92 ඔක්ටේන්	804,419	253,821	157,631	81,710	17,064	1,314,645
පෙට්‍රල් 95 ඔක්ටේන්	20,893	14,583	4,355	2,974	632	43,437
ලංකා ඔටෝ ඩීසල්	1,025,160	279,474	170,385	82,395	14,760	1,572,174
ලංකා සුපර් ඩීසල්	23,531	9,621	5,482	3,880	707	43,221
ලංකා භූමිතෙල්	134,580	-	-	-	-	134,580
ලංකා කර්මාන්ත භූමිතෙල්	4,134	-	-	-	-	4,134
ලංකා රසායනික නැප්තා	101,541	-	-	-	-	101,541
ලංකා දැව් තෙල් 800	6	-	-	-	-	6
ලංකා දැව්තෙල් 1500 (වැඩි සල්ෆර්)	116,652	-	-	-	-	116,652
ලංකා දැව්තෙල් 1500 (අඩු සල්ෆර්)	155,816	306,262	-	-	-	462,078
ලංකා දැව්තෙල් සුපර්	155,857	-	-	-	-	155,857
ගුවන් යානා ඉන්ධන	468,158	-	-	-	-	468,158
සොල්වන්ට් (SBP) ද්‍රාවණය	1,161	-	-	-	-	1,161
ද්‍රවීකෘත බනිජ තෙල් වායු	19,676	-	-	-	-	19,676
ලංකා AV ගෑස්	132	-	-	-	-	132
මැරීන් ගෑස් තෙල්	-	32,608	-	-	-	32,608
එකතුව	**3,031,716**	**896,372**	**337,853**	**17,959**	**33,163**	**4,470,063**

මූලාශ්‍ර: ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාව, ලංකා ඉන්දියානු තෙල් සමාගම, සිනොපෙක් එනර්ජි ලංකා පුද්ගලික සමාගම, ආර්.එම්.පාර්ක් සමාගම, යුනයිටඩ් පෙට්‍රෝලියම් පුද්ගලික සමාගම

ගුවන් යානා ඉන්ධන (ජෙට් ඒ 1) අලෙවිය

ශ්‍රී ලංකාවේ ගුවන් යානා ඉන්ධන එකම සැපයුම්කරු වශයෙන් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව ජාතික ආර්ථිකයේ ප්‍රධාන කොටස්කරුවෙකු බවට පත්ව ඇත. බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළ (BIA), මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපොළ (MIA), රත්මලාන ගුවන් තොටුපොළ සහ පලාලි ගුවන් තොටුපොළ යන ගුවන් තොටුපොළ හතර සඳහා ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ගුවන් යානා ඉන්ධන අංශය මඟින් සිය සේවා සපයනු ලබයි.

2024 වසරේ දී මෙට්‍රික් ටොන් 468,158 ක සමස්ථ ගුවන් යානා ඉන්ධන අලෙවියක් වාර්තා කර ඇති අතර දෛනිකව මෙට්‍රික් ටොන් 1,283 ක පමණ සාමාන්‍ය ඉල්ලුමක් පවතී. 2023 වසරට සාපේක්ෂව 2024 වසර තුළදී 24% ක වර්ධනයක් පෙන්නුම් කරයි. 2021 2024 කාලය තුළදී ගුවන් යානා ඉන්ධන අලෙවිය පිළිබඳ තොරතුරු පහතින් දක්වා ඇත.

වගුව 2.2.5
ගුවන් යානා ඉන්ධන අලෙවිය (2021 2024)
ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

වර්ෂය	ප්‍රමාණය (මෙ.ටො.)
2021	223,854
2022	245,838
2023	377,608
2024	468,158

මූලාශ්‍රය : ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

ලිහිසි තෙල් අලෙවිය

ලිහිසි තෙල් කර්මාන්තය යනු කර්මාන්ත ක්ෂේත්‍රයේ පවතින වඩා තරඟකාරී මෙන්ම ක්‍රමෝපායික ව්‍යාපාරයකි. ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සිපෙට්කෝ සන්නාමය යටතේ සිය නිෂ්පාදන අලෙවි කරනු ලබන අතර ජත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව සිය නිෂ්පාදන ඉදිරිපත් කරනු ලැබේ.

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව 2021 වර්ෂයේ සිට 2024 වර්ෂයේ සිදු කරන ලද ලිහිසි තෙල් අලෙවි ප්‍රමාණයන් පහතින් දක්වා ඇත. එම දත්ත අනුව 2022 වර්ෂයේ ලිහිසි තෙල් අංශයෙහි කැපී පෙනෙන පහළ යාමක් දක්නට ලැබෙන අතර 2023 හා 2024 වර්ෂයන්හිදී නැවතත් ක්‍රමයෙන් වෙළෙඳපොළ තුළ සිය ව්‍යාපාර ප්‍රකෘතිමත් කර ගැනීමක් දක්නට ලැබේ.

වගුව 2.2.6
ලිහිසි තෙල් අලෙවිය (2021 2024)
ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

වර්ෂය	ප්‍රමාණය (කිලෝ ලීටර්)
2021	3,809
2022	901
2023	1,310
2024	1,538

මූලාශ්‍රය : ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

2.2.4 බොරතෙල් ආනයනය සහ පිරිපහදු කිරීම

දිනකට බොර තෙල් බැරල් 38,000 ක පිරිපහදු ධාරිතාවක් සහිතව සපුගස්කන්ද ඉන්ධන පිරිපහදුව වර්ෂ 1969 දී ස්ථාපිත කරන ලදී. ඉන් පසු දෛනිකව බොරතෙල් බැරල් 50,000 ක ධාරිතාවක් දක්වා වර්ධනය වන පරිදි මෙම පිරිපහදුව වරින්වර නවීකරණයන්ට භාජනය කර ඇත. වර්තමානයේ රට තුළ බොරතෙල් පිරිපහදු කිරීම තුළින් රටෙහි සමස්ත වාර්ෂික ඛනිජ තෙල් ඉල්ලුමෙන් 1/3 ක් පමණ ප්‍රමාණයකට පිරිපහදුවේ මුළු නිෂ්පාදනය දායක වේ. පෙට්‍රල්, ඔටෝ ඩීසල්, දැව් තෙල්, භූමිතෙල්, ද්‍රවීකෘත වායු, ගුවන් යානා ඉන්ධන, තාර, කෙමිකල් නැප්තා සහ සොල්වන්ට්ස් යනාදී නිමි භාණ්ඩ පිරිපහදුවෙන් නිෂ්පාදනය කරනු ලැබේ.

2019 සිට 2024 දක්වා කාලය තුළ බොරතෙල් ආනයන විස්තර 2.2.7 වගුව මඟින් දැක්වෙන අතර එම කාලය තුළ පිරිපහදුව මඟින් නිෂ්පාදිත ඛනිජ තෙල් නිෂ්පාදන ප්‍රමාණයන් පිළිබඳ විස්තර වගුව 2.2.8 මඟින් දක්වා ඇත.

වගුව 2.2.7
බොරතෙල් ආනයනය (2019 -2024)
ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

වර්ෂය	ප්‍රමාණය (මෙ.ටො.)	ආනයන වටිනාකම (රු. මිලියන)
2019	1,843,000	172,542
2020	1,666,000	98,277
2021	1,130,000	101,306
2022	743,000	180,019
2023	1,666,000	364,098
2024	1,519,284	322,404

මූලාශ්‍රය : ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

2022 වර්ෂයේ දී බොරතෙල් මෙ.ටො. 743,000 ක ප්‍රමාණයක් ආනයනය කර ඇති අතර එය 2023 වර්ෂය වන විට බොරතෙල් මෙ.ටො. 1,666,000 ක් දක්වා වැඩි වී ඇත. ඒ අනුව 2022 වර්ෂයට සාපේක්ෂව 2023 වර්ෂයේ බොරතෙල් ආනයනය 124% ක වර්ධනයක් පෙන්නුම් කරයි. 2024 වර්ෂය වන විට බොරතෙල් ආනයනය මෙ.ටො. 1,519,284 ක් දක්වා නැවතත් අඩු වී ඇත.

වගුව 2.2.8
දේශීයව පිරිපහදු කරන ලද ඛනිජ තෙල් නිෂ්පාදන (2019 2024)
ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

නිෂ්පාදනය	ප්‍රමාණය (මෙ.ටො.)					
	2019	2020	2021	2022	2023	2024
බොරතෙල් යෙදවුම් ප්‍රමාණය	1,902,357	1,685,441	1,272,207	529,773	1,677,033	1,543,836
පෙට්‍රල් 92 ඔක්ටේන්	185,915	164,416	124,092	38,666	171,186	150,665
ඔටෝ ඩීසල්	624,462	537,645	370,594	128,165	505,675	443,933
දැව් තෙල්	468,843	465,419	359,021	194,197	482,126	345,447
දැව් තෙල් 800 නැව් තෙල්						82,000
භූමිතෙල්	8,369	109,165	98,284	25,289	49,484	72,618
නැප්තා	162,019	156,953	106,956	30,835	129,058	121,449
තාර	17,103	13,561	6,879			
LPගෑස්	26,988	25,251	16,650	5,687	23,800	20,815
ජෙට් A 1	258.986	157,279	130,572	57,346	233,652	207,434
SBP ද්‍රාවණය	1,660	897	3,037	2,690	1,524	1,267
එකතුව	**1,754,345**	**1,630,586**	**1,216,085**	**482,875**	**1,596,505**	**1,294,963**

මූලාශ්‍ර : ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් 2024 වසර තුළ දී බොරතෙල් මෙ.ටො. 1,543,836 ක් උපයෝගී කර ගනිමින් ඛනිජ තෙල් මෙ.ටො. 1,294,963 ක් පිරිපහදු කරන ලද අතර එම ප්‍රමාණය ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ සමස්ත පිරිපහදු කළ ඛනිජ තෙල් නිෂ්පාදනවලින් 44% කි. ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් 2024 වසර තුළ පිරිපහදු කළ ඛනිජ තෙල් ආනයන ප්‍රමාණ හා දේශීයව පිරිපහදු කළ ඛනිජ තෙල් නිෂ්පාදන ප්‍රමාණ වගුව 2.2.9 මඟින් දක්වා ඇත.

වගුව 2.2.9
ආනයනික නිමි නිෂ්පාදන සහ දේශීයව පිරිපහදු කළ නිෂ්පාදන පිළිබඳ විස්තර 2024
ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

නිෂ්පාදනය	ආනයනය කළ පිරිපහදු නිෂ්පාදන (මෙ.ටො.)	සපුගස්කන්ද පිරිපහදු නිෂ්පාදන (මෙ.ටො.)	එකතුව (මෙ.ටො.)	දේශීයව පිරිපහදු කළ නිෂ්පාදන
ලංකා ඔටෝ ඩීසල්	507,378	443,933	991,311	47%
ලංකා සුපර් ඩීසල්	26,944	-	26,944	-
පෙට්‍රල් 92 ඔක්ටේන්	585,708	150,665	736,274	20%
පෙට්‍රල් 95 ඔක්ටේන්	19,540	-	19,540	-
භූමිතෙල්	-	72,618	72,618	100%
ජෙට් ඒ 1	315,811	207,434	523,245	40%
නැප්තා	-	121,449	121,449	100%
LP ගෑස්	-	20,815	20,815	100%
SBP ද්‍රාවණය	-	1,267	1,267	100%
දැවිතෙල් 800 සුපර්	-	345,447	345,447	100%
දැවිතෙල් 800 නැව් තෙල්	-	82,000	82,000	100%
දැවිතෙල් 180	35,468	-	35,468	-
එකතුව	**1,530,849**	**1,294,963**	**2,936,477**	**44%**

මූලාශ්‍රය : ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

ඉන්ධන ගබඩා කිරීම

ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම කොලොන්නාව හා මුතුරාජවෙල ප්‍රධාන පර්යන්ත දෙකක හා ප්‍රාදේශීය තොග ගබඩා 11 ක ඉන්ධන ගබඩා පහසුකම් පවත්වාගෙන යනු ලබයි. ඒ අනුව කොලොන්නාව පර්යන්තයේ මෙට්‍රික් ටොන් 224,649 ක ඉන්ධන ගබඩා ධාරිතාවයක් ද මුතුරාජවෙල පර්යන්තයේ මෙට්‍රික් ටොන් 202,358 ක් ද හා ප්‍රාදේශීය තොග ගබඩා 11 හි මෙට්‍රික් ටොන් 13,140 ක් වශයෙන් මෙට්‍රික් ටොන් 440,147 ක සමස්ත ඉන්ධන ගබඩා ධාරිතාවයක් රට තුළ පවත්වාගෙන යනු ලැබේ. ඒ අනුව, මෙම ප්‍රධාන පර්යන්ත දෙක හා ප්‍රාදේශීය තොග ගබඩා 11 මඟින් 2024 වර්ෂය තුළ ඉන්ධන ගබඩා කිරීම සඳහා සක්‍රීය දායකත්වයක් සපයන ලද අතර සමස්ත ඉන්ධන ගබඩා ධාරිතාවය පහත වගුව මඟින් දක්වා ඇත.

වගුව 2.2.10
සමස්ත ඉන්ධන ගබඩා ධාරිතාවය
ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම

නිෂ්පාදනය	ගබඩා ධාරිතාවය (මෙ.ටො.)			එකතුව
	කොලොන්නාව පර්යන්තය	මුතුරාජවෙල පර්යන්තය	ප්‍රාදේශීය තොග ගබඩා	
නැප්තා	11,996	-	-	11,996
ඔක්ටේන් 95 පෙට්‍රල්	23,197	-	-	23,197
ඔක්ටේන් 92 පෙට්‍රල්	59,321	83,857	3,346	146,524
භූමිතෙල්	9,813	-	680	10,493
ගුවන් යානා ඉන්ධන	9,484	-	-	9,484
ඔටෝ ඩීසල්	46,074	118,501	9,114	173,689
සුපර් ඩීසල්	18,319	-	-	18,319
දැව් තෙල්	44,575	-	-	44,575
සොල්වන්ට්	341	-	-	341
කාර්මික භූමිතෙල්	1,529	-	-	1,529
එකතුව	**224,649**	**202,358**	**13,140**	**440,147**

මූලාශ්‍රය: ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම

ඉන්ධන බෙදාහැරීම්

2024 වර්ෂය වන විට ඉන්ධන සැපයුම්කාර ආයතන පහක් ඉන්ධන බෙදාහැරීමේ කටයුතුවල නිරත වන අතර ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම එම ආයතනවල ඉන්ධන අවශ්‍යතාවයන් අනුව ඉන්ධන බෙදාහැරීම සිදු කරනු ලැබේ. ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගමේ කොළොන්නාව සහ මුතුරාජවෙල යන ප්‍රධාන පර්යන්ත දෙක ඇතුළු ප්‍රාදේශීය ඉන්ධන ගබඩා වෙතින් ඉන්ධන සැපයුම්කාර ආයතන/සමාගම් වෙත ඉන්ධන නිකුත් කිරීම සිදු කරනු ලබන අතර 2024 වර්ෂය තුළ දී ඊට අදාළ ප්‍රගතිය පහත වගුව 2.2.11 මඟින් දක්වා ඇත.


ඒ අනුව 2024 වර්ෂය තුළ වාර්තා කරනු ලබන මුළු බෙදාහැරීම් ප්‍රමාණය කිලෝ ලීටර් 4,178,575 ක් වන අතර එම බෙදාහැරීම් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ඉන්ධන කිලෝ ලීටර් 3,159,547 ක් ද, ලංකා ඉන්දියානු තෙල් සමාගම් ඉන්ධන කිලෝ ලීටර් 318,331 ක් ද සිනොපෙක් සමාගමේ ඉන්ධන කිලෝ ලීටර් 439,422 ක් ද ආර්.එම්.පාර්ක් සමාගමේ ඉන්ධන කිලෝ ලීටර් 218,493 ක් ද හා යුනයිටඩ් පෙට්‍රෝලියම් සමාගමේ ඉන්ධන කිලෝ ලීටර් 42,781 කින් ද සමන්විත වේ. ඒ අනුව, ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගමේ සමස්ථ ඉන්ධන බෙදා හැරීම්වලින් 76% ක් ලංකා ඛනිජ තෙල් සංස්ථාව සතු ඉන්ධන වන අතර ඉතිරි 24% ක ප්‍රමාණය ලංකා ඉන්දියානු තෙල් සමාගම, සිනොපෙක් සමාගම, ආර්.එම්.පාර්ක් සමාගම සහ යුනයිටඩ් පෙට්‍රෝලියම් සමාගම සතු ඉන්ධනවලින් සමන්විත වේ.

වගුව 2.2.11
ඉන්ධන බෙදාහැරීමේ ප්‍රගතිය 2024
ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම

නිෂ්පාදනය	ප්‍රමාණය (කි.ලී)					
	ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව	ලංකා ඉන්දියානු තෙල් සමාගම	සිනොපෙක් එනර්ජි ලංකා පුද්ගලික සමාගම	ආර්.එම්. පාර්ක් සමාගම	යුනයිටඩ් පෙට්‍රෝලියම් පුද්ගලික සමාගම	එකතුව
දැව් තෙල්	339,256	-	-	-	-	339,256
ජෙට් ඒ 1	557,515	-	-	-	-	557,515
ලංකා ඔටෝ ඩීසල්	1,074,364	142,085	208,401	98,630	17,371	1,540,852
ලංකා සුපර් ඩීසල්	27,813	3,887	6,966	4,679	832	44,178
නැප්තා	197,241	-	-	-	-	197,241
පෙට්‍රල් 92 ඔක්ටේන්	935,908	160,109	218,092	111,137	23,701	1,448,947
පෙට්‍රල් 95 ඔක්ටේන්	27,449	12,250	5,963	4,046	878	50,586
එකතුව	**3,159,547**	**318,331**	**439,422**	**218,493**	**42,781**	**4,178,575**

මූලාශ්‍රය: ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම

ප්‍රස්ථාරය 2.2.1
ඉන්ධන බෙදාහැරීමේ සංයුතිය 2024
ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම



මූලාශ්‍රය: ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම

වගුව 2.2.12
සමස්ත ඉන්ධන පිරවුම්හල් සංඛ්‍යාව (2024.12.31 දිනට)

පළාත	ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව	ලංකා ඉන්දියානු තෙල් සමාගම	ආර්.එම්. පාර්ක් සමාගම	සිනොපෙක් එනර්ජී ලංකා පුද්ගලික සමාගම	යුනයිටඩ් පෙට්‍රෝලියම් පුද්ගලික සමාගම	එකතුව
මධ්‍යම පළාත	64	33	10	11	11	129
නැගෙනහිර පළාත	87	18	12	15	10	142
උතුරුමැද පළාත	53	13	9	9	9	93
උතුරු පළාත	96	16	7	8	7	131
වයඹ පළාත	122	28	23	25	28	226
සබරගමුව පළාත	51	18	10	10	10	99
දකුණු පළාත	114	27	11	13	13	178
ඌව පළාත	36	15	8	9	4	72
බස්නාහිර පළාත	201	93	38	47	27	406
එකතුව	**824**	**261**	**128**	**147**	**119**	**1,476**

2.2.5 2024 වර්ෂය තුළ ඛණිජ තෙල් ක්ෂේත්‍රයට අදාළව සිදුකරන ලද නියාමන කාර්යයන්

- **ඛනිජ තෙල් කර්මාන්තය සඳහා නව නියාමකයෙකු හඳුන්වා දීම**

ශ්‍රී ලංකාවේ පසුභාග ඛනිජ තෙල් කර්මාන්තය සඳහා මෙතෙක් පුළුල් නියාමන යාන්ත්‍රණයක් නොතිබූ අතර, පෙට්‍රල්, ඩීසල්, භූමිතෙල්, ගුවන් යානා ඉන්ධන තෙල්, ද්‍රවීකෘත පෙට්‍රෝලියම් වායු (LPG) සහ ලිහිසි තෙල් ඇතුළු ඛනිජ තෙල් නිෂ්පාදන ආනයනය, පිරිපහදු කිරීම, බෙදා හැරීම සහ අලෙවි කිරීම ඇතුළත් ඛනිජතෙල් කර්මාන්තය දැනට පවතින නීති රාමුව තුළ ක්‍රියාත්මක වේ. වර්තමානයේ ඛනිජ තෙල් වෙළඳපොළ ක්‍රියාකාරකම් පුළුල්වීමත් සමඟම නව තරඟකාරී ආයතන වෙළඳපොළට පිවිසීම හේතුවෙන්, නිෂ්පාදනවල ගුණාත්මකභාවය පවත්වාගෙන යාම සහ පාරිභෝගික ආරක්ෂාව තහවුරු කිරීම සඳහා ස්වාධීන නියාමකයෙකු සහ ශක්තිමත් නියාමන රාමුවක අවශ්‍යතාවය පැන නැඟී ඇත.

ඒ අනුව, අංක 24/0691/621/038 හා 2024.04.25 දිනැති අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත පසුභාග ඛනිජ තෙල් කර්මාන්තයට අදාළව ඵලදායී සහ කාර්යක්ෂම නියාමන යාන්ත්‍රණයක් හඳුන්වාදීමට අවශ්‍ය නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා විශේෂඥ කමිටුවක් පත් කරන ලද අතර, එම කමිටුව විසින් පහත යෝජනා ඉදිරිපත් කරන ලදී.

- පසු භාග ඛනිජ තෙල් කර්මාන්තය නියාමනය සහ අධීක්ෂණය සඳහා "ශ්‍රී ලංකා ඛනිජ තෙල් කර්මාන්ත නියාමන කොමිෂන් සභාවක්" පිහිටුවීම,
- ඛනිජ තෙල් කර්මාන්තය සඳහා නියාමන පනතක් සම්මත කිරීම,

අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත ඉහත යෝජනා ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය නීති කෙටුම්පත් කිරීම සඳහා නීති කෙටුම්පත් සම්පාදක වෙත යොමු කර ඇත. ඛනිජ තෙල් කර්මාන්තය නියාමනය කිරීම සම්බන්ධයෙන් නව රජයේ ප්‍රතිපත්තිමය අනුමැතිය ලබා ගැනීමෙන් අනතුරුව ඛනිජ තෙල් කර්මාන්තය සඳහා ස්ථිර නියාමකයෙකු පත් කිරීමට කටයුතු කරනු ලැබේ.

- **ඉන්ධන පිරවුම්හල් ඉදි කිරීම සහ මෙහෙයුම් කටයුතු පවත්වා ගෙන යාම පිළිබඳ මාර්ගෝපදේශ හඳුන්වා දීම**

වර්ෂ 1961 අංක 28 දරන ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථා පනතේ විධිවිධාන ප්‍රකාරව ඛනිජ තෙල් හා ඒ ආශ්‍රිත නිෂ්පාදන ආනයනය සහ බෙදාහැරීම ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව (CPC) විසින් පමණක් සිදු කරන ලදී. කෙසේ නමුත් වෙළඳපොළ ලිහිල්කරණයත් සමඟ ලංකා ඛනිජ තෙල් නීතිගත

සංස්ථාවට (CPC) අමතරව, ලංකා ඉන්දියානු තෙල් සමාගම (LIOC), සිනොපෙක් එනර්ජි ලංකා පුද්ගලික සමාගම (Sinopec), ආර්.එම්.පාර්ක් පුද්ගලික සමාගම සහ යුනයිටඩ් පෙට්‍රෝලියම් ලංකා පුද්ගලික සමාගම යන ආයතන මඟින් ද ඉන්ධන ආනයනය සහ බෙදාහැරීම සිදු කරනු ලැබේ.

නව තරඟකාරී ආයතන වෙළඳපොළට පිවිසීමත් සමඟම, ඉන්ධන පිරවුම්හල් ස්ථාපනය කර පවත්වාගෙන යාමේ අවම ප්‍රමිතීන් ආරක්ෂා කර ගැනීමට පහත ක්ෂේත්‍ර සඳහා මාර්ගෝපදේශ විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය විසින් හඳුන්වා දෙන ලදී.

- ඉන්ධන පිරවුම්හල් ස්ථානගත කිරීමේ නිර්ණායක
- ඉන්ධන පිරවුම්හල් ඉදිකිරීමේ නිර්ණායක
- ඉන්ධන පිරවුම්හල්වල මෙහෙයුම් කටයුතු පවත්වාගෙන යාමේ නිර්ණායක

මෙම මාර්ගෝපදේශ අනුගමනය කරන ලෙසට ඉන්ධන සැපයුම්කාර ආයතන දැනුවත් කර ඇති අතර, මහජනතාවගේ දැන ගැනීම සඳහා අමාත්‍යාංශ වෙබ් අඩවියේ මාර්ගෝපදේශ පළ කරන ලදී. තවද මෙම මාර්ගෝපදේශ අනුව නව ඉන්ධන සැපයුම්කාර ආයතන/ සංස්ථා කටයුතු කරන්නේද යන්න පිළිබඳව අමත්‍යාංශය විසින් අධීක්ෂණය කරනු ලැබේ.

- **ඛනිජ තෙල් නිෂ්පාදන සෘජුවම පාරිභෝගික ආයතන වෙත සැපයීමේ ක්‍රියාවලිය නියාමනය කිරීම**

ඉන්ධන සැපයුම්කාර ආයතන විසින් දිවයින පුරා පිහිටි ඉන්ධන පිරවුම්හල් මඟින් සහ සෘජුවම පාරිභෝගික ආයතන වෙත ඉන්ධන බෙදාහැරීම සිදු කරනු ලැබේ.

පාරිභෝගික සේවා මධ්‍යස්ථාන මඟින් සැලකිය යුතු ඉන්ධන ප්‍රමාණයක් දෛනිකව බෙදාහැරීම සිදු කරනු ලබන බැවින් පාරිභෝගික සේවා මධ්‍යස්ථාන පිහිටුවීමේ ක්‍රියාවලිය විධිමත් කිරීමේ අවශ්‍යතාවය හඳුනා ගන්නා ලදී. ඒ අනුව, දැනට ලියාපදිංචි වී ඇති පාරිභෝගික සේවා මධ්‍යස්ථාන අතරින් තවදුරටත් පවත්වා ගෙන යායුතු මධ්‍යස්ථාන සහ නව ආයතන ලියාපදිංචි කිරීම සඳහා අවම නිර්ණායක හඳුන්වා දීමට අමාත්‍යාංශය විසින් කටයුතු කරන ලදී. අවම නිර්ණායක සම්පූර්ණ කරනු ලබන පාරිභෝගික සේවා මධ්‍යස්ථාන සඳහා ඉන්ධන සැපයුම්කාර ආයතන මාර්ගයෙන් අමාත්‍යාංශයේ අනුමැතිය ලබා දීමට කටයුතු කරන ලදී. 2024.12.31 දිනට ක්‍රියාත්මක පාරිභෝගික සේවා මධ්‍යස්ථාන සංඛ්‍යාව 2.2.13 වගුවේ පරිදි වේ.

වගුව 2.2.13
.පාරිභෝගික සේවා මධ්‍යස්ථාන සංඛ්‍යාව 2024.12.31 දිනට

සැපයුම්කාර සමාගම	පාරිභෝගික සේවා මධ්‍යස්ථාන සංඛ්‍යාව
ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව	1042
ලංකා ඉන්දියානු තෙල් සමාගම	170
සිනොපෙක් එනර්ජි ලංකා පුද්ගලික සමාගම	13
එකතුව	**1225**

මූලාශ්‍ර: ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, ලංකා ඉන්දියානු තෙල් සමාගම,සිනොපෙක් එනර්ජි ලංකා පුද්ගලික සමාගම

- **ඉන්ධන මිල සූත්‍රය ක්‍රියාත්මක කිරීම**

දිගුකාලීනව පැවති අක්‍රමවත් ඉන්ධන මිලකරණ ක්‍රමවේදය තුළින් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව දැඩි මූල්‍ය අර්බුදයකට මුහුණ දුන් අතර, කලින් කලට සිදු කරන ලද මිල සංශෝධනයන් මඟින් ද ඉන්ධන මිලෙහි විශාල උච්චාවචනයන් එකවර සිදු කරනු දක්නට ලැබිණි. මෙම තත්ත්වයන් මගහරවා ගැනීම අරමුණු කර ගෙන 2022 මැයි මස සිට ක්‍රියාත්මක වන පරිදි පිරිවැය ආවරණය වන මිලකරණ සූත්‍රයක් මඟින් ඉන්ධන මිල තීරණය කිරීමට රජය මූලික පියවර ගන්නා ලදී.


2024 වර්ෂයේ දී අවස්ථා එකොළහකදී (11) ඉන්ධන මිල සංශෝධනය කරන ලදී. 2023 වර්ෂයේ දෙසැම්බර් මාසයේ ඉන්ධන මිල ගණන්වලට සාපේක්ෂව 2024 වර්ෂයේ දෙසැම්බර් මාසයේ ඉන්ධන මිල ගණන් සැලකිල්ලට ගැනීමේ දී, පෙට්‍රල් (ඔක්ටේන් 92) 11% කින් ද පෙට්‍රල් (ඔක්ටේන් 95) 17% කින් ද ඔටෝ ඩීසල් 17% කින් ද සුපර් ඩීසල් 31% කින් ද සහ භූමිතෙල් 20% කින් ද ලෙස මිල ගණන්හි අඩුවීමක් දක්නට ලැබේ.


වගුව 2.2.14
2024 වර්ෂය තුළ වාර්තා වූ උපරිම සහ අවම වෙළෙඳපොළ මිල ගණන්


නිෂ්පාදනය	උපරිම මිල	අවම මිල
පෙට්‍රල් (ඔක්ටේන් 92)	රු. 371.00 (පෙබරවාරි/මාර්තු/අප්‍රේල්)	රු.309.00 (දෙසැම්බර්)
පෙට්‍රල් (ඔක්ටේන් 95)	රු. 464.00 (ජනවාරි)	රු.371.00 (නොවැම්බර්/දෙසැම්බර්)
ඔටෝ ඩීසල්	රු. 363.00 (පෙබරවාරි/මාර්තු/අප්‍රේල්)	රු. 283.00 (නොවැම්බර්)
සුපර් ඩීසල්	රු. 475.00 (ජනවාරි)	රු. 313.00 (නොවැම්බර්/දෙසැම්බර්)
භූමිතෙල්	රු. 262.00 (පෙබරවාරි)	රු.183.00 (ඔක්තෝබර්/නොවැම්බර්


මූලාශ්‍ර: ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව


ප්‍රස්තාර 2.2.2
2024 වර්ෂය තුළ වාර්තා වූ වෙළඳපාළ මිල ගණන්




පෙට්‍රල් 95 ඔක්ටේන් මිල
ලීටරයක මිල (රු.)
600
500
400
300
200
100
0
ජන.
පෙබ.
මාර්තු
අප්‍රේල්
මැයි
ජූනි
ජූලි
අගෝ.
සැප්තැ.
ඔක්තෝ.
නොවැ.
දෙසැ.
මාසය
පෙට්‍රල් ලීටරයක මිල - 2023
පෙට්‍රල් ලීටරයක මිල -2024
මූලාශ්‍රය:ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාව


ලංකා ඔටෝ ඩීසල් මිල
ලීටරයක මිල (රු.)
500
400
300
200
100
0
ජන.
පෙබ.
මාර්තු
අප්‍රේල්
මැයි
ජූනි
ජූලි
අගෝ.
සැප්තැ.
ඔක්තෝ.
නොවැ.
දෙසැ.
මාසය
ඩීසල් ලීටරයක මිල -2023
ඩීසල් ලීටරයක මිල - 2024
මූලාශ්‍රය:ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාව


ලංකා සුපර් ඩීසල් මිල
ලීටරයක මිල (රු.)
600
500
400
300
200
100
0
ජන.
පෙබ.
මාර්තු
අප්‍රේල්
මැයි
ජූනි
ජූලි
අගෝ.
සැප්තැ.
ඔක්තෝ.
නොවැ.
දෙසැ.
මාසය
ඩීසල් ලීටරයක මිල -2023
ඩීසල් ලීටරයක මිල - 2024
මූලාශ්‍රය:ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාව



2.2.6 ඛනිජ තෙල් වෙළඳපොළ ස්වභාවය

- **ලිහිසි තෙල් වෙළඳපොළ**

1961 අංක 28 දරණ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථා පනතේ 5(C) වගන්තිය හා ඊට අනුශාංගික සංශෝධිත විධිවිධාන අනුව, ඛනිජ තෙල් නිෂ්පාදනයක් ලෙස ලිහිසි තෙල් නිර්වචනය කර ඇත. ඒ අනුව අදාළ බලතල ප්‍රකාරව 2006.05.08 දිනැති අංක06/0858217/015 දරණ කැබිනට් පත්‍රිකාව (2006.05.24 දිනැති තීරණය) අනුව අංක 1453/6 හා 2006.07.12 දරන අතිවිශේෂ ගැසට් නිවේදනය මඟින් ශ්‍රී ලංකාවේ ලිහිසි තෙල් වෙළඳපොළ සම්පූර්ණයෙන්ම ලිහිල්කරණය කරන ලදී.

ඒ අනුව 2024 වර්ෂය වන විට මෙරට ලිහිසි තෙල් ආනයනය සඳහා ආයතන 34 කට අනුමැතිය ලැබී ඇති අතර ක්‍රියාකාරකම් 5 ක් යටතේ එම ආයතන කටයුතු කරනු ලබයි.

ක්‍රියාකාරකම	විස්තරය	ආයතන ප්‍රමාණය
A1	ලිහිසි තෙල් හා ග්‍රීස් ආනයනය, අපනයනය,විකිණීම, සැපයීම, බෙදාහැරීම, මිශ්‍ර කිරීම හා නිෂ්පාදනය	4
A2	ලිහිසි තෙල් හා ග්‍රීස් ආනයනය, අපනයනය,විකිණීම, සැපයීම හා බෙදාහැරීම	27
B	අමිශ්‍ර සම්ප්‍රේෂණ තෙල් ආනයනය, අපනයනය, විකිණීම, සැපයීම හා බෙදාහැරීම	1
C1	සමුද්‍රීය ලිහිසි තෙල් හා ග්‍රීස් ආනයනය, අපනයනය, විකිණීම, සැපයීම හා බෙදාහැරීම	1
C2	කාර්මික ලිහිසි තෙල් හා ග්‍රීස් ආනයනය, අපනයනය, විකිණීම, සැපයීම හා බෙදාහැරීම	1

- **තාර වෙළඳපොළ**

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ පිරිපහදුව මඟින් තාර නිෂ්පාදනය සිදු කරනු ලබන අතර එය දේශීය ඉල්ලුම සපුරාලීමට ප්‍රමාණවත් නොවන බැවින් පිළිගත් නිර්ණායක මත පදනම්ව තාර ආනයනය කිරීම සඳහා අවසර ලබා දෙනු ලැබේ. ඒ අනුව මෙරට සංවර්ධන කටයුතු වලට අවශ්‍ය වන තාර මෙ.ටො. 163,000 ක් ආනයනය කිරීමට 2024 වර්ෂය තුළදී පෞද්ගලික ආයතන 11 ක් සඳහා අවසර ලබා දී ඇත.

- **නැව් තෙල් වෙළඳපොළ**

නැව් තෙල් වෙළඳාම රටට විදේශ විනිමය සපයන ප්‍රධාන අංශයක් වන අතර මෙම අංශය සංවර්ධනය කෙරෙහි විශේෂ අවධානය යොමු කර ඇත. නැව් තෙල් වෙළඳාමේ නිරතවීම සඳහා අවශ්‍ය අධිකාරී බලය අමාත්‍යාංශය විසින් ලබා දෙනු ලැබේ. ඒ අනුව 2024 වර්ෂය තුළ නැව් තෙල් ආනයනය හා වෙළඳාම් කිරීමට ආයතන 12 කට අනුමැතිය ලබා දී ඇති අතර නැව් තෙල් මෙ.ටො. 1,085,749 ක් පමණ අලෙවි කරන ලදී.

- **ගුවන්යානා ඉන්ධන වෙළඳපොළ**

මෙරට ගුවන් යානා සඳහා භාවිතා කරනු ලබන ජෙට් ඒ 1 ඉන්ධන සැපයීමේ කාර්යය දැනට ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් සිදු කරනු ලබන අතර ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථා පනත ප්‍රකාරව ගුවන් යානා ඉන්ධන සැපයීමේ බලපත්‍ර නිකුත් කිරීමේ අධිකාරී බලය විෂය භාර අමාත්‍යවරයාට හිමිව ඇත. දැනට ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් ජෙට් ඒ 1 ඉන්ධන අවශ්‍යතාවය සපුරන අතර මෙම ඉන්ධන ආනයනයට වෙනත් ආයතන 02 ක් සඳහා ද අනුමැතිය ලබා දී ඇත.

ඛනිජ තෙල් වෙළඳපොළ සඳහා බලපත්‍ර ලබා දීමෙන් ලද බලපත්‍ර ආදායම 2024

ඉන්ධන වර්ගය	විචල්‍ය ගාස්තු ආදායම (රු.)	වාර්ෂික ආදායම (රු.)
ලිහිසි තෙල්	451,793,992.71	217,195,180. 63
තාර	23,590,017.00	21,600,000.00
නැව් තෙල්	-	20,379,415.80
ජෙට් ඒ 1	-	9,144,598.00
එකතුව	475,384,009.71	268,319,194.43

ආයතනයේ නම	ඉන්ධන පිරවුම්හල් ස්ථාපන ගාස්තු (රු./ඇ.ඒ.ජ.ඩො.)
ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව	624,061,000.00
ලංකා ඉන්දියානු තෙල් සමාගම	581,071,400.00
ආර්.එම්. පාර්ක් පුද්ගලික සමාගම	ඇ.ඒ.ජ.ඩො. 2,000,000
සිනොපෙක් ලංකා එනර්ජීස් පුද්ගලික සමාගම	610,806,800.00
යුනයිටඩ් පෙට්‍රෝලියම් පුද්ගලික සමාගම	599,751,000.00

කර්මාන්ත හා සේවා සඳහා මෙරට බලපත්‍රලාභීන් ආනයනය නොකරන ඛනිජ තෙල් ආශ්‍රිත නිෂ්පාදන ආනයනය වෙනුවෙන් විරෝධතාවයක් නොමැති බවට ලිපි නිකුත් කිරීම 2024

මෙරට කර්මාන්ත හා සේවා සඳහා අත්‍යාවශ්‍ය ඛනිජ තෙල් ආශ්‍රිත නිෂ්පාදන ආනයනය කිරීමට ආයතන විසින් අමාත්‍යාංශය වෙත දෛනිකව ඉල්ලීම් ඉදිරිපත් කරන අතර එම ඉල්ලීම් පිළිබඳ අමාත්‍යාංශයේ ප්‍රධානත්වයෙන් පත් කර ඇති කමිටුව විසින් නිර්දේශ ඉදිරිපත් කිරීම සිදු කරයි.

මේ සඳහා කර්මාන්ත අමාත්‍යාංශය, ශ්‍රී ලංකා ආයෝජන සංවර්ධන මණ්ඩලය, රසායනික අවි සම්මුතිය ක්‍රියාත්මක කිරීමේ ජාතික අධිකාරිය සහ ආයතනවල නිර්දේශ ද වෙන වෙනම ලබා ගනී.

ඒ අනුව, 2024 වර්ෂය තුළ පහත කාණ්ඩ යටතේ ආනයන කටයුතු සඳහා බලශක්ති අමාත්‍යාංශය විසින් විරෝධතාවයක් නොමැති බවට ලිපි නිකුත් කර ඇත.

- රබර් ආශ්‍රිත නිෂ්පාදන සඳහා
- ඇඟලුම් ආශ්‍රිත නිෂ්පාදන සඳහා
- රූපලාවන්‍ය ආශ්‍රිත නිෂ්පාදන සඳහා
- තීන්ත ආශ්‍රිත නිෂ්පාදන සඳහා
- වෙනත් කර්මාන්ත ආශ්‍රිත නිෂ්පාදන සඳහා
- වෙනත් කර්මාන්ත හා සේවා ආයතන වෙත අලෙවි කිරීම සඳහා

2.2.7 ඛනිජ තෙල් ආශ්‍රිත යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති

- **අපනයන අභිමුඛ ඛනිජ තෙල් පිරිපහදුවක් සහ ඒ ආශ්‍රිත නිෂ්පාදන සැකසුම් මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම**

හම්බන්තොට ආශ්‍රිතව අපනයන අභිමුඛ ඛනිජ තෙල් පිරිපහදුවක් සහ ඒ ආශ්‍රිත නිෂ්පාදන සැකසුම් මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම සඳහා විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය විසින් 2023.02.24 දින සුදුසුකම්ලත් ආයෝජකයන් වෙතින් අභිලාෂ කැඳවන ලද අතර ඒ සඳහා ආයෝජකයින් හත්දෙනෙකු (07) සිය අභිලාෂ ප්‍රකාශ කරන ලදී. ඉදිරිපත් කරන ලද යෝජනා ඇගයීමට ලක් කිරීමෙන් පසු විස්තරාත්මක යෝජනා ඉදිරිපත් කිරීම සඳහා ආයතන දෙකක් සුදුසුකම් ලබන ලදී. එම ආයතන දෙක අතරින් චයිනා පෙට්‍රෝලියම් සහ කෙමිකල් කෝපරේෂන් (M/s China Petroleum and Chemical Corporation) සමාගම පමණක් විස්තරාත්මක යෝජනාව ඉදිරිපත් කරන ලදී. ව්‍යාපෘති ඇගයීම් කමිටුව හා අමාත්‍ය මණ්ඩලය පත් කරන ලද සාකච්ඡා සම්මුති කමිටුව විසින් මෙම විස්තරාත්මක යෝජනාව සලකා බැලීමෙන් අනතුරුව, පිරිපහදුව ඉදිකර පවත්වාගෙන යාමට චයිනා පෙට්‍රෝලියම් සහ කෙමිකල් කෝපරේෂන් ආයතනය සමඟ ගිවිසුම් ගත වීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගන්නා ලදී. ඒ අනුව චයිනා පෙට්‍රෝලියම් සහ කෙමිකල් කෝපරේෂන් ආයතනය සමඟ ගිවිසුම් ගත වීම සඳහා සාකච්ඡා වට හතරක් පවත්වන ලද අතර සාකච්ඡා අවසන් අදියරේ පවතී.

ව්‍යාපෘතියේ ප්‍රධාන ලක්ෂණ

- අපේක්ෂිත ධාරිතාවය දිනකට අවම බොරතෙල් බැරල් ලක්ෂයක් පිරිපහදු කිරීම
- අපේක්ෂිත ආයෝජනය ඇ.එ.ජ.ඩො. බිලියන 1.5 ත් 2 ත් අතර
- ව්‍යාපෘතිය නිමකිරීමට අපේක්ෂිත කාලය (2024 2028)


මෙම ව්‍යාපෘතිය මඟින් රට තුළ ඉන්ධන සුරක්ෂිතතාවය තහවුරු කිරීම, නව රැකියා අවස්ථා උදාකිරීම, ඛනිජ තෙල් කර්මාන්තය ආශ්‍රිත නව කර්මාන්ත අවස්ථා බිහිවීම මෙන්ම විදේශ විනිමය වාසියක් මෙරටට ලබා ගැනීමට අපේක්ෂා කරනු ලැබේ.

- **ත්‍රිකුණාමලය තෙල් ටැංකි සංවර්ධන ව්‍යාපෘතිය**

ත්‍රිකුණාමලයේ චීන වරායේ ඉහළ ටැංකි අංගනය, යටත් විජිත යුගයේ නැව් සඳහා ඉන්ධන සැපයීමට බ්‍රිතාන්‍ය රජය විසින් ඉදිකර ඇති අතර එය මෙ.ටො. 10,000 බැගින් වූ ටැංකි අනූ නවයකින් (99) සමන්විත ය. මෙම ඉන්ධන ගබඩා ටැංකි සංවර්ධනය කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 21/2285/325/050 දරන 2022.01.11 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් වසර 50 ක කාලයක් සඳහා පහත සඳහන් ආකාරයට බදු දීමට තීරණය විය.

- ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව (CPC) ඉන්ධන ටැංකි 24
- ලංකා ඉන්දියානු තෙල් සමාගම (LIOC) ඉන්ධන ටැංකි 14
- ත්‍රිකුණාමල ඛනිජ තෙල් පර්යන්ත (පුද්ගලික) සමාගම (TPTL) ඉන්ධන ටැංකි 61

සිතියම 2.2.1
ත්‍රිකුණාමල තෙල් ටැංකි සංකීර්ණයේ සිතියම



- **ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට අයත් ටැංකි 24 සංවර්ධනය කිරීමේ ප්‍රගතිය**

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට අයත් ත්‍රිකුණාමල ඉන්ධන තෙල් ටැංකි 24 සංවර්ධනය කිරීම සඳහා ඩොලර් මිලියන 20 ක් ඇස්තමේන්තු කර ඇති අතර, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් මූල්‍යනය කරමින් අදියර දෙකක් යටතේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලැබේ.

2024.12.31 දින වන විට පහත කාර්යයන් නිම කර ඇත.

- අදියර 1 ටැංකි යාන්ත්‍රික පිරිසිදු කිරීම (ටැංකි 12)
- අදියර 2 ටැංකි යාන්ත්‍රික පිරිසිදු කිරීම (ටැංකි 09)
- ටැංකි ස්වස්ථතාව පරීක්ෂාව
- භූගෝලීය සහ ඡායාරූපමිතික ක්ෂේත්‍ර සමීක්ෂණය
- ජල නල මාර්ගය ඉදිකිරීම

- **ත්‍රිකුණාමල ඛනිජ තෙල් පර්යන්ත (පුද්ගලික) සමාගමට අයත් ටැංකි සංවර්ධනය කිරීමේ ප්‍රගතිය**

ත්‍රිකුණාමල ඛනිජ තෙල් පර්යන්ත (පුද්ගලික) සමාගම වෙත ලබා දී ඇති ඉන්ධන ටැංකි 61 සංවර්ධනය කිරීමේ මූලික පියවර වශයෙන් පහත සඳහන් කටයුතු දැනටමත් සිදු කර ඇත.

- ඉන්ධන ටැංකි දහයක් (10) සඳහා ප්‍රවේශය ලබා දීමට අවශ්‍ය වන භූමි ප්‍රදේශය පිරිසිදු කිරීම
- බියුරෝ වෙරිටාස් ලංකා පුද්ගලික සමාගම වෙතින් මෙම තෙල් ටැංකි දහය (10) සඳහා තත්ත්ව පරීක්ෂණ වාර්තාවක් ලබා ගැනීම
- ව්‍යාපෘතිය සඳහා ශක්‍යතා අධ්‍යයනයක් සිදු කර ඇති අතර මෙහිදී දිගුකාලීන හා කෙටිකාලීන ලෙස සංවර්ධන උපාය මාර්ග හඳුනා ගැනීම

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට සුදුසු ආයෝජකයකු තෝරා ගැනීම සඳහා අභිලාෂ කැඳවන ලද අතර ආයතන 05 ක් සිය යෝජනා ඉදිරිපත් කරන ලදී. අමාත්‍ය මණ්ඩලය පත්කරන ලද ව්‍යාපෘති කමිටුව සහ සාකච්ඡා සම්මුති කමිටුව යෝජනා ඇගයීම් සිදු කරමින් පවතී.

- **කොලොන්නාව පර්යන්තයේ ටැංකි හය (06) ඉදිකිරීම් ව්‍යාපෘතිය**

සමස්ත ධාරිතාවය ඝන මීටර් 64,000 කින් යුතු ටැංකි 06 ක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය රුපියල් මිලියන 2286.8 ක බදු රහිත කොන්ත්‍රාත් මුදලකට 2019.10.24 දින ප්‍රදානය කරන ලදී. කොන්ත්‍රාත්කරුගේ දුර්වල කාර්ය සාධනය හේතුවෙන් 2022.01.19 දින කොන්ත්‍රාත්තුව අවසන් කරන ලදී. ඒ වන විට ව්‍යාපෘතියේ සමස්ථ කාර්යසාධනය 18% කි. මෙම ව්‍යාපෘතිය නැවත ක්‍රියාත්මක කිරීම සඳහා රුපියල් මිලියන 3374 ක් (බදු රහිත) ඇස්තමේන්තු කර ඇති අතර අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත සුදුසු කොන්ත්‍රාත්කරුවකු තෝරා ගැනීම සඳහා ලංසු කැඳවන ලදී. ඉදිරිපත් කරන ලද ලංසු ඇගයීම් අදියරේ පවතින අතර 2025 පෙබරවාරි මස වන විට කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමට සැලසුම් කර ඇත. අපේක්ෂිත ව්‍යාපෘති කාලය මාස 24 කි.

- **කොළඹ වරාය සිට කොලොන්නාව පර්යන්තය දක්වා අගල් 18 ක විෂ්කම්භයකින් යුතු නළ මාර්ගයක් ඉදි කිරීමේ ව්‍යාපෘතිය**

කොළඹ වරාය සිට කොලොන්නාව පර්යන්තය දක්වා ඉන්ධන ප්‍රවාහනය කරනු ලබන නල මාර්ග පද්ධතිය ඉතා පැරණි හා අබලන් තත්ත්වයේ පවතින බැවින් ඉන්ධන ගොඩබෑම කාර්යක්ෂම කිරීම සඳහා අඟල් 18 ක විෂ්කම්භයකින් යුතු නල මාර්ගයක් ඉදිකිරීමට සැලසුම් කරන ලදී. ඒ සඳහා ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුවේ අනුමැතිය සහ අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කර ඇත. මේ සඳහා ඇස්තමේන්තු ගත පිරිවැය රුපියල් මිලියන 2853 ක් (බදු රහිත) වන අතර අපේක්ෂිත ව්‍යාපෘති කාලය මාස 18 කි.

- **මාගාල්ල ප්‍රාදේශීය තොග ගබඩාවේ ගිනි නිවීම සඳහා වන ජල ගබඩා ධාරිතාවය පුළුල් කිරීම**

මාගාල්ල ප්‍රාදේශීය ඩිපෝවේ ගිනි නිවීම සඳහා ඝන මීටර් 110,000 ක ධාරිතාවයකින් යුත් ජල ගබඩා ටැංකි ඉදිකිරීමට කටයුතු කරන ලදී. මෙමඟින් ජල ගබඩා ධාරිතාවය ඝන මීටර් 90,000 සිට ඝන මීටර් 200,000 දක්වා වැඩි කිරීමට කටයුතු කරන ලද අතර ඒ සඳහා රුපියල් මිලියන 12 ක් ඇස්තමේන්තු කරන ලදී.

- **කොලොන්නාව පර්යන්තයේ කලාප 6 හි නළ ආධාරක පද්ධතියක් ඉදිකිරීම**

ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම විසින් ගැන්ට්‍රිවල පෙට්‍රල් පිරවුම් ධාරිතාව ඉහළ නැංවීමට සැළසුම් කර ඇති අතර නව ඉහළ ධාරිතාවකින් යුත් පොම්ප ස්ථාපනය කිරීම මඟින් කලාප 07 හි ඇති පෙට්‍රල් පිරවීමේ ගැන්ට්‍රිය වැඩි දියුණු කෙරේ. ඒ සඳහා කොළොන්නාව කලාප 06 හි නව නිපැයුම් පොම්පාගාරය ඉදිකරන ලද නල මාර්ග සම්බන්ධ කිරීම සඳහා අවශ්‍යව අධාරක පද්ධතිය සහ ආශ්‍රිත පහසුකම් පද්ධතිය ඉදිකරන ලදී. ඇස්තමේන්තු ගත පිරිවැය රුපියල් මිලියන කි (බදු රහිත).

- **කන්කසන්තුරයෙහි පිහිටි ප්‍රාදේශීය ඉන්ධන තොග ගබඩාව නැවත ස්ථානගත කිරීම**

කන්කසන්තුරයෙහි පිහිටි ප්‍රාදේශීය ගබඩාව උතුරු පළාතට ඉන්ධන බෙදාහැරීම සඳහා උපක්‍රමික වශයෙන් වැදගත් වන ගබඩාවකි. මෙම ගබඩාව සිමෙන්ති කර්මාන්ත ශාලාවට අයත් ඉඩමක පවත්වාගෙන ගොස් ඇති අතර එම ගබඩාව දැනට ක්‍රියාත්මක තත්ත්වයේ නොමැත. මෙම ප්‍රාදේශීය ගබඩාව ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගමට අයත් ඉඩමක නැවත ස්ථාපිත කිරීම සඳහා කටයුතු කරන ලදී. මෙහි සමස්ත ස්ථාපිත ධාරිතාවය ලීටර් 540,000 ක් පමණ වේ. මේ සඳහා රුපියල් මිලියන 170 ක් (බදු රහිත) ඇස්තමේන්තු කර ඇති අතර අදියර තුනක් යටතේ ඉදිකිරීම් කටයුතු සිදු කරමින් පවතී. 2025 වර්ෂයේ ජනවාරි මාසය තුළදී ඉදිකිරීම් කටයුතු නිමකිරීමට අපේක්ෂිතය.

2.2.8 2025 සඳහා සැලසුම් හා වැඩසටහන්

දේශීය බලශක්ති ඉල්ලුම සපුරාලීමේ දී පොසිල ඉන්ධන තවදුරටත් සැලකිය යුතු කාර්යභාරයක් ඉටු කරන අතර, දේශීය බලශක්ති සුරක්ෂිතතාවය තහවුරු කිරීම සහ ගෝලීය බලශක්ති සැපයුමට ශ්‍රී ලංකාව දායක කිරීම අරමුණු කරගෙන 2025 වර්ෂය තුළ දී පහත වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරනු ලැබේ.

- **පසුභාග බනිජ තෙල් කර්මාන්තය නියාමනය සඳහා ස්ථීර නියාමකයෙකු පත්කිරීම**

වර්තමානයේ බනිජ තෙල් වෙළඳපොළ ක්‍රියාකාරකම් පුළුල් වීමත් සමඟම නව තරඟකාරී ආයතන වෙළඳපොළට පිවිසීම හේතුවෙන්, බනිජ තෙල් නිෂ්පාදනවල ගුණාත්මකභාවය පවත්වාගෙන යාම සහ පාරිභෝගික ආරක්ෂාව තහවුරු කිරීම සඳහා ස්වාධීන නියාමකයෙකු සහ ශක්තිමත් නියාමන රාමුවක අවශ්‍යතාවය පැන නැඟී ඇත. ඒ අනුව පසුභාග බනිජ තෙල් කර්මාන්තය නියාමනය සඳහා ස්ථීර නියාමකයෙකු පත්කිරීමට සැලසුම් කර ඇත.

- **සපුගස්කන්ද පිරිපහදුව නවීකරණය කිරීම සහ නව පිරිපහදුවක් ඉදිකිරීම**

ශ්‍රී ලංකාවේ බනිජ තෙල් අවශ්‍යතාවයෙන් 25% ක් පමණ සපුගස්කන්ද පිරිපහදුව මඟින් සපයන අතර විදේශ විනිමය මත වැඩි පීඩනයක් ඇති කරමින් ඉතිරි 75% ක් වූ පිරිපහදු බනිජ තෙල් අවශ්‍යතාවය ආනයනය මඟින් සපුරාලීමට සිදුව ඇත. දේශීය බනිජ තෙල් අවශ්‍යතාවය මෙරට පිරිපහදු මඟින් නිපදවීම ප්‍රධාන අරමුණක් වන අතර ඒ සඳහා සපුගස්කන්ද පිරිපහදුව නවීකරණය කිරීම හෝ නව පිරිපහදුවක් ඉදිකිරීම ශක්‍යතාවය අනුව සිදු කරනු ඇත.

- **ත්‍රිකුණාමලය තෙල් ටැංකි සංකීර්ණය සංවර්ධනය කිරීම**

ත්‍රිකුණාමලය තෙල් ටැංකි සංකීර්ණය සම්බන්ධයෙන් එළඹ ඇති ගිවිසුම් සලකා බලමින් ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාව සතු ටැංකි විසිහතර (24) සහ ත්‍රිකුණාමල බනිජ තෙල් පර්යන්ත පුද්ගලික සමාගම (TPTL ආයතනය) සතු ටැංකි හැට එක (61) ජාතික ආර්ථිකයට වාසිදායක ව්‍යාපාරික ආකෘතීන් යටතේ සංවර්ධනය කිරීමට පියවර ගැනීම. ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාව සතු ටැංකි විසිහතර (24) සංවර්ධනය කිරීමට 2025 වර්ෂය සඳහා රුපියල් මිලියන 4010 ක් වෙන් කර ඇත.

- **විද්‍යුත් වාහන ආරෝපනය සඳහා දිවයින පුරා ආරෝපන මධ්‍යස්ථාන ස්ථාපිත කිරීම**

ඉන්ධන පිරවුම්හල් ආශ්‍රිතව විද්‍යුත් වාහන ආරෝපන මධ්‍යස්ථාන පිහිටුවීමට ඉහළ විභවතාවයක් පවතින බවට ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාව සිදු කරන ලද අධ්‍යයනයක් අනුව අනාවරණය විය. ඒ අනුව දිවයින පුරා පිහිටි විභවතාවයක් සහිත ඉන්ධන පිරවුම්හල් ආශ්‍රිතව විද්‍යුත් වාහන ආරෝපන මධ්‍යස්ථාන පිහිටුවීම සඳහා සැලසුම් කර ඇති අතර 2025 වර්ෂය සඳහා රුපියල් මිලියන 100 ක් ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් මේ වෙනුවෙන් වෙන්කර ඇත.

- **ඉන්ධන ගබඩා ධාරිතාවය පුළුල් කිරීම**

රට තුළ බලශක්ති සුරක්ෂිතතාවය තහවුරු කිරීම සඳහා ප්‍රමාණවත් ඉන්ධන ගබඩා ධාරිතාවයක් පවත්වා ගත යුතුය. මෙම අවස්ථාව වන විට ලංකා බනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම මෙට්‍රික් ටොන් 440,147 ක සමස්ත ගබඩා ධාරිතාවයක් පවත්වා ගෙන යනු ලැබේ. මෙම ධාරිතාවය තවදුරටත් වර්ධනය කිරීම සඳහා පහත පරිදි නව ගබඩා ටැංකි ඉදි කිරීමට සැලසුම් කර ඇත.

විස්තරය	ඇස්තමේන්තුගත පිරිවැය	අරමුදල් සම්පාදනය
කොලොන්නාව බනිජ තෙල් ගබඩා පර්යන්තය තුළ සමස්ත ධාරිතාවය ඝණ මීටර් 64,000 කින් යුත් ටැංකි 06 ක් ඉදි කිරීම	රු.මිලියන 3374	ලංකා බනිජ තොග ගබඩා පර්යන්ත සමාගම
කොලොන්නාව බනිජ තෙල් ගබඩා පර්යන්තය තුළ සමස්ත ධාරිතාවය ඝණ මීටර් 22,000 කින් යුත් ටැංකි 02 ක් ඉදි කිරීම	රු.මිලියන 1470.4	ලංකා බනිජ තොග ගබඩා පර්යන්ත සමාගම
මුතුරාජවෙල බනිජ තෙල් ගබඩා පර්යන්තය තුළ සමස්ත ධාරිතාවය ඝණ මීටර් 40,000 කින් යුත් ටැංකි 03 ක් ඉදි කිරීම	රු.මිලියන 3496	ලංකා බනිජ තොග ගබඩා පර්යන්ත සමාගම

- **ඉන්ධන ප්‍රවාහන නල මාර්ග පද්ධතිය සංවර්ධනය කිරීම**

කොළඹ වරාය සිට කොලොන්නාව පර්යන්තය දක්වා ඉන්ධන ප්‍රවාහනය කරනු ලබන නල මාර්ග පද්ධතිය ඉතා පැරණි හා අබලන් තත්ත්වයේ පවතී. මේ හේතුවෙන් ඉන්ධන කාන්දුවීම් මෙන්ම ඉන්ධන ගොඩබෑම සඳහා වැඩි කාලයක් සහ පිරිවැයක් දැරීමට සිදුව ඇත. එබැවින් ඉන්ධන ගොඩබෑම සහ ප්‍රවාහනය කාර්යක්ෂම කිරීම සඳහා නල මාර්ග ඉදිකිරීමට සැලසුම් කර ඇත.

විස්තරය	ඇස්තමේන්තුගත පිරිවැය	අරමුදල් සම්පාදනය
කොළඹ වරාය සිට කොලොන්නාව පර්යන්තය දක්වා අඟල් 18 ක විෂ්කම්භයකින් යුත් නල මාර්ගයක් ඉදිකිරීම	රු.මිලියන 2852.5	ලංකා ඛනිජ තොග ගබඩා පර්යන්ත සමාගම
කොලොන්නාව පර්යන්තයේ සිට කැළණිතිස්ස බලාගාරය දක්වා අඟල් 12 විෂ්කම්භයකින් යුත් නල මාර්ගයක් ඉදිකිරීම. (නැප්තා)	රු.මිලියන 1444	ලංකා ඛනිජ තොග ගබඩා පර්යන්ත සමාගම
ගුවන් යානා ඉන්ධන ප්‍රවාහනය සඳහා මුතුරාජවෙල සිට කටුනායක ගුවන් තොටුපොළ දක්වා නල මාර්ගයක් ඉදිකිරීම	රු.මිලියන 18000	ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

- **ඛනිජ තෙල් හා ස්වාභාවික වායු නව විභවයන් හඳුනා ගැනීමට හා පවතින සොයාගැනීම් තක්සේරු කිරීමට සුදුසු ආයෝජකයකු සොයා ගැනීම සහ ඊට අදාළව ඒකාබද්ධ අධ්‍යයන ගිවිසුම්වලට එළඹීම**

- **කර්මාන්ත විශේෂඥයන්ගේ සහාය ඇතිව උද්ගාමී ඛනිජ තෙල් කර්මාන්තය සඳහා ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීම**

- **ත්‍රිකුණාමලයේ පවතින තෙල් ටැංකි 61 ජාත්‍යන්තරව පිළිගත් ආයතන සමඟ ඒකාබද්ධ ව්‍යාපාරයක් ලෙස සංවර්ධනය කිරීම සහ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව යටතේ පවතින තෙල් ටැංකි 24 අදියර කිහිපයක් ඔස්සේ සංවර්ධනය කිරීම**

- **Clean Sri Lanka වැඩසටහන යටතේ තෝරා ගත් ඉන්ධන පිරවුම්හල්වල පවතින සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කිරීම**

  Clean Sri Lanka වැඩසටහන යටතේ, ජනාධිපති ලේකම් කාර්යාලයේ මැදිහත්වීමෙන් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, ලංකා ඉන්දියානු තෙල් සමාගම, සිනොපෙක් සමාගම සහ ආර්.එම්. පාර්ක් සමාගම යන ප්‍රධාන ඉන්ධන සැපයුම්කාර ආයතනවලට අයත් තෝරාගත් ඉන්ධන පිරවුම්හල්වල පවතින සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇත.

03 වන පරිච්ඡේදය

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්යසාධනය

03 වන පරිච්ඡේදය

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්යසාධනය

වාර්තා කිරීමේ පදනම

1) වාර්තාකරණ කාලපරිච්ඡේදය
2024 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මුල්‍ය ප්‍රකාශයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

2) මිණුම්කරණ පදනම
මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම් නැවත තක්සේරු කරන ලද වටිනාකමට වැඩිදියුණු කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදුකරයි.
මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

3) ආදායම් හඳුනා ගැනීම
හුවමාරු හා හුවමාරු නොවන ආදයම් ඒවායේ බදු ගෙවන කාලසීමාව නොසළකා ගිණුම් කාලසීමාව තුළ මුදල් ලැබීම් අනුව හඳුනාගනු ලැබේ.

4) දේපළ පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම
වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.
දේපළ පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවල දී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.

5) දේපළ පිරියත හා උපකරණ සංචිතය
මෙම සංචිත ගිණුම දේපළ පිරියත හා උපකරණවල අනුරූප ගිණුම වේ.

6) මුදල් හා මුදල් සමාන දෑ
2024 දෙසැම්බර් 31 දිනට අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් මුදල් හා මුදල් සමාන දෑ සමන්විත වේග

3.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

බලශක්ති අමාත්‍යාංශය
2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

ඒඑසිඒ-එෆ්

සංශෝධිත අයවැය ප්‍රතිපාදන 2024 රු.		සටහන	තක්‍ය 2024 රු.	- 2023 රු.	
-	ආදායම් ලැබීම්			-	
-	ආදායම් බදු	1	-	-	ඒඑසිඒ-1
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	3	-	-	
1,800,000,000	බදු නොවන ආදායම් හා වෙනත්	4	3,158,283,029	1,724,530,475	
1,800,000,000	**මුළු ආදායම් ලැබීම් (අ)**		**3,158,283,029**	1,724,530,475	
-	**ආදායම් නොවන ලැබීම්**		-	-	
-	භාණ්ඩාගාර අග්‍රිම		7,941,916,912	2,190,981,500	ඒඑසිඒ-3
-	තැන්පතු		896,711	5,054,780	ඒඑසිඒ-4
-	අත්තිකාරම් ගිණුම්		11,525,177	11,878,897	ඒඑසිඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		-	-	
-	**මුළු ආදායම් නොවන ලැබීම් (ආ)**		**7,954,338,800**	2,207,915,177	
1,800,000,000	**මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)**		**11,112,621,829**	3,932,445,652	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)		613,559,261	198,628,192	
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඇ)		**10,499,062,568**	3,733,817,460	
	අඩු කළා : වියදම්				
	පුනරාවර්තන වියදම්		-	-	
187,610,000	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	172,701,438	163,839,665	ඒඑසිඒ-2(ii)
283,225,000	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	231,472,868	237,439,889	
438,540,000	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	7	343,781,526	312,925,050	
-	පොළී ගෙවීම්	8	-	-	
100,000	වෙනත් පුනරාවර්තන වියදම්	9	500	67,884	
909,475,000	**මුළු පුනරාවර්තන වියදම් (ඊ)**		**747,956,332**	714,272,488	
	මූලධන වියදම්				
11,680,000	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	10	5,167,451	11,333,067	
8,411,413,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	11	2,456,703,933	975,471	ඒඑසිඒ-2(ii)
8,022,000,000	ප්‍රාග්ධන මාරුකිරීම්	12	7,530,808,674	12,566,391,531	
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම	13	-	-	
1,232,632,000	හැකියා වර්ධනය	14	527,644,374	-	
30,000,500,000	වෙනත් මූලධන වියදම්	15	15,603,436,028	-	
47,678,225,000	**මුළු මූලධන වියදම් (උ)**		**26,123,760,460**	12,578,700,069	
	තැන්පතු ගෙවීම්		1,071,012	5,543,323	ඒඑසිඒ-4
	අත්තිකාරම් ගෙවීම්		11,585,407	12,908,270	ඒඑසිඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		-	-	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		12,656,419	18,451,593	
	මුළු වියදම් එ = (ඊ+උ+ඌ)		26,884,373,210	13,311,424,150	
(46,787,700,000)	**දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)**		(16,385,310,642)	(9,577,606,690)	
	අග්‍රිම ගැලපුම් ප්‍රකාශනය අනුව ශේෂය		(16,385,998,643)	(9,577,606,690)	ඒඑසිඒ-7
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය		688,001	-	ඒඑසිඒ-3
			(16,385,310,642)	(9,577,606,690)	

3.2 මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශනය

ඒසිඒ-8

බලශක්ති අමාත්‍යාංශය
2024 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

	සටහන	තත්‍ය 2024 රු.	2023 රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසිඒ-6	745,479,913	746,481,280
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසිඒ-5/5(ඒ)	31,886,066	31,825,836
මුදල් හා මුදල් සමාන දෑ	ඒසිඒ-3	688,001	-
මුළු වත්කම්		**778,053,980**	**778,307,116**
ශුද්ධ වත්කම් / ස්වාන්ධය			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		21,933,522	21,698,991
දේපළ පිරියත හා උපකරණ සංචිතය		745,479,913	746,481,280
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	ඒසිඒ-5(බී)	9,550,000	9,550,000
යුතුකම් වගකීම්			
නැන්පතු ගිණුම්	ඒසිඒ-4	402,544	576,845
අග්‍රිම ශේෂය	ඒසිඒ-3	688,001	-
මුළු වගකීම්		**778,053,980**	**778,307,116**

පිටු අංක...07.....සිට ...65..... දක්වා ඒසිඒ 1 සිට ඒසිඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක ...66..... සිට .....112.... දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2024.12.16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 විධිවිධානයන්ට අනුකූලව සිදුකර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් ආරක්ෂාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට එරින් වර සමාලෝචන සිදුකරන

ප්‍රධාන ගණන්දීමේ නිලධාරි	ගණන්දීමේ නිලධාරි	ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි
නම :	නම :	අධ්‍යක්ෂ (මුදල්)/ කොමිසාරිස් (මුදල්)
තනතුර :	තනතුර :	නම :
දිනය : 2025-02-25	දිනය : 2025-02-25	දිනය : 2025 ඒ.එම්.බී. මල්ලාත්ති ප්‍රධාන මූල්‍ය නිලධාරි ඵදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය අංක 437, ගාල්ල පාර, කොළඹ 03.

Prof. K.T.M. Udayanga Hemapala
Secretary
Ministry of Energy
No. 437, Galle Road,
Colombo - 03.

Prof. K.T.M. Udayanga Hemapala
Secretary
Ministry of Energy
No. 437, Galle Road,
Colombo - 03.

3.3 මුදල් ප්‍රවාහ පිලිබඳ ප්‍රකාශනය

බලශක්ති අමාත්‍යාංශය ඒසීඒ-සී

2024 දෙසැම්බර් **31** දිනෙන් අවසන් වර්ෂය සඳහා

මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

	2024 රු.	තත්‍ය 2023 රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		-
මුළු බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	742,592,829	453,923,675
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	-	-
වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	2,634,824,309	7,601,420
අග්‍රිම ලැබීම්	7,941,916,912	2,190,981,500
අත්තිකාරම් අයකර ගැනීම්	10,410,029	10,264,823
තැන්පතු ලැබීම්	896,711	5,054,780
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	**11,330,640,790**	**2,667,826,198**
අඩුකළා : මුදල් වැය කිරීම්		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	403,125,625	400,383,012
සහනාධාර සහ මාරුකිරීම්	112,277,526	122,336,686
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	1,245,856	1,873,034
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	613,559,261	198,628,192
අත්තිකාරම් ගෙවීම්	11,428,107	13,158,270
තැන්පතු ගෙවීම්	1,071,012	5,543,323
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**1,142,707,387**	**741,922,517**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	**10,187,933,403**	**(1,925,903,681)**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	-	-
ලාභාංශ	-	-
භෞතික වත්කම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම	-	-
උපණය අයකර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)	**-**	**-**
අඩුකළා : මුදල් වැය කිරීම්		
භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම්	10,187,245,402	1,925,903,681
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	**10,187,245,402**	1,925,903,681
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඈ)-(ඉ)	**(10,187,245,402)**	**(1,925,903,681)**
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	**688,001**	
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	**-**	**-**
අඩුකළා : මුදල් වැය කිරීම්		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	**-**	**-**
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	**-**	**-**
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)	688,001	**-**
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	**-**	**-**
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	688,001	**-**

3.4 ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය

ආදායම් කේතය	ආදායම් කේතයේ විස්තරය	මුල් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව (රු)	ආදායම් ඇස්තමේන්තුව (රු)	ප්‍රමාණය (රු)	අවසන් ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස
2003.02.21	බදු නොවන ආදායම් හා වෙනත් බනිජ තෙල් කර්මාන්ත අමාත්‍යාංශයට අදාල ගාස්තු	1,720,000,000.00	1,800,000,000.00	3,158,283,029.00	175%

3.5 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම (රු)	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන , අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදන (රු)	අවසාන ප්‍රතිපාදන (රු)		
පුනරාවර්තන	910,000,000.00	909,475,000.00	747,956,332.00	82%
ප්‍රාග්ධන	42,073,000,000.00	47,678,225,000.00	26,123,760,460.00	55%

3.6 මු.රෙ 208 ප්‍රකාරව ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම (රු)	උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබාදුන් අවසාන ප්‍රතිපාදනවල % ලෙස
				මුල් ප්‍රතිපාදන (රු)	අවසාන ප්‍රතිපාදන (රු)		
1	දුම්රිය දෙපාර්තමේන්තුව	අමාත්‍යාංශයේ නිලධාරීන් වෙනුවෙන් නිකුත් කල නිදහස් දුම්රිය බලපත්‍ර	පුනරාවර්තන	847,100.00	847,100.00	847,100.00	100%
2	භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව	ලං.වි.ම විසින් ලබා ගත් විදේශ ණය ගිණුම් ගත කිරීම	ප්‍රාග්ධන	30,000,000,000.00	30,000,000,000.00	15,603,436,028.00	52%

3	භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව	කොළඹ නගරයේ අපද්‍රව්‍ය උපයෝගී කර ගනිමින් විදුලිය උත්පාදනය කිරීමේ ව්‍යාපෘතිය සඳහා ලංවිම ලබාගත් මුදල් (වියදම්) ගිණුම්ගත කිරීම	ප්‍රාග්ධන	1,750,000,000.00	2,110,000,000.00	2,109,921,098.20	100%
4	භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව	සේවකයින් පුහුණු කිරීම සඳහා ජපාන ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනයෙන් ලැබුණු ආධාර ගිණුම්ගත කිරීම	ප්‍රාග්ධන	22,000,000.00	22,000,000.00	557,291.29	3%
5	භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව	ලංවිම ක්‍රියාත්මක කරන කොරියානු ආධාර සහිත බැටරි බලශක්ති ගබඩා පද්ධතිය (BESS) සඳහා වියදම් ගිණුම්ගත කිරීම	ප්‍රාග්ධන	3,239,000,000.00	2,379,468,526.96	2,379,468,526.96	73%
6	භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව	ඉන්දියානු රජය යටතේ සුනිත්‍ය බලශක්ති අධිකරියට ලබා දී ඇති විදේශ ණය ගිණුම්ගත කිරීම	ප්‍රාග්ධන	600,000,000.00	5,840,000,000.00	5,353,052,576.49	92%
7	භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව	ඉන්දියානු රජය විසින් සුනිත්‍ය බලශක්ති අධිකාරිය වෙත සිදුකරන ලද පරිත්‍යාග /ප්‍රදානය කිරීම් වලට අදාළව වියදම් ගිණුම්ගත කිරීම	ප්‍රාග්ධන	3,600,000,000.00	3,600,000,000.00	327,924,478.02	9%
8	භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව	USAID හි අරමුදල් යටතේ ශ්‍රී ලංකා බලශක්ති වැඩසටහන සම්බන්ධයෙන් වන වියදම් ගිණුම්ගත කිරීම	ප්‍රාග්ධන	1,210,000,000.00	1,210,000,000.00	526,482,282.38	44%
9	ශ්‍රී ලංකා රේගුව	කොරියානු ජනරජය යටතේ ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය සඳහා වන වියදම් ගිණුම්ගත කිරීම	ප්‍රාග්ධන	1,087,000,000.00	1,228,450,678.04	1,143,450,678.04	93%
10	භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව	ආසියානු සංවර්ධන බැංකුව (ADB) යටතේ ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති	ප්‍රාග්ධන	122,000,000.00	122,000,000.00	91,864,124.52	75%

		අධිකාරිය සඳහා වන වියදම් ගිණුම්ගත කිරීම					
11	භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව	කොරියානු ප්‍රදාන මගින් ක්‍රියාත්මක කරන ලද වායු සමීකරණ රසායනාගාරය සඳහා වූ වියදම් ගිණුම්ගත කිරීම	ප්‍රාග්ධන	218,000,000.00	218,000,000.00	101,774,770.00	47%
12	භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව	ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය (SLAEB) විසින් ප්‍රදානය කරන ලද උපකරණ සඳහා වූ වියදම් ගිණුම්ගත කිරීම	ප්‍රාග්ධන	25,000,000.00	743,080,795.00	689,109,422.00	93%
13	භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව	ජාත්‍යන්තර පරමාණුක බලශක්ති නියෝජිතායතනය (IAEA)විසින් ප්‍රදානය කරන ලද උපකරණ සඳහා වූ වියදම් ගිණුම්ගත කිරීම	ප්‍රාග්ධන	109,000,000.00	113,700,000.00	99,290,136.16	87%
14	භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව	සුනිත්‍ය බලශක්ති අධිකාරිය	පුනරාවර්තන	140,000,000.00	127,250,000.00	127,250,000.00	91%
15	භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව	සුනිත්‍ය බලශක්ති අධිකාරිය	ප්‍රාග්ධන	50,000,000.00	50,000,000.00	50,000,000.00	100%
16	භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව	පරමාණුක බලශක්ති මණ්ඩලය	පුනරාවර්තන	35,000,000.00	47,750,000.00	47,750,000.00	100%
17	භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව	පරමාණුක බලශක්ති මණ්ඩලය	ප්‍රාග්ධන	20,000,000.00	20,000,000.00	15,860,000.00	79%
18	භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව	පරමාණුක බලශක්ති නියාමන සභාව	පුනරාවර්තන	55,000,000.00	55,000,000.00	30,790,000.00	56%
19	භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව	පරමාණුක බලශක්ති නියාමන සභාව	ප්‍රාග්ධන	2,000,000.00	2,000,000.00	1,975,000.00	99%
20	භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව	ඛනිජ තෙල් සංවර්ධන අධිකාරිය	පුනරාවර්තන	55,000,000.00	55,000,000.00	25,714,000.00	47%

3.7 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය

වත්කම් කේතය	කේත විස්තරය	2024.12.31 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය (රු)	2024.12.31 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය (රු)	ඉදිරියේදී ගිණුම්කරණයට නියමිත (රු)	ප්‍රගතිය ٪ ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්				
9152	යන්ත්‍රෝපකරණ	737,341,777.22	737,341,777.22	-	100%
9153	ඉඩම්	-	-	-	-
9154	අස්පෘශ්‍ය වත්කම්	8,138,136.00	8,138,136.00	-	100%
9155	ජීව විද්‍යාත්මක වත්කම්				
9160	කෙරීගෙන යන වැඩ				
9180	බදු දෙන ලද වත්කම්				

3.8 විගණකාධිපතිවරයාගේ වාර්තාව

සටහන : 2024 වර්ෂයට අදාළ විගණකාධිපති වාර්තාව ඇමුණුම 1 ලෙස අමුණා ඇත.

04 වන පරිච්ඡේදය

කාර්යසාධන දර්ශක

04 වන පරිච්ඡේදය
කාර්යසාධන දර්ශක

4.1 අමාත්‍යාංශයේ කාර්යසාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

බලශක්ති අමාත්‍යාංශය ශ්‍රී ලංකාවේ විදුලිබල සහ බලශක්ති අංශයන්ගෙන් සමන්විත වේ. විදුලිබල අංශය මගින් විදුලිබල සැපයුමට අදාළ ඒ ආශ්‍රිත ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් කටයුතු කරන අතර බලශක්ති අංශය මගින් ඛනිජ තෙල් සැපයුම සම්බන්ධයෙන් කටයුතු කරනු ලබයි.

අමාත්‍යාංශයේ අංශ දෙකෙහිම ප්‍රධාන කාර්යසාධන දර්ශක පහත වගුවේ දැක්වේ.

විශේෂිත දර්ශක		මිනුම් ඒකකය	ප්‍රතිඵල වල ප්‍රගතිය 2024
කාර්යසාධන දර්ශක (KPI)	විස්තරය		
විදුලිබල අංශය			
01. විදුලි සැපයුම මගින් රට ආවරණය කිරීම	ඉල්ලුමට අනුව මහජනතාවට සේවා සම්බන්ධතා සැපයීම. විදුලිය සඳහා ප්‍රවේශ වීමේ හැකියාව වැඩි කිරීම සඳහා රටෙහි විදුලි බෙදාහැරීමේ ජාලය පුළුල් කිරීම	ප්‍රතිශතය	99.9%
02. ජාතික ජාලයෙහි සමස්ත ස්ථාපිත පුනර්ජනනීය බලශක්ති ජනන ධාරිතාවය	රටේ දිගුකාලීන අවශ්‍යතා මත පදනම්ව පුනර්ජනනීය විදුලි ජනන සැලැස්ම ක්‍රියාත්මක කිරීම	ප්‍රතිශතය	64%
03. සමස්ත විදුලි ජනන සංයුතියෙහි පුනර්ජනනීය බලශක්ති දායකත්වය	මහා පරිමාණ පුනර්ජනනීය බලශක්ති උද්‍යාන ඇතුළුව පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති (ජල, සුලං, සූර්ය, ජෛව ස්කන්ධ) රට තුළ ක්‍රියාත්මක කිරීම.	ප්‍රතිශතය	55%
04.ඉහළ වෝල්ටීයතා සම්ප්‍රේෂණ ජාලයෙහි දිග (සම්ප්‍රේෂණ වැරගැන්නුම් / පද්ධති ධාරිතාව)	කි.වෝ. 220 සහ කි.වෝ. 132 සම්ප්‍රේෂණ මාර්ග ක්‍රියාත්මක කිරීම මඟින් ජනන පහසුකම් මඟින් ජනනය වන විදුලිය ඉවත් කර ධාරිත්‍රක මධ්‍යස්ථාන වෙත සම්ප්‍රේෂණය කිරීම ග්‍රිඩ් උපපොළවල් ස්ථාපිත කිරීම) ග්‍රිඩ්	කි.මී. ගණන (සමුච්චිත) උපපොළ ගණන (සමුච්චිත)	කි.වෝ. 220 මුදුන් සම්ප්‍රේෂණ මාර්ගයේ දිග (කි.මී.) -976 කි.වෝ. 220 භූගත සම්ප්‍රේෂණ මාර්ගයේ දිග (කි.මී.) -22 කි.වෝ.132 මුදුන් සම්ප්‍රේෂණ මාර්ගයේ දිග (කි.මී.) -2350 කි.වෝ.132 භූගත සම්ප්‍රේෂණ මාර්ගයේ දිග (කි.මී.) -50 උපපොළවල් -90

බලශක්ති අංශය			
01. පසුභාග ඛනිජතෙල් කර්මාන්තය සඳහා නියාමන රාමුව	නියමිත අවසන් දිනය වන විට ප්‍රතිපත්ති සහ නීති කෙටුම්පත් සහ පාර්ශ්වකරුවන්ගේ උපදේශන විමසීම සම්පූර්ණ කර ඇත	ප්‍රතිශතය	100%
02. ඛනිජ තෙල් නිෂ්පාදන සැපයුම් දාමය හරහා ලබා ගැනීමේ හැකියාව. ප්‍රමාණවත් තරම් ඛනිජතෙල් නිෂ්පාදන සැපයුමක් පැවතීම	ප්‍රධාන බෙදාහැරීමේ ස්ථානවල (ඩිපෝ, පර්යන්ත සහ සිල්ලර පිරවුම්හල්) ඉන්ධන පැවතීමේ අනුපාතය 99%වේ	ප්‍රතිශතය	100%

මූලාශ්‍රය: බලශක්ති අමාත්‍යාංශය

O.H – මුදුන් සම්ප්‍රේෂණ
U.G – භූගත සම්ප්‍රේෂණ

05 වන පරිච්ඡේදය

තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය

05 වන පරිච්ඡේදය
තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය

5.1 විදුලිබල ක්ෂේත්‍රයේ තිරසර සංවර්ධන අරමුණු (SDG)

SDG ඉලක්ක 7 සැමට දැරිය හැකි විශ්වාසනීය, තිරසාර සහ නවීන බලශක්ති සඳහා ප්‍රවේශය සහතික කිරීම

බලශක්ති සැපයුම් සහ අදාළ පරිවර්තන පද්ධතිවලට ප්‍රවේශයක් නොමැතිවීම මානව හා ආර්ථික සංවර්ධනයට බාධාවකි. පුනර්ජනනීය හා පුනර්ජනනීය නොවන බලශක්ති සම්පත් ලෙස සුළං, සූර්ය, ජල, තාපය, ජෛව ඉන්ධන, ස්වභාවික වායු, ගල් අඟුරු හා පෙට්ට්‍රෝලියම් අධික වේ.

හරිතාගාර වායු විමෝචනය අවම කිරීමට පියවර නොගෙන පොසිල ඉන්ධන භාවිතය ඉහල නැංවීම මගින් ගෝලීය දේශගුණික විපර්යාස බලපෑම් ඉහල යෑමට හේතුවක් වෙයි. බලශක්ති කාර්යක්ෂමතාව හා පුනර්ජනනීය බලශක්ති භාවිතය ඉහල නැංවීම, දේශගුණික විපර්යාස අවම කිරීමට දායක වෙයි.

ඒ අනුව, පහත සඳහන් ක්‍රියාකාරකම් සඳහා විදුලිබල අංශය දායක වී ඇත.

- විදුලි බෙදාහැරීම් ජාලය වැඩි දියුණු කිරීම මගින් මුළු නිවාස 99.9% සඳහා විදුලි බලය ලබාදීම සහ ගුණාත්මක විදුලිය බෙදාහැරීමක් සහතික කිරීම.
- මෙරට විදුලිය සඳහා ප්‍රවේශ වීම 100% දක්වා ඉහල නැංවීම. (විදුලි ප්‍රවේශය ලබා දීම දුෂ්කර බවට හඳුනාගෙන ඇති ප්‍රදේශ වන ඉතිරි 0.01% සඳහා මධ්‍යම ජාලයෙන් බැහැර විදුලි බලය ලබා දීමට ක්‍රියා කරගෙන යයි.)
- 2030 වන විට මෙරට ජනන මිශ්‍රණයෙන් 70%ක කොටසක් පුනර්ජනනීය බලශක්ති මගින් සම්පාදනය කිරීම.
- වසර 2024 වන විට මෙ.වොා. 1578.95ක සූර්ය බලශක්ති ධාරිතාවයක් ජාතික විදුලිබල ජාලයට එකතු කිරීම.

5.2 හඳුනාගෙන ඇති තිරසර සංවර්ධන අරමුණු

තිරසර සංවර්ධන අරමුණු ඉලක්ක	තිරසර සංවර්ධන අරමුණු දර්ශක	මිනුම් ඒකකය	2030 සඳහා සැලසුම්ගත ඉලක්කය	2024 දක්වා ප්‍රගතිය	විශේෂිත කරුණු
ඉලක්කය 7- සැමට දැරිය හැකි, විශ්වාසදායක, තිරසාර හා නවීන බලශක්තිය සඳහා ප්‍රවේශය සහතික කිරීම					
7.1 වසර 2030 වන විට, දැරිය හැකි, විශ්වාසදායක සහ නවීන බලශක්ති සේවාවන් සඳහා විශ්වීය ප්‍රවේශය සහතික කිරීම.	7.1.1 විදුලිය සඳහා ප්‍රවේශය සහිත ජනගහනයේ අනුපාතය	ප්‍රතිශතය (%)	99.9%	99.9%	සමුච්චිත අගය
	7.1.2 පිරිසිදු ඉන්ධන සහ තාක්ෂණය මත මූලිකව යැපෙන ජනගහනයේ අනුපාතය	ජනගහනයේ (%)	99.9%	22.4%	සමුච්චිත අගය
7.2 වසර 2030 වන විට, ගෝලීය බලශක්ති මිශ්‍රණයේ පුනර්ජනනීය බලශක්ති දායකත්වය වැඩි කිරීම.	7.2.1 ප්‍රභවය අනුව සමස්ත විදුලි උත්පාදනය තුළ පුනර්ජනනීය බලශක්තියේ දායකත්වය (ජල විදුලි, ඝන ජෛව ඉන්ධන, සුළං, සූර්ය බලය, ද්‍රව ජෛව ඉන්ධන, ජීව වායුව, භූ තාප, මුහුදු තරංග සහ අපද්‍රව්‍ය) (නියෝජන දර්ශකය)	ප්‍රතිශතය (%)	70%	64%	සමුච්චිත අගය

	7.2.2 2024 අවසන් බලශක්ති පරිභෝජනය තුළ පුනර්ජනනීය බලශක්තියෙහි දායකත්වය.	ප්‍රතිශතය (%)	70%	55%	සමුච්චිත අගය
7.3 වසර 2030 වන විට, බලශක්ති කාර්යක්ෂමතාවයේ වර්ධනයෙහි ගෝලීය අනුපාතය දෙගුණ කිරීම	7.3.1 ප්‍රාථමික බලශක්තිය සහ දළ දේශීය නිෂ්පාදිතය අනුව මිනුම් කරන ලද බලශක්ති තීව්‍රතාවය				
7. b වසර 2030 වන විට, නවීන හා තිරසර වූ බලශක්ති සේවාවන් සැපයීම උදෙසා යටිතල පහසුකම් පුළුල් කිරීම සහ තාක්ෂණය වැඩිදියුණු කිරීම.	7. b.1 ශ්‍රී ලංකාවේ ස්ථාපිත පුනර්ජනනීය බලශක්ති උත්පාදන ධාරිතාව (ඒකපුද්ගල වොට් පරිභෝජනය) (පුනරාවර්තනය 12.a.1)	දළ දේශීය නිෂ්පාදිතයෙන් ශ්‍රී ලංකා රුපියල් මිලියනයක් සඳහා වැයවන බලශක්තිය (Toe per million LKR of GDP)	286	176	සමුච්චිත අගය

5.3 තිරසර සංවර්ධන අරමුණුවලට අදාළව අත්කරගෙන ඇති ජයග්‍රහණ හා මුහුණ දී ඇති අභියෝග

ජයග්‍රහණ

1. ශ්‍රී ලංකාවේ විදුලි ආවරණය 99.9% මට්ටම දක්වා ඉහළ නංවා ඇත.
2. විදුලි ජනනය සඳහා පුනර්ජනනීය බලශක්තියේ දායකත්වය ආකර්ශනීය මට්ටමක පවත්වා ගැනීමට හැකි වී ඇති අතර, වර්ෂය සහ විදුලි ජනනය සඳහා පුනර්ජනනීය බලශක්ති දායකත්වය පහත පරිදි ලබා දී ඇත.

වර්ෂය	විදුලි ජනනය සඳහා පුනර්ජනනීය බලශක්ති දායකත්වය
2023	52%
2024	55%

3. සූර්යබල සංග්‍රාමය වැඩසටහන දියත් කිරීම.

"සූර්යබල සංග්‍රාමය" වැඩසටහන යටතේ, 2023 වසර අග වන විට වහල මත සවිකරන සූර්ය බලශක්ති පද්ධති 39,827ක් මගින් මෙ.වො. 812ක් වූ පුනර්ජනනීය බලශක්ති ධාරිතාවක් ජාතික විදුලිබල පද්ධතිය වෙත ඒකාබද්ධ කර ඇති අතර, 2024 දී එය මෙ.වො. 767 ක් දක්වා ඉහළ නැංවීය.

4. පුනර්ජනනීය බලශක්ති පාලන මධ්‍යස්ථානයක් පිහිටුවීම සඳහා මූලික පියවර ගෙන ඇත.

අභියෝග

1. පුනර්ජනනීය බලශක්ති සංකලනයේ දී ප්‍රධාන විදුලි ජාලයට ආධාර වන සහායක පද්ධති ප්‍රමාණවත් නොවීම නිසා වන තාක්ෂණික අභියෝග.
2. පුනර්ජනනීය බලශක්තිය ඉල්ලුම මත ක්‍රියාත්මක කිරීම සඳහා අඩු වියදම් බැටරි හා මහාපරිමාණ ජල විදුලි බලාගාර සඳහා නැවත ඉවත්වන ජලය සංචිතයට ගැනෙන තාක්ෂණය (Pump Storage) විසඳුම් අවශ්‍ය වේ.
3. පුනර්ජනනීය බලශක්ති තාක්ෂණයන් මිල අධික වීම සහ පුනර්ජනනීය බලශක්ති සංවර්ධනය සඳහා විශාල පරිමාණයේ ආයෝජන අවශ්‍ය වීම.
4. දේශගුණික විපර්යාස
   කාලගුණයෙහි අවිධිමත්භාවය ජල විදුලි ජනනය මෙන්ම ජෛව ස්කන්ධ හා කෘෂිකාර්මික අවශේෂ මගින් විදුලි ජනනය කෙරෙහි අහිතකර ලෙස බලපා ඇත.

5. පුනර්ජනනීය බලශක්ති ජනනයේදී ඇතිවන සමාජීය ගැටළු.
   - වන ජීවීන් හා වනාන්තර සම්බන්ධ ගැටළු.
   - ගම්වාසීන් සමග ඇතිවන ගැටළු.
6. වහල මත සවිකරන සූර්යබල පද්ධතිවල විදුලි උත්පාදනය මැනීම දුෂ්කර වන අතර විදුලි උත්පාදන මිශ්‍රණය සම්බන්ධයෙන් එය ගැටලුකාරී වේ.
7. කාබන්ඩයොක්සයිඩ් (CO_2) මට්ටම අඩු කිරීම පිළිබඳව ජාතික වශයෙන් නිර්ණය කරන ලද දායකත්වයන්ට (NDCs) අදාළ ඉලක්ක, 2030 වර්ෂය වන විට සපුරා ගැනීමට කටයුතු කිරීම.
   5% ස්වේච්ඡා ක්‍රියාමාර්ග - කොන්දේසි විරහිතව- පාරිසරික කාබන්ඩයොක්සයිඩ් විමෝචන අඩු කිරීම. 20% අනුග්‍රහය සහිත ක්‍රියාමාර්ග - අන්තර්ජාතික සහයෝගීතා තත්ත්ව යටතේ පාරිසරික කාබන්ඩයොක්සයිඩ් විමෝචන අඩු කිරීම.

06 වන පරිච්ඡේදය

මානව සම්පත් පැතිකඩ

06 වන පරිච්ඡේදය
මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

- **බලශක්ති අමාත්‍යාංශය**

තනතුර	විදුලිබල අංශය			බලශක්ති අංශය		
	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු/ (අතිරික්ත)**	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු/ (අතිරික්ත)**
ජ්‍යෙෂ්ඨ	24	18	06	23	13	10
තෘතියික	03	02	01	03	02	01
ද්විතියික	73	61	12	52	39	13
ප්‍රාථමික	39	30	09	22	21	01
අනියම්/ කොන්ත්‍රාත්	-	-	-	-	-	-
තාවකාලික	04	04	-	-	-	-
මුළු එකතුව	**143**	**115**	**28**	**100**	**75**	**25**

මූලාශ්‍රය: බලශක්ති අමාත්‍යාංශය

6.2 අමාත්‍යාංශයේ කාර්යසාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපානු ලැබ ඇත්තේ කෙසේද යන්න

ජ්‍යෙෂ්ඨ තනතුරු පුරප්පාඩු දහසයක් (16) සහ අනෙකුත් තනතුරු තිස් හතක් (37) දැනට පවතින අතර, අමාත්‍යාංශ මට්ටමින් අවස්ථාවෝචිතව රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය වෙත මේ සම්බන්ධයෙන් දැනුම් දී ඇත. තවද, අමාත්‍යාංශයේ නව ලේකම්වරයා විසින් එකී අදාළ අමාත්‍යාංශය වෙත 2024.01.06 දිනැතිව ලිපියක් යොමු කරමින් පවතින පුරප්පාඩු පිළිබඳව දන්වා ඇත. මේ සම්බන්ධයෙන් කඩිනමින් ප්‍රතිචාර දැක්වීමට රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය අපොහොසත් වුවහොත්, අමාත්‍යාංශයේ කාර්යසාධනය සම්බන්ධයෙන් එය අහිතකර ලෙස බලපෑ හැකිය. අමාත්‍යාංශයේ අනුමත සේවක සංඛ්‍යාවට අදාළ තත්‍ය තොරතුරු මත ඊට අදාළ දත්ත පද්ධතිය නිරන්තරයෙන් යාවත්කාලීන කරමින් ඒ ඒ තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා අවශ්‍ය පියවර ගනිමින් ඇත. අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ අනුමත තනතුරු 47 න් නිලධාරීන් 31 ක් පමණක් සේවයේ යෙදී සිටින අතර එය මුළු ජ්‍යෙෂ්ඨ තනතුරු සංඛ්‍යාවෙන් 66% ක ප්‍රතිශතයක් බව සඳහන් කළ යුතුය. ද්විතීයික මට්ටමේ තනතුරුවලින් තනතුරු 25 ක් සහ තෘතීයික මට්ටමේ අනුමත තනතුරු 06 න් තනතුරු 02 ක් පුරප්පාඩුව පවතී. කාර්ය මණ්ඩල, හිඟය මධ්‍යයේ වුවද 2024 වර්ෂය තුළ අමාත්‍යාංශයේ අපේක්ෂිත කාර්යසාධනය සාක්ෂාත් කර ගනු වස් පවතින කාර්ය මණ්ඩලය විසින් වැදගත් කාර්යභාරයක් ඉටුකරන ලදී. සියළු පුරප්පාඩු තනතුරු පුරවනු ලබන්නේ නම් (විශේෂයෙන් ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු) අපේක්ෂිත කාර්යසාධනය ළඟා කර ගැනීමට එය මහඟු දායකත්වයක් සපයනු ඇත.

6.3 මානව සම්පත් සංවර්ධනය

අංකය	වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩ සටහනේ කාල සීමාව	සමස්ත ආයෝජනය (රු'000)		වැඩ සටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය)	නිමැවුම/ ලබාගත් දැනුම*
				දේශීය	විදේශීය		
01	ජාතික ඇගයුම් ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ කාර්යරාමුවේ පුහුණුකරුවන් පුහුණු කිරීම	02	දින 03			දේශීය	දැනුම ලබාගන්නා ලදි
02	වාහන දුම් විමෝචන පරීක්ෂා කිරීමේ ක්‍රියාවලිය පිළිබඳ ප්‍රවාහන නිලධාරීන් දැනුවත් කිරීම	06	දින 01			දේශීය	දැනුම ලබාගන්නා ලදි
03	ප්‍රවාහන කළමනාකරණය	01	දින 01	7,000.00		දේශීය	දැනුම ලබාගන්නා ලදි
04	ලිපිගොනු සහ කාර්යාල කළමනාකරණය පිළිබඳ වැඩමුළුව	33	දින 02	7200.00		දේශීය	සාර්ථකව අවසන් කර ඇත
05	පුනර්ජනනීය බලශක්තිය ඒකාබද්ධකිරීම සහ ප්‍රසම්පාදනය කිරීම පිළිබඳ වැඩමුළුව	02	දින 02			දේශීය	සාර්ථකව අවසන් කර ඇත
06	ශ්‍රී ලංකාවේ ඒකාබද්ධ තිරසර සංවර්ධන අරමුණු අධීක්ෂණය කිරීමේ වැඩමුළුව	03	දින 02			දේශීය	සාර්ථකව අවසන් කර ඇත
07	ජාතික බලශක්ති සමාගම් පිහිටුවීම සහ නියාමනය පිළිබඳ වැඩමුළුව	03	දින 03			දේශීය	සාර්ථකව අවසන් කර ඇත
08	විද්‍යුත් ප්‍රසම්පාදනය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන	05	දින 01			දේශීය	දැනුම ලබාගන්නා ලදි
09	වෙබ් අඩවි සකස් කිරීමේ ප්‍රමිතීන් සහ ක්‍රියාපටිපාටි පිළිබඳ දැනුවත් කිරීමේ සැසිය	01	දින 01			දේශීය	දැනුම ලබාගන්නා ලදි
10	ශ්‍රී ලංකාව තුළ ජාත්‍යන්තර න්‍යෂ්ටික ආරක්ෂණ ක්‍රම ක්‍රියාත්මක කිරීම පිළිබඳ ප්‍රජා සත්කාරක වැඩමුළුව	01	දින 03			දේශීය	සාර්ථකව අවසන් කර ඇත
11	"අවදානම් තක්සේරුව සහ සැලසුම් මූලික අවදානම්" පිළිබඳ ජාතික වැඩමුළුව	01	දින 04			දේශීය	සාර්ථකව අවසන් කර ඇත
12	න්‍යෂ්ටික බලශක්ති වැඩසටහන ක්‍රියාත්මක කරන සංවිධානයක කාර්යභාරයන් හා වගකීම් සහ එහි සාමාජික රටවල අත්දැකීම් සහ රටවල්වල න්‍යෂ්ටික යටිතල පහසුකම්වල ස්වරූප පිළිබඳ ජාත්‍යන්තර පරමාණුක බලශක්ති නියෝජිතායතනයෙහි (IAEA) ජාතික වැඩමුළුව	02	දින 04			දේශීය	සාර්ථකව අවසන් කර ඇත

අංකය	වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩ සටහනේ කාල සීමාව	සමස්ත ආයෝජනය (රු'000)		නිමැවුම/ ලබාගත් දැනුම*	අංකය
				දේශීය	විදේශීය		
13	ප්‍රසම්පාදනය සම්බන්ධ පුහුණු වැඩසටහන	40	දින 01			දේශීය	දැනුම ලබාගන්නා ලදි
14	නව න්‍යෂ්ටික වැඩසටහන් සඳහා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ IAEAහි විශේෂඥ මෙහෙයුම් ජාතික වැඩමුළුව	02	දින 05			දේශීය	සාර්ථකව අවසන් කර ඇත
15	රාජ්‍ය අංශයේ ගැටුම් වැළැක්වීමේ සහ බේරුම්කරණය සම්බන්ධ යාන්ත්‍රණය ශක්තිමත් කිරීම.	13	දින 02			දේශීය	සාර්ථකව අවසන් කර ඇත
16	ටෝස්ට්මාස්ටර්ස් ඉන්ටර්නැෂනල් කථන ශිල්ප පුහුණුව	01	සති 10	35,000.00		දේශීය	දැනුම ලබාගන්නා ලදි
17	බදුකරණ පාඨමාලාව (CTA Professional)	01	මාස 05	98,000.00		දේශීය	සාර්ථකව අවසන් කර ඇත
18	ඉහළ උෂ්ණත්ව වායු සිසිලන ප්‍රතික්‍රියාකාරක සහ අනෙකුත් අදාළ න්‍යෂ්ටික ක්‍රියාකාරකම් කෙරෙහි අවධානය යොමු කරමින්, කුඩා මොඩියුලර් ප්‍රතික්‍රියාකාරකවලට ආධාරක ලෙස යටිතල පහසුකම් සංවර්ධනය කිරීම පිළිබඳ අන්තර් කලාපීය වැඩමුළුව.	01	සති 02			විදේශීය	සාර්ථකව අවසන් කර ඇත
19	බලශක්ති සංක්‍රාන්තිය උදෙසා ඉහළ මට්ටමේ තාක්ෂණයන් යොදාගැනීම පිළිබඳ වැඩමුළුව	01	දින 08			විදේශීය	සාර්ථකව අවසන් කර ඇත
20	ශ්‍රී ලංකාවේ න්‍යෂ්ටික බලශක්ති වැඩසටහනට සහාය වීම සඳහා වූ ඒකාබද්ධ කාර්ය සැලැස්ම (IWP) සංවර්ධනය කිරීම සම්බන්ධයෙන් පැවති IAEA තාක්ෂණික සහයෝගිතා රැස්වීම	01	දින 06			විදේශීය	දැනුම ලබාගන්නා ලදි
21	3 වන ආසියා පැසිෆික් නියාමන සංසදය	01	දින 05			විදේශීය	සාර්ථකව සහභාගී වන ලදී
22	දේශසීමා අතර වූ සම්ප්‍රේෂණ මාර්ග ප්‍රශස්තකරණය පිළිබඳ වැඩමුළුව	01	දින 05			විදේශීය	සාර්ථකව අවසන් කර ඇත
23	හරිත ජාල වැඩපිළිවෙල (Green Grids Initiative)	01	දින 05			විදේශීය	දැනුම ලබාගන්නා ලදි
24	SABIT පිවිතුරු බලශක්ති වැඩසටහන	01	සති 01			විදේශීය	දැනුම ලබාගන්නා ලදි

අංකය	වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩ සටහනේ කාල සීමාව	සමස්ත ආයෝජනය (රු'000)		අංකය	අංකය
				දේශීය	විදේශීය		
25	ශ්‍රී ලංකාවේ නව න්‍යෂ්ටික පනත සකස් කර අවසන් කිරීම සඳහා වූ ද්විපාර්ශ්වික රැස්වීම	01	සති 01			විදේශීය	සාර්ථකව සහභාගී වන ලදී
26	ආසියානු පිවිතුරු බලශක්ති සංසදය	01	සති 01			විදේශීය	දැනුම ලබාගන්නා ලදි
27	08 වන චීන යුරේසියා ප්‍රදර්ශනය (China - Eurasia Expo)	01	සති 01			විදේශීය	සාර්ථකව සහභාගී වන ලදී
28	ආසියානු පිවිතුරු බලශක්ති සංසදය	01	සති 01			විදේශීය	සාර්ථකව සහභාගී වන ලදී
29	න්‍යෂ්ටික ද්‍රව්‍ය භෞතිකව ආරක්ෂා කිරීම පිළිබඳ සම්මුතිය සහ න්‍යෂ්ටික ත්‍රස්තවාදී ක්‍රියා මර්දනය කිරීමේ ජාත්‍යන්තර සම්මුතිය සඳහා සිදුකෙරෙන සංශෝධනය විශ්වීයකරණය කිරීම ප්‍රවර්ධනය කිරීම සඳහා වූ IAEA - UNODC සම්මන්ත්‍රණය.	01	සති 01			විදේශීය	සාර්ථකව සහභාගී වන ලදී
30	කුඩා මොඩියුලර් ප්‍රතික්‍රියාකාරක ආරක්ෂිතව හා සුරක්ශාකාරීව භාවිත කිරීම ඉහළ නැංවීම පිළිබඳ දකුණු, මධ්‍යම සහ නැගෙනහිර ආසියාතික පළමු කලාපීය සමුළුව	01	දින 05			විදේශීය	දැනුම ලබාගන්නා ලදි
31	BRI හවුල්කාර රටවල් සඳහා ඒකාබද්ධ වූ හරිත සංවර්ධනයක් ගොඩනැගීම ප්‍රවර්ධනය කිරීමේ සම්මන්ත්‍රණය	01	සති 02			විදේශීය	සාර්ථකව සහභාගී වන ලදී
32	චීනය සහ දකුණු ආසියානු රටවල් අතර පුනර්ජනනීය බලශක්ති විදුලිබල ක්ෂේත්‍රය ප්‍රමිතිකරණය කිරීමේ සහයෝගීතාව පිළිබඳ සම්මන්ත්‍රණය 2024 ජූලි 16 සිට 29 දක්වා චීනයේ දී පැවතිනි	02	සති 02			විදේශීය	සාර්ථකව සහභාගී වන ලදී
33	එක්සත් ජනපද බලශක්ති සම්පත් කාර්යාංශය වෙනුවෙන් ඉන්දියානු අධ්‍යයන චාරිකා සහ නිරීක්ෂණ චාරිකා (හරිත හයිඩ්‍රජන්) CIF	01	සති 01			විදේශීය	දැනුම ලබාගන්නා ලදි
34	ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරීන් සඳහා වූ විශේෂ කෙටිකාලීන පාඨමාලාව	01	සති 01			විදේශීය	දැනුම ලබාගන්නා ලදි

අංකය	වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩ සටහනේ කාල සීමාව	සමස්ත ආයෝජනය (රු'000)		අංකය	අංකය
				දේශීය	විදේශීය		
35	හරිත හයිඩ්‍රජන් ප්‍රතිපත්ති පුහුණු පාඨමාලාව	01	සති 01			විදේශීය	සාර්ථකව සහභාගී වන ලදී
36	ශ්‍රී ලංකා ජනරජයේ පුනර්ජනනීය බලශක්ති සංවර්ධනය සහ උපයෝජනය පිළිබඳ සම්මන්ත්‍රණය	02	සති 02			විදේශීය	දැනුම ලබාගන්නා ලදි
37	දකුණු ආසියානු පිවිතුරු බලශක්ති සංසදය	01	සති 01			විදේශීය	දැනුම ලබාගන්නා ලදි
38	කලාපීය සහයෝගීතාවය සහ ඒකාබද්ධතාවය පිවිතුරු බලශක්ති සංක්‍රාන්තිය සඳහා වැදගත් බනිජ ලවණ නඟාසිටුවීම පිළිබඳ සමුළුව	01	දින 02			විදේශීය	දැනුම ලබාගන්නා ලදි
39	සෝල් විවාද 2024 (Seoul Debates)	01	දින 05			විදේශීය	දැනුම ලබාගන්නා ලදි
40	දකුණු ආසියානු පිවිතුරු බලශක්ති සංසදය	01	සති 01			විදේශීය	සාර්ථකව සහභාගී වන ලදී
41	දකුණු ආසියානු උප කලාපීය ආර්ථික සහයෝගිතා (SASEC) වැඩසටහනේ ක්‍රියාකාරී කණ්ඩායම් රැස්වීම සහ 2024 ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ රැස්වීම	01	දින 06			විදේශීය	සාර්ථකව සහභාගී වන ලදී
42	වෘත්තීය ඉංග්‍රීසි ඩිප්ලෝමා පාඨමාලාව 2024	02		184,00.00		දේශීය	සාර්ථකයි
43	කාර්යාල කළමනාකරණය සහ ලිපිගොනු කළමනාකරණය පිළිබඳ වැඩමුළුව	20	දින 02	3,600.00		දේශීය	සාර්ථකයි

මූලාශ්‍රය: බලශක්ති අමාත්‍යාංශය

පුහුණු සහ සංවර්ධන වැඩසටහන් මගින් සේවකයින්ට දක්ෂතා ඉහළ නංවා ගැනීම, රැකියා තෘප්තිය වැඩි කිරීම, ඵලදායිතාව වැඩි දියුණු කිරීම සහ ඔවුන්ගේ කාර්යසාධන සමාලෝචනවල හඳුනාගත් අඩුපාඩු මගහරවා ගැනීම සඳහා උපකාරී වේ. එසේම, නියමිත කාල රාමුවක් තුළ රාජකාරී සහ කාර්යයන් ඉටු කරන ආකාරය පිළිබඳව පැහැදිලි දැක්මක් සහ අවබෝධයක් ලබා දේ. පුහුණුව සේවා ස්ථානයේ කාර්යසාධන කළමනාකරණය වැඩිදියුණු කිරීමට ද උපකාරී වේ.

07 වන පරිච්ඡේදය

අනුකූලතා වාර්තාව

07 වන පරිච්ඡේදය
අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ**			
1-1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ		
1-2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ		
1-3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම (වාණිජ අත්තිකාරම් ගිණුම්)	අනුකූල නොවේ	බලශක්ති අමාත්‍යාංශය තුළ මෙම ගිණුම් භාවිත නොකෙරේ	
1-4	ගබඩා අත්තිකාරම් ගිණුම්			
1-5	විශේෂ අත්තිකාරම් ගිණුම්			
1-6	වෙනත්			
2	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු-රෙ- 445)**			
2-1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2-2	පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2-3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2-4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2-5	සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙලකර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		

2-6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2-7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2-8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2-9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2-10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2-11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA-N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
03	**මූල්‍ය පාලනය සඳහා කාර්යන් අභිනියෝජනය කිරීම (මු-රෙ-135)**			
3-1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරාදී තිබීම	අනුකූල වේ		
3-2	මූල්‍ය බලතල පවරාදී තිබීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ		
3-3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරාදී තිබීම	අනුකූල වේ		
3-4	2014-05-11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේදී ගණකාධිකාරීවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ		
04	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4-1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4-2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		

4-3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4-4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
4-5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
05	**විගණන විමසුම්**			
5-1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම	අදාළ නොවේ		
06	**අභ්‍යන්තර විගණනය**			
6-1	මු-රෙ 134(2)DMA/1-2019 අනුව,වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස්කිරීම	අනුකූල වේ		
6-2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම	අනුකූල වේ		
6-3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
6-4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
07	**විගණන හා කළමනාකරණ කමිටු**			
7-1	DMA චක්‍රලේඛ 12019 අනුව, අවම වශයෙන් විගණන හා	අනුකූල වේ		

	කළමනාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වා තිබීම			
08	**වත්කම් කළමනාකරණය**			
8-1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණය චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිලදී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8-2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධීකරණ නිලධාරියෙකු පත් කර එම එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තාකර තිබීම	අනුකූල වේ		
8-3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8-4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම	අනුකූල වේ		
8-5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු-රෙ 772 අනුව සිදු කිරීම	අනුකූල වේ		
09	**වාහන කළමනාකරණය**			
9-1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස්කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
9-2	වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම	අනුකූල වේ		

9-3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
9-4	සැම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු-රෙ 103,104,109, හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ	104(03), 104(04). ප්‍රකාරව කටයුතු සිදු කරනු ලබයි.	
9-5	2016-12-29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3-1 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූල නොවේ	මූලික ඉන්ධන ධාරිතාව සීමා කිරීම හේතුවෙන් උද්ගතව ඇති ප්‍රායෝගික ගැටළු මත 2024 දී ඉන්ධන දහන පරික්ෂාව සිදු කර නොමැත. පෙර ලබාගත් දත්ත මත කටයුතු කර ඇත.	2025 සංචිත වාහන සඳහා හරිත පරීක්ෂණය සිදුකිරීමට අදාළව කටයුතු කිරීම සඳහා කමිටුවක් පිහිටුවා ඇත.
9-6	කල් බදු කාලසීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරාගෙන තිබීම	අනුකූල වේ		
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10-1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
10-2	සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රීය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අනුකූල වේ		
10-3	බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11-1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ		
11-2	මු-රෙ- 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය	අනුකූල වේ		

	කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එලඹීම			
12	**රජයේ නිළධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12-1	සීමාවන්ට අනුකූල වීම	අනුකූල වේ		
12-2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදුකර තිබීම	අනුකූල වේ		
12-3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අනුකූල නොවේ	අයකිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇත	
13	**පොදු තැන්පත් ගිණුම**			
13-1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු-රෙ- 571 ප්‍රකාරව කටයුතු කර තිබීම-	අනුකූල වේ		
13-2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
14	**අග්‍රිම ගිණුම**			
14-1	සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ		
14-2	මු-රෙ- 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන්වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
14-3	මු-රෙ- 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූල වේ		
14-4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ		
15	**ආදායම් ගිණුම්**	අනුකූල වේ		

15-1	අදාළ රෙගුලාසි වලට අනුකූලව, රැස්කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදුකොට තිබීම	අනුකූල වේ		
15-2	රැස්කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම	අනුකූල වේ		
15-3	මු-රෙ- 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
16	**මානව සම්පත් කළමනාකරණය**			
16-1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූල වේ		
16-2	කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරී ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම	අනුකූල වේ		
16-3	20-09-2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			
17-1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකුපත්කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
17-2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/චෝදනා පළකිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූල වේ		
17-3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්තිය ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		

18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18-1	අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනයකොට ක්‍රියාත්මක කර තිබීම	අනුකූල වේ		
18-2	එම චක්‍රලේඛයේ 2-3 ඡේදය පරිදි, පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම	අනුකූල වේ		
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19-1	2018-01-24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත්සැලැස්මක් සකස්කොට තිබීම	අනුකූල වේ		
19-2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම	අනුකූල වේ		
19-3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්යසාධන ගිවිසුම් අත්සන්කර තිබීම	අනුකූල වේ		

19-4	ඉහත චක්‍රලේඛයේ 6-5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨනිලධාරියෙකු පත් කොට තිබීම	අනුකූල වේ		
20	**විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම**			
20-1	ඉකුත් වර්ෂය සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදිකොට තිබීම	අනුකූල වේ		

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. ENR/E/ME/2024/FA/07

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2025 ජූනි 09 දින

ලේකම්,

බලශක්ති අමාත්‍යාංශය

ශීර්ෂය 119 - බලශක්ති අමාත්‍යාංශයේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 119 - බලශක්ති අමාත්‍යාංශයේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව බලශක්ති අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව යථාකාලයේදී නිකුත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, බලශක්ති අමාත්‍යාංශයේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2 **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 **කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම**

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුව බලශක්ති අමාත්‍යාංශයේ , මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව බලශක්ති අමාත්‍යාංශයේ , මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායීත්වය පිළිබඳව

කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම් ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 ආදායම්

(අ) ලිහිසිතෙල් කර්මාන්තය සඳහා 2023 අප්‍රේල් 25 දිනැති අමප/23/0632/621/031 අංක දරණ අමාත්‍ය මණ්ඩල තීරණය අනුව, වාර්ෂික ස්ථාවර ලියාපදිංචි ගාස්තුව වශයෙන් රු. 6,000,000 ක මුදලක්ද, ඊට අමතරව වාර්ෂික විකුණුම් පරිමාව පාදක කරගනිමින් එම වටිනාකමින් සියයට 0.9ක මුදලින්, වාර්ෂික ස්ථාවර ලියාපදිංචි ගාස්තුව අඩුකොට ඉතිරි මුදල විවල්‍ය ලියාපදිංචි ගාස්තුව ලෙස අයකළ යුතුය. අමාත්‍යාංශය, එක් එක් බලපත්‍රලාභියා සමඟ ඇතිකරගත් ගිවිසුම්වල 3.5 වගන්තිය ප්‍රකාරව බලපත්‍රලාභී ආයතන විසින් ආනයන සහ විකුණුම් වලට අදාල මාසික තොරතුරු අමාත්‍යාංශයේ ඉල්ලීම පරිදි මාසිකව, අර්ධ වාර්ෂික තොරතුරු අර්ධ වර්ෂය අවසන් වී දින 14ක් ඇතුළත සහ වාර්ෂික විගණනය කළ තොරතුරු මාස 06ක් ඉක්මවීමට පෙර අමාත්‍යාංශයට සහ මහජන උපයෝගීතා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතුය. 2024 වර්ෂය තුළ වාර්ෂික බලපත්‍ර ලබාගත් ආයතන 13ක් පමණක් ස්වතක්සේරුව මත විවල්‍ය ලියාපදිංචි ගාස්තු ගෙවා තිබුණි. අමාත්‍යාංශය විසින් ගිවිසුම් ප්‍රකාරව අදාල තොරතුරු බලපත්‍රලාභීන්ගෙන් ලබාගෙන පරීක්ෂා කර 2023 හා 2024 වර්ෂ සඳහා විවල්‍ය ලියාපදිංචි ගාස්තු නිවැරදිව ගණනය කර, අයකර ගැනීමට හෝ හිඟ විවල්‍ය ලියාපදිංචි ආදායම, හිඟ ආදායම් ප්‍රකාශයට හඳුනාගැනීමට කටයුතු කර නොතිබුණි. එම හේතුවෙන් හිඟ ආදායම නිවැරදිව සන්නිරීක්ෂණය කළ නොහැකි විය. මහජන උපයෝගීතා කොමිෂන් සභාව විසින් 2023 වර්ෂයට අදාලව ප්‍රසිද්ධ කරන ලද ලිහිසිතෙල් වෙළඳපොළ තොරතුරු පදනම් කරගනිමින් 2023 හා 2024 වර්ෂ සඳහා විගණනය විසින් ගණනය කරන ලද හිඟ ලිහිසි තෙල් විවල්‍ය ලියාපදිංචි ගාස්තු රු. මිලියන 231 ක් විය.

1.6.2 මූල්‍ය නොවන වත්කම්

අමාත්‍යාංශයට සියයට 60ක හිමිකාරිත්වයක් සහිත සීමා සහිත පොලිප්ටෝ සමාගම ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා 2018 සැප්තැම්බර් 26 දින මෙහෙයුම් හා නඩත්තු කටයුතු ගිවිසුමක් අත්සන් කර තිබුණි. එම ගිවිසුම අනුව නිමවුම්කරු විසින් අමාත්‍යාංශයට වසර 10කින් බෙරුම් කළ යුතු ප්‍රතිඵලාව වූ රු. 82,019,500ක වටිනාකම මේ දක්වා මූල්‍ය ප්‍රකාශන තුළ හෙළිදරව් කර නොතිබුණි. අමාත්‍යාංශයට ලැබිය යුතු ප්‍රතිඵලාව ගණනය කිරීමේදී රු. මිලියන 1.25කට තක්සේරු කරන ලද මෝටර් වාහනය ඇතුළත් කර නොතිබුණි.

02. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට

(ආ) ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 ආදායම් කළමනාකරණය

(අ) ගුවන් යානා ඉන්ධන ආනයන, අපනයනය, විකිණීම සහ බෙදාහැරීම සඳහා 2024 වර්ෂයට අදාළව ආයතන දෙකක් විසින් බලපත්‍ර 03ක් අලුත්කර තිබුණි. ඒ අනුව 2024 වර්ෂය සඳහා ඇ.ඩො. 30,000 ක් ලෙස ඇස්තමේන්තු කළ යුතු ආදායම ඇ.ඩො. 20,000 ක් ලෙස ඇස්තමේන්තු කර තිබුණි.

(ආ) 2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල හිඟ ආදායම් පිළිබඳ ප්‍රකාශය (ඒසීඒ 1(i))ට අනුව හිඟ ආදායම් ලෙස හඳුනාගත් ලංකා ඛණිජතෙල් සංස්ථාව වෙතින් 2022 සහ 2023 වර්ෂයන්ට අදාලව අයවිය යුතු කාර වෙළඳාම සඳහා වාර්ෂික ලියාපදිංචි ගාස්තු රු. 4,400,000ක් සහ 2024 වර්ෂයට අදාලව පෞද්ගලික සමාගමකින් අයවිය යුතු ලිහිසි තෙල් බලපත්‍ර ගාස්තු රු. 2,989,020ක් අයකරගෙන නොතිබුණි.

3.2 වියදම් කළමනාකරණය

(අ) ව්‍යාපෘති ක්‍රියාත්මක නොකිරීම හේතුවෙන් ප්‍රාග්ධන වැය විෂයයන් 05ක් සඳහා වෙන් කළ රු. මිලියන 3,406ක් වූ මුළු ශුද්ධ ප්‍රතිපාදනයම උපයෝජනය කිරීමකින් තොරව ඉතිරිවී තිබුණි.

(ආ) අංක 119-2-3-36-13-2202 දරණ වැය විෂය යටතේ සංවර්ධන සහයන් සඳහා වාර්ෂික අයවැය ඇස්තමේන්තුවෙන් ප්‍රතිපාදන සලසා නොතිබූ අතර පරිපූරක ඇස්තමේන්තුවක් මඟින් රු. 300,000,000ක ප්‍රතිපාදන වෙන්කර තිබුණි. එම ප්‍රතිපාදිත මුදලින් රු. 59,697,576ක් වියදම් කර තිබූ අතර රු. 240,302,424 ක් එනම් සියයට 80ක් ඉතිරිවී තිබුණි.

3.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නීතිරීති, රෙගුලාසිවලට යොමුව	විස්තරය
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය ----------	
(අ) මුදල් රෙගුලාසි 104(3)	මුදල් රෙගුලාසි 104(3) අනුව වාහන අනතුරු සම්බන්ධව ප්‍රාරම්භක වාර්තාව දින 07ක් ඇතුළත ඉදිරිපත් කළ යුතු වුවද, 2021- 2023 කාලපරිච්ඡේදය තුළ සිදු වූ අනතුරු 05ක ප්‍රාරම්භක වාර්තා දින 22 සිට දින 663ක කාලයක් ප්‍රමාද වී නිකුත් කර තිබූ අතර 2023 වර්ෂයේ එක් අනතුරක සහ 2024 වර්ෂයේ අනතුරු 05 ක ප්‍රාරම්භක වාර්තා විගණිත දින වන විටත් නිකුත් කර නොතිබුණි.
(ආ) මුදල් රෙගුලාසි 104(4)	මුදල් රෙගුලාසි 104(4) අනුව වාහන අනතුරු සම්බන්ධව අවසන් වාර්තාව මාස 03ක් ඇතුළත ඉදිරිපත් කළ යුතු වුවද, 2021 වර්ෂයට අදාල අනතුරු 02ක්, 2022 වර්ෂයට අදාල අනතුරු 01ක් සහ 2023 වර්ෂයට අදාල අනතුරු 04ක අවසන් වාර්තා විගණිත දින දක්වා නිකුත් කර නොතිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

4.1.1 අපේක්ෂිත නිමවුම් මට්ටම් ලබා නොගැනීම

මන්නාරම් ද්‍රෝණියේ ඛණිජතෙල් ගවේෂණ කටයුතු

මන්නාරම් ද්‍රෝණියේ එම් - 2(M-2) ගවේෂණ බිම් කොටසේ (SL 2007-01-001) ඛනිජතෙල් ගවේෂණ කටයුතු සඳහා පෞද්ගලික සමාගමක් 2007 වර්ෂයේදී තෝරාගෙන තිබූ අතර 2011 වර්ෂයේදී එම සමාගම විසින් ස්වාභාවික වායු නිධි දෙකක් සොයාගෙන තිබුණි. 2016

සැප්තැම්බර් මස 06 දිනැති අංක 16/1745/746/021 දරණ අමාත්‍ය මණ්ඩල අනුමැතිය අනුව මන්නාරම ද්‍රෝණියේ එම් - 2(M-2) ගවේෂණ බිම් කොටසෙන් සොයාගත් ස්වාභාවික වායු නිධි සංවර්ධනය හා නිෂ්පාදන කටයුතු සඳහා සුදුසු ආයෝජකයෙකු අන්තර්ජාතික තරඟකාරී යෝජනා කැඳවීමේ ක්‍රියාවලියක් මඟින් තෝරා ගැනීමට අවශ්‍ය තාක්ෂණික හා අලෙවිකරණ උපදේශණ සහය ලබාගැනීම සඳහා විදේශීය සමාගමක් 2016 දෙසැම්බර් 14 වන දින පත් කරගෙන තිබුණි. උපදේශන සහය ලබා ගැනීමේ ගිවිසුම 2017 දෙසැම්බර් 13 දින අවසන්ව තිබූ අතර එම කාර්ය සඳහා අමාත්‍යාංශය විසින් ඇ.ඩො. 300,000 ක් එනම් එවකට පැවති විනිමය අනුපාත අනුව රු. 46,610,853ක වියදමක් දරා තිබුණි. ශ්‍රී ලංකාවේ ඛනිජතෙල් සම්පත් ගවේෂණය, සංවර්ධනය, උකහා ගැනීම සහ කළමණාකරණය යන කාර්යයන් නියාමනය කිරීමේ පරමාර්ථ ඇතිව 2021 අංක 21 දරණ ඛනිජතෙල් සම්පත් පනතේ විධිවිධාන යටතේ 2021 ඔක්තෝබර් 08 වන දින ශ්‍රී ලංකා ඛනිජතෙල් සංවර්ධන අධිකාරිය ස්ථාපිත කර තිබූ අතර එමඟින් ඒකාබද්ධ අධ්‍යයන ගිවිසුම් හා ඛනිජතෙල් සම්පත් සේවා සපයන්නන්ගේ බලපත්‍ර වලට අදාල රෙගුලාසි හා ශ්‍රී ලංකා ඛනිජතෙල් සම්පත් ගවේෂණ සහ සංවර්ධන බිම් කොටස් සිතියම ප්‍රකාශයට පත් කර තිබුණද, අදාල අධ්‍යයනයන් සඳහා සුදුසු ආයෝජකයෙකු සොයාගැනීමට විගණිත දින දක්වා නොහැකි වී තිබුණි.

4.1.2 කළමණාකරණ දුර්වලතා

(අ) සීමාසහිත පොලිප්ටෝ ලංකා පුද්ගලික සමාගම

ඉවතලන ප්ලාස්ටික්/පොලිතීන් මඟින් ඉන්ධන නිපදවීම සඳහා 2009 වර්ෂයේ අමාත්‍යාංශයට සියයට 60ක කොටස් අයිතියක් සහිතව සීමාසහිත පොලිප්ටෝ ලංකා පුද්ගලික සමාගම ආරම්භකර තිබුණි. 2018 වර්ෂයේ සමාගම ප්‍රතිව්‍යුහගත කර අමාත්‍යාංශය හා නිමවුම්කරු අතර 2018 සැප්තැම්බර් 26 දින මෙහෙයුම් හා නඩත්තු ගිවිසුමක් අත්සන් කර තිබුණි. එම ගිවිසුමේ 09 වන වගන්තිය අනුව, ප්‍රතිව්‍යුහගත කරන අවස්ථාවේ දී සමාගමේ ස්ථාවර වත්කම්වල තක්සේරු වටිනාකම වූ රු. 82,019,500 කට තක්සේරුකර තිබුණි. ගිවිසුමේ 12 වන වගන්තිය ප්‍රකාරව, තක්සේරු මුදල වූ රු. 82,019,500ක සම්පූර්ණ මුදල හා ඊට අදාල පොලියද සමඟ අමාත්‍යාංශය වෙත ගෙවා අවසන් වනතුරු සමාගමේ කොටස් අයිතියෙන් සියයට 1ක් අමාත්‍යාංශය සතුවිය යුතු බව දක්වා තිබුණද, ඊට පටහැනිව 2018 ඔක්තෝබර් 03 දින අමාත්‍යාංශය සතු සමාගමේ සියළුම කොටස් නිමවුම්කරු වෙත පවරා තිබුණි. සමාගම ආරම්භයේ සිට ප්‍රතිව්‍යුහගත කරන ලද අවස්ථාව දක්වා වූ කාල පරිච්ඡේදය තුළ රජය විසින් මූලික ප්‍රාග්ධනයද ඇතුළුව, රු. මිලියන 300කට අධික වියදමක් මෙම සමාගම සඳහා දරා තිබුණි. ජාතික වශයෙන් ඉතා වැදගත් අරමුණු රැසක් ඉටුකර ගැනීම පෙරදැරි කරගනිමින් නියමු ව්‍යාපෘතියක් ලෙස ස්ථාපිත කරන ලද මෙම සමාගමේ මෙහෙයුම් අර්ධ වාණිජ ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාත්මක කිරීමේදී, නිසි පිරිවැය ප්‍රතිලාභ විශ්ලේෂණයක් සිදුනොකිරීම,

නිෂ්පාදන වෙළඳපොළ අවස්ථා හඳුනා නොගැනීම, ඇතුළුව මෙහෙයුම් සැලසුම්කරණය හා කළමණාකරණයේ දුර්වලතා හේතුවෙන් අපේක්ෂිත අරමුණු ළඟාකර ගැනීමට හෝ රජය යෙදවූ මුදලට කිසිදු ප්‍රතිලාභයක් ලබා ගැනීමට නොහැකිවී තිබුණි.

(ආ) 2024 වර්ෂයේ සැලසුම්කර ඇති ඇස්තමේන්තුගත පිරිවැය ඇ.ඩො. 11,900,000 වන කොරියානු රජයේ ආධාර යටතේ ඉදිකිරීමට නියමිත හම්බන්තොට බැටරි බලශක්ති ගබඩා පද්ධතිය ව්‍යාපෘතිය සඳහා 2024 වර්ෂයේදී රු. 3,239,000,000ක භාණ්ඩාගාර ප්‍රතිපාදන වෙන්කර තිබුණද, අදාල ව්‍යාපෘතිය ආරම්භ කර නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකාවේ ජාතික බලශක්ති ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම

I. ජාතික මෙහෙයුම් කමිටුවක් මඟින් බලශක්ති ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කළ යුතු අතර අදාළ කමිටුව කාර්තුමය පරාසයන් තුළ රැස්වී ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය අමාත්‍ය මණ්ඩලයට වාර්තා කිරීම කළ යුතු වුවද 2024 වර්ෂය තුළ ජාතික මෙහෙයුම් කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි.

II. බලශක්ති ප්‍රතිපත්ති ප්‍රකාශයෙහි 04 වන ඡේදය ප්‍රකාරව, කාර්යසාධන කාලරාමුව සෑම වසර දෙකකට වරක්ම එම වගකීම පවරා ඇති ආයතන විසින් සංශෝධනය කිරීමට ක්‍රියාමාර්ග ගත යුතුය. නමුත් 2019 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා වසර 05ක් ගතව ඇතත් අදාළ කාර්යසාධන කාලරාමුව අවශ්‍ය පරිදි සංශෝධනය කිරීමට එකී ආයතන විසින් කටයුතු කර නොතිබුණු අතර අමාත්‍යාංශය විසින් එම කටයුතු අධීක්ෂණය කර නොතිබුණි.

III. බලශක්ති ප්‍රතිපත්තියේ කාර්යසාධන කාලරාමුව තුළ බලශක්ති සුරක්ෂිතතාවය සහතික කිරීම යටතේ 4.1.d ඡේදය අනුව බලශක්ති ක්ෂේත්‍රයේ කාර්යසාධනය කෙරෙහි තීරණාත්මක බලපෑම් එල්ල කළ හැකි අභ්‍යන්තර හා බාහිර අවිනිශ්චිතතාවයන් පිළිබඳ අවධානම් ඇගයීමේ මණ්ඩලය 2019 වර්ෂය අවසන් වන විට පිහිටු වීමට නියමිතව තිබුණද, 2024 වර්ෂය අවසන් වන විටත් එය ස්ථාපිත කර ඇති බවට විගණනයට තොරතුරු ඉදිරිපත් කර නොතිබුණි.

IV. කාර්යසාධන කාලරාමුවේ බලශක්ති ක්ෂේත්‍රයේ යහපාලනය ශක්තිමත් කිරීම යටතේ 4.8.g ඡේදය තරඟකාරී පදනම මත ආයෝජකයන්ට සහ සංවර්ධන හවුල්කරුවන්ට පහසුවෙන් සහභාගීවීම සඳහා බලශක්ති ක්ෂේත්‍රයේ සියළු ව්‍යාපෘති සහ ආයෝජන අවස්ථාවන් හඳුනාගෙන යම් සුදුසු ව්‍යාපෘති සංකල්ප ආකෘතියක ලේඛණ ගතකර එක් එක් ආයතන විසින් 2020 වර්ෂයේ සිට ප්‍රකාශයට පත් කළ යුතුය. සුනිත්‍ය බලශක්ති අධිකාරිය පමණක් රටේ පවතින සියළු පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන් පවතින ස්ථාන

ගැසට් පත්‍රයක් මඟින් ප්‍රසිද්ධකොට තිබුණි. නමුත් ඉහත ඡේදය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් එම කටයුතු අධීක්ෂණය කළ බවට විගණනයට තොරතුරු ඉදිරිපත් නොකරන ලදී.

V. කාර්යසාධන කාලරාමුවේ 4.9.e ඡේදය අනුව පොදු සේවා සම්ප්‍රේෂණ හා බෙදාහැරීම් මාර්ග පිළිබඳ ගැටළු විසඳීම සඳහා අන්තර් ආයතන සම්බන්ධීකරන අධිකාරිය 2020 වසර වන විට පිහිටුවීමට නියමිතව තිබුණද, 2024 වර්ෂය අවසානය වන විටත් එය ක්‍රියාත්මක කර ඇති බවට විගණනයට තොරතුරු ඉදිරිපත් නොවුණි.

VI. කාර්යසාධන කාලරාමුවේ, බලශක්ති කාර්යක්ෂමතාවය සහ සංරක්ෂණය වැඩිදියුණු කිරීම යටතේ, පොදු ස්ථාන ආලෝකකරණය ද ඇතුළුව ග්‍රාමීය, නාගරික සහ ප්‍රධාන මාර්ග ආලෝකකරණය සඳහා ආලෝකකරණ ප්‍රමිත 2020 වර්ෂය තුළ අමාත්‍යාංශය විසින් හඳුන්වාදී අනිවාර්ය පදනමින් ක්‍රියාවට නැංවීමට නියමිතව තිබුණද, අදාල ප්‍රමිත මේ දක්වා ප්‍රකාශයට පත්කර ඇති බවට විගණනයට තොරතුරු ඉදිරිපත් නොකරන ලදී.

VII. බලශක්ති ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ උපායමාර්ගයන්හි පුනර්ජනනීය බලශක්තියේ දායකත්වය ඉහළ නැංවීම සඳහා 3.7.5 ඡේදය අනුව සුළං සහ සූර්ය බලශක්තිය වැනි විවිධ පුනර්ජනනීය බලශක්ති මූලාශ්‍රයන්ගෙන් ජනනය කරන විදුලිය විදුලිබල පද්ධතියට අවශෝෂණය කිරීමේදී ඇතිවන තාක්ෂණික ගැටළු විසඳා ගැනීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳ අධ්‍යනයන් සිදුකර නොතිබුණි.

4.2. විදේශ ආධාර ව්‍යාපෘති

විදේශාධාර ව්‍යාපෘති යටතේ රු. මිලියන 47,658ක් වටිනා සංවර්ධන ව්‍යාපෘති 15ක් ක්‍රියාත්මක වන අතර ඉන් ව්‍යාපෘති 07ක ප්‍රවර්ථන වර්ෂයට අදාල මූල්‍ය ප්‍රගතිය හා භෞතික ප්‍රගතිය සියයට 51කට වඩා අඩු මට්ටමක පවතින බව ව්‍යාපෘති ප්‍රගති වාර්තා අනුව නිරීක්ෂණය විය.

4.3 පාඩු හා හානි

අමාත්‍යාංශය විසින් 2024.12.31 දිනට වාහන අනතුරු 09ක් සම්බන්ධයෙන් මු.රෙ. 104(4) ප්‍රකාරව රු. 3,926,540ක අලාභ හානි අයකරගෙන නොතිබුණි.

එන්.එච්.ඒ.ආර්.කේ. ගුණරත්න
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට